2022 අගෝස්තු • 245 කලාපය

# රණවිරුවා

## අභිමානවත් සෙවණට ගෞරවණීය සම්ප්‍රාප්තිය...



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.



# ජනාධිපති තුමන්ගේ යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රථම නිල සංචාරය

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ආරාධනයකට අනුව ශ්‍රී ලංකාවේ 8 වන විධායක ජනාධිපති ලෙස පසුගිය දා රාජකාරී භාරගත් සන්නද්ධ හමුදා සේනාධිනායක රනිල් වික්‍රමසිංහ මැතිතුමන් ඉකුත් අගෝස්තු 09 වන දින ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේ සිය ප්‍රථම නිල සංචාරයේ නිරත විය. එහිදී, ගරු ජනාධිපතිතුමන් වෙත හිමිවූයේ අභිමානවත් පිළිගැනීමකි.

මෙම අවස්ථාවට ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්, ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මැතිතුමන්, ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමන්, ජනාධිපති කාර්යමණ්ඩල ප්‍රධානි සහ ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක සාගල රත්නායක මැතිතුමන් ද සහභාගී වූහ. යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රථම නිල සංචාරයේ නිරත ගරු ජනාධිපතිතුමන් පිළිගැනීමේ අවස්ථාවට ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික), ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක්ද එක්වූහ.









මෙම සංචාරයේදී ගරු ජනාධිපතිතුමන් පාර්ලිමේන්තු සංකීර්ණය අසල මීට සති කිහිපයකට ප්‍රථම විරෝධතාකරුවන් පිරිසක් සිදුකළ කලහකාරී තත්ත්වය පාලනය කිරීමට කටයුතු කිරීමේදී තුවාල ලැබූ හටපිරිස් සමඟින් ද සුහදව අදහස් හුවමාරු කරගත්තේය. ඉන් අනතුරුව, ජනාධිපතිතුමන් පසුගිය දා ඇති වූ කලහකාරී තත්ත්වය හමුවේ හටපිරිස් කටයුතු කළ ආකාරය ඇගයීමට ද ලක්කළේය. අනතුරුව, ජනාධිපතිතුමන්ගේ සුරතින් එම හටපිරිස් වෙත සහතිකපත් ද ප්‍රදානය කෙරිණ.

# යුද්ධ හමුදාධිපති ජනාධිපති හමුවෙයි



යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් අගෝස්තු 19 වන දින ජනාධිපති මන්දිරයේදී සන්නද්ධ හමුදා සේනාධිනායක ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමන් හමුවිය.

මෙම හමුවේදී මෙරට 8 වැනි විධායක ජනාධිපතිතුමන් වෙත සිය සුභාසිංසන පළකළ යුද්ධ හමුදාධිපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව දිවයිනේ ආරක්ෂාව තහවුරු කිරීමට සහ ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘතීන් සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ උපරිම සහයෝගය නිරන්තරයෙන් ලබාදෙන බව සඳහන් කළේය.




# "විකුම්පුර" ගම්මානයේ සොඳුරු මතක මැද ගම්වැසියන් හමුවී

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) යටතේ ස්ථාපිත 542 වන බලසේනාවේ බලසේනාධිපති ලෙස රාජකාරී කළ කාලසීමාවේ එම බලප්‍රදේශය තුළ එතුමන්ගේ උපදෙස් මත දියත් කළ ව්‍යාපෘතීන් සියැසින් දැකගැනීමේ අරමුණින් ඉකුත් අගෝස්තු 20 වන දින එහි සංචාරයක නිරත විය. විශේෂයෙන්ම එහිදී, එවක එතුමන්ගේ සංකල්පයක් මත ස්ථාපිත කළ "විකුම්පුර" ගම්මානයේ වැසියන් හමුවී ඔවුන් සමඟ සුහදව අදහස් හුවමාරු කරගනිමින් එදවස මතක ආවර්ජනය කරන්නටද හෙතෙම අමතක නොකළේය.

වත්මන් යුද්ධ හමුදාධිපති, එවකට උතුරු පළාත් ආණ්ඩුකාරවරයා, රාජ්‍ය ආයතන සහ වන්නි - ආරක්ෂක සේනා ආඥාපතිගේ සහයෝගය ඇතිව නිවාස 70 කින් සමන්විත මෙම "විකුම්පුර" ආදර්ශ ගම්මානය ආරම්භ කර 2009 මැයි මාසයට පෙර උතුරු සහ නැගෙනහිර පළාත් දෙකෙහිම එල්ටීටීඊ ත්‍රස්තවාදය හේතුවෙන් අවතැන් වූ පවුල් එහි පදිංචි කරවන ලදී. ගම්මානයේ එක් නිවසක් පර්චස් 20-40 ක පමණ භූමි ප්‍රමාණයකින් සමන්විත වේ.

"විකුම්පුර" ආදර්ශ ගම්මානයේ පදිංචි පවුල් 43ක සාමාජිකයන් හමුවූ යුද්ධ හමුදාධිපති ඔවුන් සමඟ සුහදව අදහස් හුවමාරු කර ගනිමින් ඔවුන්ගේ සුවදුක් විමසා බලමින් ගම්මානය නිරීක්ෂණය කළේය. පසුව විකුම්පුර ගම්වාසීන්ට සහල්, පරිප්පු, කරවල, ධාන්‍ය වර්ග, කුළුබඩු, කිරිපිටි ආදියෙන් සමන්විත අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පාර්සල් 43ක්ද ප්‍රදානය කරන ලදී. එහිදී, ගම්වාසීහු යුද්ධ හමුදාපති ගේ පැමිණීම සම්බන්ධයෙන් ප්‍රශංසා කරමින් එම ගම්මානය නිර්මාණය කිරීම සඳහා ලබාදුන් නායකත්වය කෘතවේදීව සිහිපත් කළහ.





# යුද්ධ හමුදාධිපතිට ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවෙන් ගෞරවාචාර



යුද්ධ හමුදාධිපති සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ යුද්ධ හමුදාධිපති ධුරයට පත්වීමෙන් පසු පසුගිය අගෝස්තු මස 31 කුරුණෑගල පිහිටි ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළු රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සංචාරයක නිරත විය.



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් එච්ජී කීර්තිනාථ ආර්එස්පී කේඑස්පී පීඑස්සී විසින් එහිදී, යුද්ධ හමුදාධිපති උණුසුම් ලෙස පිළිගනු ලැබීමෙන් අනතුරුව එතුමන් වෙත රෙජිමේන්තු භටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල බුහුමන් පුදනු ලැබූහ.




එහිදී, යුද්ධ හමුදාධිපති විසින් භටපිරිස් අමතන්නටද කටයුතු කළ අතර, අනතුරුව පැවති සියලු නිල තේ පැන් සංග්‍රහය අතරතුරේදී පොදුරාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙලේදී කවපෙන්න විසිකිරීමේ ක්‍රීඩා ඉසව්වෙන් පදක්කමක් හිමිකර ගත් සැරයන් පාලිත බණ්ඩාරගේ ක්‍රීඩා දක්ෂතා අගයමින් ඔහුගේ ඉදිරි ක්‍රීඩා කටයුතු වැඩි දියුණු කරගැනීම සඳහා මූල්‍ය දිරි දීමනාවක් ප්‍රදානය කරන ලදී.



එහිදී, යුද්ධ හමුදාධිපති විසින් සියලු පහසුකම්වලින් සමන්විත රෙජිමේන්තු මධ්‍යස්ථාන කාර්යාල පරිශ්‍රයේ නවතමයෙන් ඉදිකරන ලද රෙජිමේන්තු අධිපති නිල කාර්යාලය විවෘත කිරීමද සිදුකරන ලදී. මෙම සංචාරය සනිටුහන් කරමින් යුද්ධ හමුදාධිපති විසින් රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේ පැළයක්ද රෝපණය කරන ලද අතර, එම අවස්ථාව සඳහා නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක, රෙජිමේන්තු මන්ත්‍රණ සභාවේ සාමාජිකයින් සහ සෙසු නිලයින් පිරිසක් සහභාගී වූහ.

# උතුරු පළාත් ආණ්ඩුකාරතුමන් සහ යුද්ධ හමුදාධිපති අතර හමුවක්



උතුරු පළාත් ආණ්ඩුකාර ජීවන් ත්‍යාගරාජා මහතා සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ අතර හමුවක් පසුගිය අගෝස්තු 05 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. එහිදී, උතුරු පළාතේ සංවර්ධන කටයුතු වෙනුවෙන් යුද්ධ හමුදාවේ දායකත්වය සහ ඊට අදාළ කරුණු පිළිබඳ සාකච්ඡා කෙරිණි.

මෙම සුහද හමුව අතරතුර, උතුරු පළාතේ සිවිල් වැසියන් සහ ආරක්ෂක අංශ අතර පවතින සහයෝගීතාවය සහ ප්‍රජා මූලික ව්‍යාපෘති තවදුරටත් වැඩිදියුණු කිරීමට මෙන්ම වර්තමානයේ ආර්ථික දුෂ්කරතා හමුවේ දිවිගෙවන සිවිල් වැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම ආදී කරුණු සම්බන්ධයෙන් සුහදව අදහස් හුවමාරු කරගනු ලැබීය.

# නිල හමුවීම්වල මතක සටහන්



කොළඹ පිහිටි බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක ධූරයේ රාජකාරි හොබවන බ්‍රිතාන්‍ය යුද්ධ හමුදාවේ කර්නල් පෝල් ක්ලේටන් එම්බීඊ (Colonel Paul Clayton MBE) පසුගිය අගෝස්තු 03 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය.

එහිදී, දෙරටෙහි සන්නද්ධ හමුදාවන් අතර පවතින සුහදත්වය, සහයෝගීතාවය හා අවබෝධය පිළිබඳ සිහිපත් කෙරිණ. එමෙන්ම, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා බ්‍රිතාන්‍ය සන්නද්ධ හමුදාවන් වෙතින් ලබාදෙනු ලබන පුහුණු වැඩසටහන් තවදුරටත් වැඩිදියුණු කිරීමට ඇති හැකියාව මෙන්ම අනෙකුත් හුවමාරු වැඩසටහන් ඇතුළු ද්විපාර්ශ්වික වශයෙන් වැදගත් වන කරුණු කිහිපයක් පිළිබඳව ද මෙහිදී සාකච්ඡාවට බඳුන්විය.



ශ්‍රී ලංකාවේ පිහිටි ජපාන තානාපති කාර්යාලයේ නව ආරක්ෂක උපදේශක කපිතාන් යුකි යොකොහාරි මහතා (Captain Yuuki Yokohari) පසුගිය අගෝස්තු 19 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවී සුහද සාකච්ඡාවක නිරතවිය.

මෙම හමුවේදී දෙරට අතර පවතින අන්තර්කාලීන සබඳතා, ත්‍රිවිධ හමුදාවන් අතර පවතින සුහදතාවය මෙන්ම සහයෝගීතාවය සහ අවබෝධය යන කරුණු පිළිබඳ සාකච්ඡා කළේය. තවද, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා ක්‍රියාත්මක කර ඇති පුහුණු වැඩසටහන් තවදුරටත් වැඩිදියුණු කිරීමේ හැකියාව මෙන්ම දෙරටේ සන්නද්ධ හමුදාව විවිධ හුවමාරු සහ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීම පිළිබඳව තවදුරටත් සාකච්ඡාවට බඳුන් විය. මෙම හමුව අවසානයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සුහදත්වය සංකේතවත් කරමින් යුද්ධ හමුදාධිපති විසින් ජපාන තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක වෙත සමරු තිළිණයක් ද ප්‍රදානය කරන ලදී.

# යුද්ධ හමුදාධිපතිට ජාතික ක්‍රීඩා කවුන්සිලයේ සාමාජිකත්වය



ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ හිටපු ප්‍රවීණ නායකයකු වන අර්ජුන රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ජාතික ක්‍රීඩා කවුන්සලය සඳහා රජය වෙතින් නව සාමාජිකයන් පත් කිරීමේදී එහි නව සාමාජිකයකු ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පත් කර ඇත.

ටොරින්ටන් ක්‍රීඩාංගණ චතුරශ්‍රයේ පිහිටි ජාතික ක්‍රීඩා කවුන්සිල කාර්යාලය වෙත පසුගිය අගෝස්තු 10 වන දින නව සාමාජිකයින් කැඳවීමෙන් අනතුරුව යුද්ධ හමුදාධිපති වෙත මෙම පත්වීම් ලිපිය ප්‍රදානය කරන ලදී. ක්‍රීඩා ක්ෂේත්‍රයේ පවතින ප්‍රතිපත්තිමය ගැටලු සම්බන්ධයෙන් ක්‍රීඩා ඇමැතිවරයා වෙත උපදෙස් දීම සඳහා මෙම ජාතික ක්‍රීඩා සභාව පත් කරන ලදී

# අභිමන් ගමනකට උණුසුම් සුභ පැතුම්



මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 8 දෙනකු වෙත නිල ලාංඡන පැළඳවීම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් පසුගියදා සිදුකෙරිණ.

23 වන සේනාංකයේ සේනාංකාධිපති ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ මේජර් ජෙනරාල් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යාලයේ පාඨමාලාවක නිරත ශ්‍රී ලංකා පාබල හමුදාවේ මේජර් ජෙනරාල් ජීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, 58 වන සේනාංකයේ සේනාංකාධිපති විශේෂ බලකායේ මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීඩබ්ලිව්ජී ඉහලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායේ මේජර් ජෙනරාල් ජීකේඅයි විතානාච්චි, මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ මේජර් ජෙනරාල් එච්ජීපීඑම් කාරියවසම් ආර්එස්පී එන්ඩීසී පීඑස්සී අයිජී, 57 වන සේනාංකයේ සේනාංකාධිපති විශේෂ බලකායේ මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී, 21 වන සේනාංකයේ සේනාංකාධිපති විශේෂ බලකායේ මේජර් ජෙනරාල් එච්ඩීඩබ්ලිව්කේඑන් ඊරියගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යාලයේ පාඨමාලාවක නිරත ගැමුණු හේවා බලකායේ මේජර් ජෙනරාල් එස්ඩබ්ලිව්බී වෙලගෙදර ආර්එස්පී යූඑස්පී එලෙස උසස්වීම් ලැබූ නිලධාරීහු වූහ. ජනාධිපති ආරක්ෂක අංශයට අනුයුක්ත සේවය කරන විශේෂ බලකායේ මේජර් ජෙනරාල් ආර්එම්එම් රණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී හට රාජකාරී හේතුන් මත මෙම අවස්ථාවට සහභාගී වීමට නොහැකි විය.




# යුද්ධ හමුදා පැරා මළල ක්‍රීඩා සහ ආධුනික ක්‍රීඩා උළෙල



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා ක්‍රීඩා උළෙල, 23 වන අන්තර් රෙජිමේන්තු යුද්ධ හමුදා පැරා මලල ක්‍රීඩා ශූරතාවලිය සහ අන්තර් රෙජිමේන්තු ආධුනික ක්‍රීඩා උළෙල - 2022 ත්‍රෛපාර්ශ්වික ඒකාබද්ධ ක්‍රීඩා උළෙලෙහි අවසන් මහා තරග සහ ත්‍යාග ප්‍රදානය කිරීමේ උත්සවය පසුගිය අගෝස්තු 04 වන දින දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

කොවිඩ් - 19 වසංගත තත්ත්වය සහ වෙනත් ප්‍රායෝගික හේතූන් මත වසර කිහිපයක් පුරාවට පැවැත්වීමට නොහැකි වූ මෙම ඒකාබද්ධ ක්‍රීඩා උළෙල යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 20 කට අධික ප්‍රමාණයක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්, රණකම්නයට පත් රණවිරුවන් ඇතුළු සිය ගණනකගේ සහභාගීත්වයෙන් පවත්වනු ලැබූහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක සහ ශ්‍රී ලංකා මලල ක්‍රීඩා කමිටුවේ, යුද්ධ හමුදා පැරා මලල ක්‍රීඩා කමිටුවේ මෙන්ම ස්කයි ඩයිවින් කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ අධීක්ෂණය යටතේ මෙම තරගාවලිය පැවැත්විණි.



ක්‍රීඩක ක්‍රීඩිකාවන් 775 දෙනකුගේ සහභාගීත්වයෙන් මීට සති කිහිපයකට පෙර ආරම්භ වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මලල ක්‍රීඩා ශූරතාවලිය සඳහා සහභාගී වූ එම බලසේනාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් තරගාවලිය පුරාවටම සිය දක්ෂතාවයන් මැනවින් පිළිබිඹු කරනු ලැබූහ. එම සියලුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජවන හා පිටිය ක්‍රීඩා ඉසව් 50 ක් සඳහා සිය දායකත්වය දක්වමින් විවිධ දක්ෂතාවයන් පෙන්වීමට සමත්වූහ. එමෙන්ම, වර්ෂ 2009 මැයි මාසයට පෙර පැවති මානුෂීය මෙහෙයුමේදී විවිධ ආබාධයන්ට ලක් වූ රණවිරුවන් ඇතුලු විරෝදාර රණවිරුවන් 230 දෙනකු 23 වන අන්තර් රෙජිමේන්තු යුද්ධ හමුදා පැරා මලල ක්‍රීඩා ශූරතාවලියේදී සිය දක්කම් දැක්වූහ. ජූලි මස අවසන් සතියේ ආරම්භ වූ අන්තර් රෙජිමේන්තු ආධුනික ක්‍රීඩා උළෙල සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 597 දෙනකු සහභාගී වූ අතර එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මලල ක්‍රීඩා කුසලතා පරීක්ෂා කර අවසන් මහා තරගයට සහභාගී කරවනු ලැබූහ.





මෙහි ජය සංකේත ප්‍රදානයට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදා ක්‍රීඩා කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ද එක්වූහ. තවද, 58 වන සේනාංකයේ සේනාංකාධිපති සහ යුද්ධ හමුදා පැරා මලල ක්‍රීඩා කමිටුවේ උප සභාපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ටීඩබ්ලිව්ජී ඉහලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, යුද්ධ හමුදා අත්පන්දු කමිටුවේ සභාපති බ්‍රිගේඩියර් එම්ජීආර් ගුණසේකර ආර්එස්පී සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ පුහුණු පරීක්ෂක බ්‍රිගේඩියර් එම්ටීකේආර් සිල්වා කේඑස්පී ද එක්වූහ.







# යුද්ධ හමුදාධිපති පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ සංචාරයක

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පසුගිය අගෝස්තු 07 වන දින පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය යටතේ පාලනය වන මුල්ලේරියාව, Sunflower Village හී සංචාරයක නිරත විය.

යුද්ධ හමුදාධිපති එහිදී යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකි ලියනගේ මහත්මිය සමග ප්‍රථමයෙන් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය යටතේ පාලනය වන Sunflower Village වෙත ගොස් එහි ක්‍රියා පටිපාටිය නිරීක්ෂණය කිරීමටද කටයුතු කළහ. නව සංකල්පයකට අනුව නිර්මාණය කරන ලද මෙම තිරසාර ප්‍රජා ගම්මානය තුළ, "යෝගට්" නිෂ්පාදන ඒකකයක්, පැල තවාන් සහ බෝග වගාව ඇතුළු විවිධ සුහසාධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වේ. ඉන් අනතුරුව, යුද්ධ හමුදාධිපති පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ මී මැසි පාලන ව්‍යාපෘතියේ නිරීක්ෂණ චාරිකාවකද නිරත විය.

මෙම සංචාරයේදී, හටපිරිස්වල ආහාර පිළියෙළ කිරීම සහ එහි ප්‍රමිතිය, ඒවායේ අඩංගු කැලරි ප්‍රමාණය ආදිය පිළිබඳ යුද්ධ හමුදාධිපති සූපවේදීන් සහ සෙසුනිලයන් සමග අදහස් හුවමාරු කරගනු ලැබීය. අනතුරුව, දිවා භෝජනය භුක්ති විඳිමින් සිටි කාන්තා සෙබළියන් හමුවූ හෙතෙම ආහාරවල ගුණාත්මකභාවය සහ ආහාර ගැනීමේදී මතුවන ගැටලු පිළිබඳ ඔවුන් සමගින්ද සාකච්ඡා කරන ලදී. තවද, යුද්ධ හමුදාධිපති සෙසුනිලයන්ගේ හටනිවාසවල පවතින පහසුකම් පිළිබඳව ද විමසා බැලුවේය.

# යුද්ධ හමුදාධිපති ගේ ආසේමු (යාපනය) ප්‍රථම නිල සංචාරය

යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් අගෝස්තු 26 වන දින ආරක්‍ෂක සේනා මූලස්ථානය - යාපනයෙහි නිල සංචාරයක නිරත විය.




එහිදී, යුද්ධ හමුදාව විසින් උතුරු ප්‍රදේශයේ ආරම්භ කරන ලද ප්‍රජා මූලික ව්‍යාපෘති රැසක් විවෘත කිරීමේ අවස්ථාවට ආරක්‍ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති සහභාගී විය. එහිදී, යාපනය ජනතාවට විවේකීව විනෝදාස්වාදය ලබාගැනීම සඳහා ඉදිකරන ලද ***Harmony Theme Park*** ප්‍රජා මූලික ව්‍යාපෘතිය ජනතා අයිතියට පත්කිරීමද සිදුකෙරිණ.




රණවිරු දැතින් කෝපායි ප්‍රදේශයේ ඉදිකරන ලද ***CIMIC*** උද්‍යානය ද යුද්ධ හමුදාධිපතිගේ නිරීක්‍ෂණයට බඳුන් වූ අතර, එහිදී පැවති සුහද පාපන්දු තරගාවලියක් නැරඹීමටද ගෙතෙම එක්වූවේය.




යාපනය ප්‍රදේශයේ සිදුකළ සංචාරය අතරතුර යාපනය පුලෝලි ප්‍රදේශයේ හිටපු එල්ටීටීඊ සාමාජිකයකුගේ පවුලක් වෙනුවෙන් ඉදිකරන ලද නව නිවස විවෘත කිරීමේ අවස්ථාවට ද යුද්ධ හමුදාධිපති එක්විය.

# යුද්ධ හමුදාධිපති ගේ ආසේමු (වන්නි) ප්‍රථම නිල සංචාරය





ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් අගෝස්තු 27 වන දින වන්නි ආරක්‍ෂක සේනා මූලස්ථානයේ නිල සංචාරයක් සිදුකරන ලදී.

එහිදී, යුද්ධ හමුදාධිපති විසින් ආරක්ෂක සේනා මූලස්ථානය - වන්නි යටතේ ස්ථාපිත සේනාංක, බලසේනා සහ ඒකකයන්හි සියලුම නිලයින් අමතමින්, යුද්ධ හමුදාවේ තම රාජකාරීන් කැපවීමෙන් යුතුව ඉටුකිරීමේ වැදගත්කම, තම වෘත්තීය දැනුම නිරන්තරයෙන් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවයද පෙන්වා දුන්නේය. තවද, යුද්ධ හමුදාව විසින් ක්‍රියාත්මක කරන හරිත කෘෂිකාර්මික ව්‍යාපෘතින් ඉදිරියට ගෙනයාම, වෘත්තීය දක්ෂතාවයන් වැඩිදියුණු කරගැනීම සහ යුද්ධ හමුදාවේ විනය පවත්වාගෙන යාම වැනි කරුණුද එහිදී අවධාරණය කෙරිණ.

මෙම අවස්ථාව සඳහා 21, 54, 56, 62 සහ 65 වන සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, ආඥාපති ඉදිරි තඩත්තු පෙදෙස - වන්නි, බලසේනාධිපතිවරු, ඒකක අණදෙන නිලධාරීවරුන් ඇතුළු සෙසුනිලයින් විශාල පිරිසක්ද සහභාගී වූහ.

# යුද්ධ හමුදාධිපති ගේ ආසේමු (මුලතිව්) ප්‍රථම නිල සංචාරය






යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ යාපනය ප්‍රදේශයේ සිදුකළ සංචාරයෙන් පසුව ඉකුත් අගෝස්තු 27 වන දින ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) වෙත පැමිණි අතර, එහිදී එතුමන් එම මූලස්ථානයේ කාර්යභාරය පිළිබඳව සොයා බැලීමේ ක්ෂේත්‍ර චාරිකාවකද නිරත විය.

එහිදී, ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියූ විසින් කරන ලද ආරාධනයකට අනුව ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) යටතේ සේවය කරනු ලබන සිවිල් සේවක මහතුන් වෙත වියළි සලාක පාර්සල් බෙදාදීමට සහ යුද්ධ හමුදාවේ රාජකාරී කරනු ලබන දමිළ යුද්ධ හමුදා සමාජිකයන් ගේ අවශ්‍යතා ඇති පවුල්වල පාසල් අධ්‍යාපනය ලබන දරුවන් වෙත අත්‍යවශ්‍ය පාසල් උපකරණ බෙදාදීමටද එක්විය. අනතුරුව, මෙම වර්ෂයේදී ඉන්දියාවේ පැවති කික් බොක්සිං තරගාවලියෙන් රිදී පදක්කම දිනූ කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලයේ අධ්‍යාපනය ලබන ජෙගනේෂ්වරම් විජිතා ක්‍රීඩිකාව සහ පාකිස්තානයේ පැවති කික් බොක්සිං තරගාවලියෙන් රන් පදක්කමක් දිනූ පුතුකුඩුඉරිප්පු විද්‍යාලයේ අධ්‍යාපනය ලබන ගනේෂ් ඉන්දිකා දේවි ක්‍රීඩිකාව වෙත ඔවුන්ගේ අනාගත ජයග්‍රහණ සඳහා පුහුණුවීම් කටයුතු සිදුකිරීමට රුපියල් 50,000.00 ක වටිනාකමකින් යුත් මුදල් චෙක්පත් ප්‍රදානය කරමින් එම ක්‍රීඩිකාවන් සමඟ සුහදව අදහස් හුවමාරු කරගනිමින් ඔවුන් දෙදෙනා වෙත සුබ පැතුම් එක් කළේය.

# ගජබා රෙජිමේන්තු සේවා මුක්ත භට සංගමයට නව නිවාඩු නිකේතනයක්







ගජබා රෙජිමේන්තු සේවා මුක්ත භට සංගමයේ සාමාජිකයින් වෙනුවෙන් සාලියපුර රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ඉදිකරන ලද නිවාඩු නිකේතනය එම සභාපති ලුතිනන් කර්නල් දීපාල් සුබසිංහ (විශ්‍රාමික) ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති, ගජබා රෙජිමේන්තුවේ අධිපති සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් ඉකුත් අගෝස්තු 28 වන දින විවෘත කරන ලදී. ගජබා රෙජිමේන්තු සේවා මුක්ත භට සංගමයේ සාමාජිකයින් සඳහා විවේකීව විනෝදාස්වාදය ලබාගැනීමේ අරමුණින් එම නිවාඩු නිකේතනය ඉදිකරන ලද අතර, එය විවෘත කෙරුණේ එම සංගමයේ 19 වන වාර්ෂික මහ සභා රැස්වීමට සමගාමීවය. මෙම නිවාඩු නිකේතනය නවීන ගෘහභාණ්ඩ, පහසුකම් සහිත කාමර තුනකින් සහ සාකච්ඡා පැවැත්වීම සඳහා ශාලාවකින්ද සමන්විත වේ.

එම උත්සව අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති, යුද්ධ හමුදා විධායක ජෙනරාල්, 52 වන සේනාංකයේ සේනාංකාධිපති, ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු පිරිසක්ද සේවා මුක්ත භට සංගමයේ ජ්‍යෙෂ්ඨ ගජබා නිලධාරීන් පිරිසක්ද එක්වූහ.

# 'Civilian Bravery in Sri Lanka 1993 – 2018' ග්‍රන්ථයෙහි පිටපතක් යුද්ධ හමුදාධිපති වෙත



විරුජන පදනමෙහි නිර්මාතෘ සහ සභාපති කේ.පී චන්ද්‍රරත්න මහතා විසින් රචිත "*Civilian Bravery in Sri Lanka* 1993 - 2018" ග්‍රන්ථයේ පිටපතක් ඉකුත් අගෝස්තු 24 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත පිළිගන්වන ලදී. එම කෘතියෙහි 1993 සිට 2018 වසර දක්වා පසුගිය වසර 25ක කාලය සිවිල් වැසියන්ගේ නිර්භීත ක්‍රියාවන් පිළිබඳ විස්තර ඇතුලත්ය.

2009 අංක 4 දරන පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපනය කර ඇති "විරුජන පදනම" එහි නිර්මාතෘ සහ වත්මන් සභාපති කේ.පී චන්ද්‍රරත්න මහතාගේ මූලිකත්වයෙන් 1993 මස ජනවාරි 03 දින ආරම්භ කරන ලදී. විරුජන පදනමෙහි මුල්ම ඇගයීමේ කටයුත්ත වූයේ 1993 වසරේදී කළුතර උක්වත්ත ප්‍රදේශයේ ගඟක යාත්‍රා කරමින් තිබූ පාරුවක් ගඟ මැද්දී පෙරළී යාමෙන් තම ජීවිත අවධානමද නොතකා එහි සිටි සිවිල් වැසියන් 6 දෙනකු බේරා ගැනීමට ගත් උත්සාහයේදී දිවිපිදූ නිර්භීත ශ්‍රී ලාංකීය සිවිල් පුරවැසියෙකි. එහිදී, කේ.පී චන්ද්‍රරත්න මහතා විසින් අදහස් දක්වමින් "ඕනෑම ශිෂ්ට සමාජයක පරම යුතුකම වන්නේ විශේෂයෙන්ම වර්තමාන සමාජයේ, එවැනි වීර ක්‍රියාවන් සිදුකරන නිර්භීත පුද්ගලයන් හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම බව" ප්‍රකාශ කරන ලදී.

# "අන්තර් රෙජිමේන්තු රග්බි තරගාවලිය - 2022"









යුද්ධ හමුදා "අන්තර් රෙජිමේන්තු රග්බි තරගාවලිය - 2022" අවසන් මහා තරගය පසුගිය අගෝස්තු 30 වන දින කොළඹ තුරග තරග පිටියේදී පැවැත්විණ. එහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා රග්බි කණ්ඩායම විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බලකා රග්බි කණ්ඩායම ලකුණු 24 කින් පරදවා එහි ශූරතාවය දිනාගැනීමට සමත්විය.

යුද්ධ හමුදා සාමාජිකයින් අතර රග්බි ක්‍රීඩාවට ඇති ජනප්‍රියතාවය නිසා යුද්ධ හමුදා ක්‍රීඩා දින දර්ශනයේද එය විශේෂ ස්ථානයක් හිමිකරගෙන ඇති අතර, එමගින් යුද්ධ හමුදාවට මහත් කීර්තියක්ද ලැබී ඇත. තවද, රට පුරා සිටින විවිධ රග්බි ක්‍රීඩා සමාජයන්ට ප්‍රබල අභියෝගයක් එල්ල කරමින් සේවා සහ ජාතික මට්ටමින් තරග රැසක් වාර්තාගත ලෙස ජයග්‍රහණ කිරීමට හැකි දක්ෂ රග්බි ක්‍රීඩකයින් රැසක් යුද්ධ හමුදාව තුළින් බිහිවී තිබීමද විශේෂත්වයකි.

මෙම තරගාවලිය පසුගිය ජූනි මස 27 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨ රග්බි කණ්ඩායම ඇතුළුව යුද්ධ හමුදා රෙජිමේන්තු රග්බි කණ්ඩායම් 16ක ගේ සහභාගීත්වයෙන් ආරම්භ කරන ලද අතර, අවසන් මහා තරගයට ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය.

යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක්ද යුද්ධ හමුදා රග්බි කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඇතුළු එම කමිටුවේ සාමාජිකයින් රැසක්ද එම අවස්ථාවට එක්වූහ.



# යුද්ධ හමුදාධිපති රත්මලාන යුද්ධ හමුදා අතරමැදි කඳවුරේ නිරීක්ෂණයක







යුද්ධ හමුදා ඒකකයන් වෙතින් යුද්ධ හමුදා සාමාජිකයන් වෙත සපයනු ලබන යටිතල පහසුකම් සහ ආහාරපානවල ගුණාත්මකභාවය පිළිබඳ සොයාබැලීමේ අරමුණින් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පසුගිය අගෝස්තු 14 වන දින යුද්ධ හමුදා තූර්ය වාදක හා රංග කලා අධ්‍යක්ෂ මණ්ඩලය, රත්මලානේ පිහිටි යුද්ධ හමුදා අතරමැදි කඳවුර සහ 4 වන ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා කඳවුරේ නිරීක්ෂණයක නිරත විය. එහිදී, එම කඳවුරුවල මුළුතැන්ගෙයි පරිශ්‍රයන් සේම සෙසුනිලයන්ගේ නේවාසිකාගාරවල කටයුතුද යුද්ධ හමුදාධිපති සොයාබලනු ලැබීය. තවද, එහිදී සූපවේදීන් ඇතුළු කාර්ය මණ්ඩලය සමග අදහස් හුවමාරු කරගනිමින් දෛනික ආහාර වේල්, ආහාරපානවල ගුණාත්මකභාවය සහ පෝෂණ ගුණයන්, කැලරි ප්‍රමාණය, ආහාර පිසීම සඳහා භාවිතා කරනු ලබන මුලුතැන්ගෙයි උපකරණ සහ හටනිවාසයන්හි අවශ්‍යතා පිළිබඳවද වැඩිදුරටත් සොයාබැලීය.

# 'නොනැවතී ඉදිරියට' ග්‍රන්ථයෙහි පිටපතක් යුද්ධ හමුදාධිපති වෙත පිළිගන්වයි



"මා නිවත්ත අභික්කම" යන පාලි වචනයෙන් අර්ථවත්වන "නොනැවතී ඉදිරියට" යන අභිමානවත් ගැමුණු හේවා රෙජිමේන්තුවේ ආදර්ශ පාඨය පෙරදැරි කොටගෙන ගැමුණු හේවා බලකායේ කීර්තිමත් ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වන මේජර් ජෙනරාල් එම්එම් සුමනසේන (විශ්‍රාමික) විසින් රචිත " නොනැවතී ඉදිරියට" යන ග්‍රන්ථයෙහි පිටපතක් එතුමන් විසින් ඉකුත් අගෝස්තු 29 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත පිළිගන්වන ලදී.

# යුද්ධ හමුදාධිපති "ජාතික ආරක්ෂාව සහ උපායමාර්ගික අධ්‍යයන" පාඨමාලා සිසුන් අමතයි



කොළඹ 3 පිහිටි ජාතික ආරක්ෂක විද්‍යාලයේ "ජාතික ආරක්ෂාව සහ උපායමාර්ගික අධ්‍යයන පාඨමාලා අංක - 01" හදාරනු ලබන ශිෂ්‍ය නිලධාරීන් වෙනුවෙන් සම්ප්‍රදායානුකූලව පවත්වනු ලබන "හමුදාධිපති දේශනය" පැවැත්වීම සඳහා පසුගිය අගෝස්තු 10 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ එක්විය.

එම විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් කේඒඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී විසින් සිදුකළ ආරාධනාවකට අනුව සපැමිණි යුද්ධ හමුදාධිපති "ජාතික ආරක්ෂාව පිළිබඳ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දායකත්වය" යන තේමාව ඔස්සේ සිදුකළ එම දේශනයේදී, වත්මන් සහ ඉදිරි ආරක්ෂක අභියෝග, ආරක්ෂාව හා සම්බන්ධ ගැටලු, තර්ජනවල විවිධත්වය ආදී කරුණු පිළිබඳව පැහැදිලි කරන ලදී. එහිදී ශිෂ්‍ය නිලධාරීන්ට ඔවුන්ගේ ගැටලු ඉදිරිපත් කර විසඳුම් සාකච්ඡා කිරීමටද අවස්ථාව සැලසිණ. පාඨමාලාව හදාරන යුද්ධ හමුදා නිලධාරීන් 14 දෙනකු, නාවික හමුදා නිලධාරීන් 7 දෙනකු, ගුවන් හමුදා නිලධාරීන් 6 දෙනකු සහ පොලිස් නිලධාරීන් 4 දෙනකු මෙම දේශනයට සහභාගී වූහ.

# "Volunteers from Ceylon WWs 1 & 2" ග්‍රන්ථය පිළිගන්වයි

ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාම ගිය ප්‍රවීණයන් විසින් සම්පාදනය කරන ලද "Volunteers from Ceylon WWs 1 & 2" යන ග්‍රන්ථයේ පිටපතක් ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තිදෙනකු විසින් ඉකුත් අගෝස්තු 19 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවී පිළිගන්වනු ලැබූහ.



මෙම සුහද හමුවේදී බ්‍රිගේඩියර් හිරාන් හලංගොඩ (විශ්‍රාමික), ග්‍රෑප් කපිතාන් කුමාර කිරින්දේ (විශ්‍රාමික) සහ ප්‍රධාන සුළු නිලධාරී ක්වින්ටස් ඇන්ඩෲඩ් (විශ්‍රාමික) යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් පළමු ලෝක යුද්ධයේදී සහ දෙවන ලෝක යුද්ධයේදී ලංකා යුද්ධ හමුදාව ඉටුකරනු ලැබූ කාර්යභාරය අලලා රචිත මෙම ග්‍රන්ථය අනාගතයේදී මූලාශ්‍ර කෘතියක් ලෙස වැදගත් වන බව එහිදී හමුදාධිපති වෙත කරුණු පැහැදිලි කළහ.

තවද, එම අවස්ථාවට එක්වූ ගැමුණු හේවා බලකායේ බ්‍රිගේඩියර් හිරාන් හලංගොඩ (විශ්‍රාමික) විසින් යුද්ධ හමුදා රෝහල්වල ප්‍රතිකාර ලබන රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා ඇඩ් සත්කාර ඒකක ඇඳන් සහ මෙට්ට 114 ක් ලබාදීමට සූදානම් බවද යුද්ධ හමුදාධිපති වෙත දන්වා සිටින ලදී.




# විරු දරි ලැබදෙන "විරු සිසු ප්‍රදීප"





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් සංවිධානය කරන ලද "විරු සිසු ප්‍රදීප" ශිෂ්‍යත්ව ප්‍රධානෝත්සවය ඉකුත් අගෝස්තු 22 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය. රටේ භෞමික අඛණ්ඩතාව සහ ස්වෛරීභාවය වෙනුවෙන් ප්‍රාණ දානය සහ කාය දානය ලබාදුන් රණවිරුවන්ගේ 5 වසර ශිෂ්‍යත්වය සමත් දූ දරුවන් 91 දෙනකු සඳහා මෙහිදී රුපියල් 25,000/- ක වටිනාකමකින් යුත් ළමා ඉතුරුම් ගිණුම් ආරම්භ කර ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරිණ. ජනාධිපති ලේකම්තුමන් සභාපතිත්වය දරන ජාතික ආරක්ෂක අරමුදල සමගින් DFCC බැංකුව ඒකාබද්ධව මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. මෙම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය සඳහා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් එක්ව සිටියහ.

# එතෙර කෙළිබිම දිනූ විරුවන්ට යුද්ධ හමුදාවෙන් ඇගයීම්



පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල - 2022 තරගාවලියේ පැරා කවපෙත්ත විසිකිරීමේ තරග ඉසව්වෙන් (F42-44/61-64 කාණ්ඩයේ) රිදී පදක්කමක් දිනාගත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සැරයන් පාලිත බණ්ඩාර එච්ජී සහ කිලෝග්‍රෑම් 55 බර ඉසිලීමේ තරග ඉසව්වෙන් ලෝකඩ පදක්කමක් දිනාගත් කෝප්‍රල් කුමාර වයිඩීඅයි ඉකුත් 24 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවූහ.

එම සුහද හමුවේදී යුද්ධ හමුදාධිපති විසින් පදක්කම් ලාභී ක්‍රීඩකයින්ගේ ජයග්‍රහණ ඇගයීමට ලක් කරමින් ඔවුන්ට සුභ පැතුම් පිරිනැමූ අතර, ඔවුන්ගේ ක්‍රීඩා කුසලතා තව දුරටත් වැඩි දියුණු කරගැනීම සඳහා අඛණ්ඩව සහාය ලබා දෙන බවටද සහතික විය. එහිදී යුද්ධ හමුදාධිපති විසින් මාණ්ඩලික සැරයන් යුපුන් අබේකෝන් මීළඟ නිලයට උසස් කිරීමට අවශ්‍ය උපදෙස්ද ලබා දෙන ලදී.

සුහද හමුව අතරතුරදී යුද්ධ හමුදාධිපති විසින් ඔවුන්ගේ අනාගත පුහුණු කටයුතු සඳහා දිරිගැන්වීමක් වශයෙන් සැරයන් පාලිත බණ්ඩාර එච්ජී වෙත රුපියල් 375,000.00 ක වටිනාකමින් යුත් මුදල් චෙක්පතක් සහ කෝප්‍රල් කුමාර වයිඩීඅයි වෙත රුපියල් 500,000.00 ක වටිනාකමින් යුත් මුදල් චෙක්පතක් ප්‍රදානය කරන ලදී. යුද්ධ හමුදාධිපති කාර්යාලයේ පැවති මෙම හමුව සඳහා යුද්ධ හමුදා ක්‍රීඩා අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී ද එක්විය.

# අන්තර් රෙජිමේන්තු පැරා රෝද පුටු සහ පාපැදි තරගාවලිය ආරම්භ වේ




23 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැරා ක්‍රීඩා උළෙලට සමගාමීව ශ්‍රී ලංකා යුද්ධ හමුදා ගජබා රෙජිමේන්තුවේ මූලස්ථාන බළඇණිය විසින් සංවිධානය කරන ලද "අන්තර් රෙජිමේන්තු පැරා රෝද පුටු සහ පාපැදි තරගාවලිය -2022" පසුගිය අගෝස්තු 03 වන දින අනුරාධපුර, රඹෑව හිදී පවත්වන ලදී. යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 6 ක් නියෝජනය කරමින් රෝදපුටු තරගකරුවන් 9 දෙනකු සහ පාපැදිකරුවන් 11 දෙනකු මෙම තරග ඉසව් සඳහා සහභාගී වූහ. එහිදී රෝද පුටු මැරතන් තරගයේ ප්‍රථම ස්ථානය ගජබා රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් රත්නායක එච්එම් ද, පාපැදි තරගයේ ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ කෝප්‍රල් කුමාර ජීපීඅයිආර් ද හිමිකරගනු ලැබූහ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මෙන්ම ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී වූහ.

# නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී යක්කල 'රණවිරු ඇපරල්' ඇඟලුම් කර්මාන්ත ශාලාවේ නිරීක්ෂණ චාරිකාවක





යුද්ධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදා "රණවිරු ඇපරල්" කර්මාන්ත ශාලා කළමනාකරණ මණ්ඩලයේ සභාපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පසුගිය අගෝස්තු 10 වන දින යක්කල "රණවිරු ඇපරල්" ඇඟලුම් කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන අංශයන්ගේ ඵලදායිතාවය සොයාබැලීම සඳහා නිරීක්ෂණ චාරිකාවක නිරත විය. එහි සේනාවිධායක බ්‍රිගේඩියර් එම්ජී ඉසදීන් ආර්එස්පී, නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් ඒසීජේ වාසගේ ඇතුළු නිලධාරීන් පිරිසක් සමගින් නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී එම කර්මාන්ත ශාලාවේ කටයුතු සහ අවශ්‍යතා පිළිබඳ සොයා බැලූහ.

එහදී, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා උසස් තත්වයෙන් යුත් නිල ඇඳුම් නිෂ්පාදනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, අපේක්ෂිත නිෂ්පාදන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා එහි ප්‍රමිතීන් ඉහළ නැංවීමට හැකි සෑම සහයෝගයක්ම ලබාදෙන බවට ද නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී සහතික විය. එසේම කර්මාන්ත ශාලාවේ කටයුතු සාර්ථකව පවත්වාගෙන යාම වෙනුවෙන් එහි සේවය කරන විවිධ හැකියාවන්ගෙන් යුත් රණවිරුවන්ටත්, සේනාවිධායක ඇතුළු සියලුම නිලයන්ටත් හෙතෙම සිය කෘතඥතාවය පළ කිරීමටද අමතක නොකළේය. යුද්ධ හමුදා යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ආර්ඩබ්ලිව්ඩබ්ලිව්එච්ජේබී වනිගසේකර යූඑස්පී සහ යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ජීකේඅයි විතානාච්චි ද මෙම නිරීක්ෂණ චාරිකාව සඳහා එක්වූහ.



# අඩු ආදායම් ලාභී පවුලක් වෙත නව නිවසක්

දැඩි ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ ජීවත්වන පවුලක් වන නාගමනී සරස්වතී මහත්මියට සහ ඇයගේ පවුලේ සාමාජිකයන් වෙත නව නිවසක් ඉදිකර භාරදීම ඉකුත් ජූලි 22 වන දින ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. එම මූලස්ථානය යටතේ ස්ථාපිත 4 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ සහ 7 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ හටපිරිස්හි තාක්ෂණික දැනුම සහ ශ්‍රම දායකත්වයන්වයෙන් යාපනය අර්ධද්වීපයේ චාවකච්චේරි, චන්ද්‍රපුරම් ප්‍රදේශයේ සත්‍ය ශ්‍රී සංවිධානයේ, වී මනෝහරන් මහතා විසින් ලබා දුන් මූල්‍ය ආධාර මත මෙම නිවස ඉදිකෙරිණ. තවද, එම නිවාසලාභී පවුලේ සිටින පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පාසල් උපකරණද නිවසට අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ වියළි සලාක පාර්සල් ද එහිදී පරිත්‍යාග කෙරිණ. මෙම අවස්ථාවට 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 523 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ඇතුලු පිරිසක් එක්වූහ.

# යුද්ධ හමුදා විද්‍යාපීඨයේ කෙඩෙට් නිලධාරීන්ගේ ක්ෂේත්‍ර චාරිකාව



ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ කෙඩෙට් නිලධාරී පාඨමාලා "අංක 91" සහ "අංක 91 බී" කණ්ඩායම් යටතේ පුහුණුව ලබන කෙඩෙට් නිලධාරීන් 137 දෙනකු ඔවුන්ගේ පුහුණු පාඨමාලාවේ එක් කොටසක් ලෙස ඉකුත් ජූලි 25 වන දින දඹුලුහල්මිල්ලෑව පිහිටි යාන්ත්‍රික පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සහ ඉකුත් ජූලි 27, 28 දෙදින යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ ක්ෂේත්‍ර චාරිකාවක නිරත වූහ.

එම කෙඩෙට් නිලධාරීන් අතර සැම්බියාව සහ මාලදිවයින යන රටවල් නියෝජනය කරමින් විදේශීය කෙඩෙට් නිලධාරීන් තිදෙනෙක් සහ දේශීය කෙඩෙට් නිලධාරීන් 134 දෙනකු වූහ. එහිදී, ආරක්ෂක සේනා මූලස්ථාන (යාපනය) කර්නල් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී විසින් යාපනය අර්ධද්වීපය පිළිබඳවත්, ආරක්ෂක සේනා මූලස්ථාන - යාපනය ආරම්භය සහ එහි වර්ධනය, එහි කාර්යභාරය සහ වගකීම් පිළිබඳවත් සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී. අනතුරුව සිවිල් - හමුදා සහයෝගීතා වැඩසටහන් සහ යුද්ධ හමුදාව විසින් සිවිල් ජනතාවට සිදුකරනු ලබන ප්‍රජා මූලික කටයුතු පිළිබඳවත් කෙටි ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී.

ක්ෂේත්‍ර චාරිකාව අතරතුර කෙඩෙට් නිලධාරීන් පිරිස යාපනය කොටුව, යාපනය පුස්තකාලය, සංගුපිඩ්ඩි පාලම, අලිමංකඩ රණවිරු ස්මාරකය, මනල්කාඩු වැලි කඳු, ශ්‍රී ලංකාවේ උතුරු කෙලවරෙහි පිහිටි පේදුරු තුඩුව, වල්ලිපුරම් කෝවිල, දඹකොළ පටුන, පොන්නලේ, කීරමලෙයි පොකුණ සහ යාන්ත්‍රික පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානය යන ස්ථානවලද සංචාරය කරනු ලැබූහ. යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ සිදුකරන ලද ක්ෂේත්‍ර චාරිකාව අවසානයේ එම කෙඩෙට් නිලධාරීන් සහ යාපනය ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අතර සමරු තිළිණ හුවමාරුවක්ද සිදුකරන ලදී.

# විශේෂ අතිරේක ප්‍රහාරක බණ්ඩ පුහුණු පාඨමාලාවේ දෙවන අධියර ආරම්භ කෙරේ





ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සංකල්පයකට අනුව 21, 54, 56, සහ 65 වන පාබල සේනාංකයන් යටතේ ඇති බළඇණිවල රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ තෝරාගත් නිලධාරීන් 05 දෙනකු සහ සෙසුලයින් 151 දෙනකුගේ සහභාගීත්වයෙන් විශේෂ අතිරේක ප්‍රහාරක බණ්ඩ පුහුණු පාඨමාලාවේ දෙවන අධියර ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති ගේ ආරම්භක දේශනයෙන් අනතුරුව ඉකුත් අගෝස්තු 22 වන දින සිට සැප්තැම්බර් 28 වන දින දක්වා බළඇණි පුහුණු පාසල - පම්පෙමඩුහි දී ආරම්භ කරන ලදී.



මෙම පඨාමාලවේ විෂය පථය සඳහා ජීපීඑස් යන්ත්‍ර හැසිරවීම, ආත්ම ආරක්ෂක සටන් කලාව (කරාතේ), අවි රහිත සටන් ක්‍රම, විශේෂ පුද්ගලයින් ආරක්ෂා කිරීම, වෙඩි ද්‍රව්‍ය හඳුන්වාදීම හා බිඳහෙලීම, අවි හැසිරවීම සහ ජීව වෙඩි තැබීම, යුද මූලධර්මයන් මෙන්ම අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි පිළිබඳ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබාදීම සිදුකෙරිණ. මෙහිදී, ඉංජිනේරු රෙජිමේන්තුව, කමාන්ඩෝ රෙජිමේන්තුව, විශේෂ බලකාය, ප්‍රගුණ හා සැඟවුණු වෙඩික්කරු පුහුණු පාසල්වල විශේෂිත වූ උපදේශකයින්ගේ සහ 56 වන පාබල සේනාංක බළඇණි පුහුණු පාසලෙහි උපදේශකයින්ගේ මගපෙන්වීමෙන් මෙම පාඨමාලාවේ පුහුණු කටයුතු සිදුකරන ලදී.

# දිළිඳු පවුල් වෙත සහන සලසයි





233 වන පාබල බලසේනාව යටතේ ඇති 9 වන කාලතුවක්කු හමුදා බලප්‍රදේශයේ අරලගංවිල බටහිර ග්‍රාමසේවා වසමට අයත් දෙහිඅත්තපිටිය යාය, ජයමුතුගම සහ යාය 03 යන ගම්මානයන් හි අඩු ආදායම්ලාභී පවුල් 100 ක් සඳහා රුපියල් 5000.00 කට වඩා වටිනාකමකින් යුත් වියළි ආහාර මළු 100 ක් සහ එම ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල අධ්‍යාපනය හදාරනු ලබන සිසු සිසුවියන් 100 ක් වෙත රුපියල් 2500.00 ක වටිනාකමකින් යුත් ඉංග්‍රීසි සිංහල ශබ්දකෝෂ 100 ක් බෙදාදීමේ වැඩසටහනක් පවත්වන ලදී. ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සමාජ සත්කාරයට "මනුෂ්‍යත්වයේ සහන යාත්‍රාව" වැඩසටහන යටතේ ගම්පහ ප්‍රදේශයේ ජ්ඩ්ංචි ප්‍රසාද් ලොකුබාලසූරිය මහතාගේ සංවිධානයෙන් සහ ඔහුගේ මිතුරු කැළගේ පරිත්‍යාගශීලීත්වය මත මෙම කටයුත්ත සිදුවිය.

# දිළිඳු පවුල් වෙත සහන සලසයි



මනුෂ්‍යත්වයේ සහන යාත්‍රාව ප්‍රජා මූලික ව්‍යාපෘතියේ තවත් එක් අදියරක් වශයෙන් ඉකුත් ජූලි 25 වන දින තොප්පිගල, කිලිවෙඩ්ඩි, කිරිල්ලවේලි, වැලිකන්ද, සිංහපුර, සේවනපිටිය සහ කදුවන්විල යන ප්‍රදේශවල ජීවත්වන අඩු ආදායම්ලාභී සිවිල් වැසියන් වෙත ද රුපියල් 5000/= ක වටිනාකමකින් යුත් වියළි සලාක පාර්සල් 200 බෙදා දෙනු ලැබිය.

ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) භටපිරිස්වල සම්බන්ධීකරණයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචි ප්‍රසාද් ලොකුබාලසූරිය මහතා විසින් පිරිනමන ලද මූල්‍ය ආධාර මත ආරක්ෂක සේනා (නැගනහිර) ආඥාපති ගේ ප්‍රධානත්වයෙන් මෙම පරිත්‍යාගයන් බෙදාදෙන ලදී.

# නවීකරණය කරන ලද ස්කොෂ් පිටියක් සහ ව්‍යායාම මධ්‍යස්ථානයක්






ගණේමුල්ල කමාන්ඩෝ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ රාජකාරි කරනු ලබන භටයින්ගේ ශාරීරික යෝග්‍යතාවය සහ ක්‍රීඩා හැකියාවන් වැඩිදියුණු කිරීමේ අරමුණින් එහි බලකාධිපතිගේ උපදෙස් මත ප්‍රතිසංස්කරණය කරන ලද "මෙරුන්ස්" ස්කොෂ් පිටිය සහ කපිතාන් ජේඑෆ්එස් ද ෆොන්සේකා අනුස්මරණ ව්‍යායාම මධ්‍යස්ථානය ඉකුත් ජූලි 26 වන දින 1 වන බලකායේ බලකාධිපති සහ කමාන්ඩෝ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥානරත්න එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් විවෘත කෙරිණ. එහිදී, බලකාධිපති විසින්, අදාල ඉදිකිරීම් කඩිනම් කිරීම සබැඳිව කැපවීමෙන් කටයුතු කළ සියලුම නිලධාරීන්ගේ සහ සෙසු නිලයින්ගේ දායකත්වය අගය කරන ලදී.

# කමාන්ඩෝ භටපිරිස් වියළි සලාක පරිත්‍යාග කරයි



හම්බන්තොට, ගල්වැව විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේලා හා අඩු ආදායම්ලාභී පවුල් 205 ක සිවිල් වැසියන් වෙනුවෙන් වියළි සලාක පාර්සල් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 12 වන දින පැවැත්විණ. කමාන්ඩෝ බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සම්බන්ධීකරණයෙන් හා විදේශගත ශ්‍රී ලාංකික පරිත්‍යාගශීලියකුගේ අනුග්‍රාහකත්වයෙන් 4 වන කමාන්ඩෝ රෙජිමේන්තුවේ භටපිරිස් මෙම මානුෂීය කටයුත්ත සංවිධානය කළහ. සීමාසහිත *'Ooredoo Qatar'* සමාගමේ ප්‍රධාන ගණකාධිකාරී ජේ.එච්. ඒකනායක මහතා විසින් එම වියළි සලාක පාර්සල් සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට අවශ්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී.





# ප්‍රතිසංස්කරණ කටයුතු සොයාබලමින්

59 වන පාබල සේනාංක බලප්‍රදේශයේ ඓතිහාසික වටිනාකමක් ඇති කුරුන්දාවශෝක විහාරය හෙවත් කුරුදුමලෙල නටබුන් පිළිබඳව ප්‍රථම වරට 1905 වර්ෂයෙහි පුරාවිද්‍යා ලේඛණවල සටහන්ව ඇත. ආරක්‍ෂා කළ යුතු ඓතිහාසික උරුමයක් ඇති මෙම ස්ථානය වනයෙන් වැසී ඇති තරමක් උස් භූමියකි. කැනීම්වලින් සොයාගත් ආකාරයට අඩි 140 ක විශ්කම්භයකින්ද අඩි 21 ක උසකින්ද යුතු කබොක් ගල්වලින් නිර්මිත ස්ථූපයක්ද මෙහි ඉදිකර ඇති අතර කැනීම් කටයුතු අවසන් කිරීමෙන් පසු ස්ථූපයේ සංරක්‍ෂණ කටයුතු ඉකුත් මැයි 11 වන දින ආරම්භ කරන ලදී.

ඒ අනුව ඉකුත් ජූලි 22 වන දින ආරක්‍ෂක සේනා මුලතිව් (ආඥාපති) මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියූ එම විහාරස්ථානයේ නැවත ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳව සොයාබැලීම සඳහා පැමිණි අතර, එම සංචාරය සඳහා 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඩී සූරියබංඩාර යූඑස්පී ඇතුලු නිලධාරීන් පිරිසක්ද සහභාගී වූහ.

---

# නවීකරණය කරන ලද නිවාඩු නිකේතනය විවෘත කෙරේ

මුලතිව් පුදුකුඩුඉරිප්පු ප්‍රදේශයේ පිහිටි 682 වන බලසේනාවේ නිලධාරීන් සහ සෙසුනිලයන්ගේ සුබසාධන පහසුකම් නවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් ප්‍රතිසංස්කරණය කරන ලද "බිම්වාඩිය නිවාඩු නිකේතනය" පසුගියදා 68 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්ඩබ්ලිව් පොන්නම්පෙරුම ආර්එස්පී පීඑස්සී ගේ ආරාධනයෙන් ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියූ ගේ සුරතින් විවෘත කරන ලදී. පරිත්‍යාගශීලීන් විසින් ලබාදුන් මූල්‍ය අනුග්‍රාහකත්වය මත 682 වන බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එන්සී ගලප්පත්ති අයිජී ගේ මූලිකත්වයෙන් මෙම නිවාඩු නිකේතනයෙහි කුඩා පිහිනුම් තටාකයක්ද ඉදිකර ඇත. එහි හටපිරිස් හි තාක්ෂණික දැනුම හා ශ්‍රම දායකත්වය යොදාගනිමින් මෙම නිවාඩු නිකේතනයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර ඇත.





# සංචාරයක මතක සටහන්

ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී ප්‍රස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉකුත් අගෝස්තු 17 සහ 18 යන දිනවල එම මුලස්ථානය යටතේ ඇති 61 වන පාබල සේනාංකයට අයත් 612 හා 613 වන පාබල බලසේනා සහ ඒ යටතේ ස්ථාපිත බලඇණිවල සංචාරයක නිරත විය.

එහිදී ආඥාපති විසින් එම කඳවුරුවල රාජකාරී ස්වභාවය, සොල්දාදුවන්ගේ සුබසාධන කටයුතු ආදිය පිළිබඳ නිරීක්ෂණය කළ අතර, එම නිලධාරීන් සහ සෙසුනිලයින් සමඟ සුහද පිළිසඳරක නිරතවීමටද හෙතෙම අමතක නොකළේය. මෙම දෙදින සංචාරය සඳහා 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ, ආරක්ෂක සේනා (බටහිර) බ්‍රිගේඩියර් (පාලන/භකාස), බ්‍රිගේඩියර් (සම්බන්ධීකරණ), බලසේනාධිපතිවරු ඇතුළු පිරිසක්ද එක්වූහ.



# භෝජනාගාර ගිණුම් තැබීමේ වැඩමුළුවක්

ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති ගේ උපදෙස් පරිදි සෙසුනිල භෝජනාගාර ගිණුම් තැබීමේ වැඩමුළුවක් පසුගිය ජූලි 25 වන දින සිට අධියර තුනක් යටතේ ආරම්භ විය. මෙහි පළමු අධියර ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා මූලස්ථානයෙහි ආරම්භ කෙරුණු අතර, ඒ සඳහා ආරක්ෂක සේනා බටහිර මූලස්ථානයේහි රාජකාරී කරනු ලබන සෙසු නිලයින් 30 කට ආසන්න ප්‍රමාණයක් සහභාගී වූහ.



මෙම වැඩමුළුව ආරක්ෂක සේනා මූලස්ථානය බටහිරෙහි පූර්ණ අධීක්ෂණය යටතේ සිදු කරනු ලබන අතර, වැඩමුළුව සාර්ථකව සිදුකිරීම සඳහා විෂය පිළිබඳ පූර්ණ දැනුමක් සහිත ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ උපදේශක මඩුල්ලක් වෙතින් සහාය ලබාදෙනු ලැබූහ.

# දිළිඳු පවුල් වෙත සහන සලසයි





ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සම්බන්ධීකරණය හා මගපෙන්වීම යටතේ එම බලප්‍රදේශය තුළ ආර්ථික අපහසුතාවයන්ගෙන් යුත් අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් රුපියල් 568,000.00 ක වටිනාකමකින් යුත් වියළි සලාක පාර්සල් 200 ක් ලබාදීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 15 වන දින ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්විණ. කොළඹ ප්‍රදේශයේ දානපති ව්‍යාපාරික ගෝපි මහතා මෙම සත්කාරය සඳහා අනුග්‍රාහකත්වය දක්වන ලදී.

# සංචාරයක මතක සටහන්



ආරක්‍ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේ සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් ජූලි 01 සහ 02 යන දෙදින තුළ 122 වන පාබල බලසේනාවේ සහ ඒ යටතේ ඇති ඒකකවල සංචාරයක නිරත විය. එහිදී, 23 වන ගජබා රෙජිමේන්තුව, 20 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව සහ 18 වන ගැමුණු හේවා බළඇණිය ද ඔහුගේ නිරීක්‍ෂණයට බඳුන්විය. මෙම අවස්ථාවට 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 122 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# ඓතිහාසික රුහුණු මහා කතරගම ඇසළ පෙළහැර





ඓතිහාසික රුහුණු මහා කතරගම ඇසළ පෙරහැර උත්සවය සඳහා අවැසි ආරක්‍ෂක හා පරිපාලන කටයුතු මෙහෙයවීම 12 වන පාබල සේනාංකය සහ ඒ යටතේ පාලනය වන පාබල බලසේනා මූලස්ථාන, ඒකක වෙතින් සිදුකරන ලදී. එයට සමගාමීව සිදුකළ අවසන් මහා පෙරහැර ඉකුත් අගෝස්තු 11 වන දින පැවැත්වූ අතර, ඒ සඳහා 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

# වෛද්‍ය ආධාර පරිත්‍යාගයක්



12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව විසින් ලබාදුන් රුපියල් 2,14,000/= ක වටිනාකමකින් යුත් වෛද්‍ය ආධාර සහ ඖෂධ තොගයක් (Meropenem iy ceftriaxone) යුද්ධ හමුදා සාමාජිකයින්ගේ මූලිකත්වයෙන් ඉකුත් අගෝස්තු 01 වන දින හම්බන්තොට රජයේ රෝහල වෙත පරිත්‍යාග කරන ලදී. ඒ අනුව, 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති නියෝජනය කරමින් සහභාගී වූ එම සේනාංකයේ කර්නල් සම්බන්ධීකරණ නිලධාරී විසින් සංකේතාත්මකව මෙම වෛද්‍ය ආධාර සහ ඖෂධ තොගය හම්බන්තොට රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය සුරංග උඩබේසේකර වෙත භාරදෙන ලදී. 'Meropenem' යනු අභ්‍යන්තර උදර ආසාදන, නියුමෝනියාව, ලේ විෂවීම, සතුන් මඟින් වැළදෙන රෝග වැනි විවිධ බැක්ටීරියා ආසාදනවලට ප්‍රතිකාර කිරීම සඳහා භාවිතා කරන අභ්‍යන්තර එන්නත්කරණ ප්‍රතිජීවකයකි.

# යුද්ධ හමුදාවේ මූලිකත්වයෙන් පරිත්‍යාගයක්




යුද්ධ හමුදා සම්බන්ධීකරණය හා දිල්රු සහ කළණ මිතුරෝ සංවිධානයේ අනුග්‍රාහකත්වය මත ඉකුත් ජූලි 30 වන දින සංවිධානය කරනු ලැබූ පරිත්‍යාග වැඩසටහනකදී 612 වන බලසේනාවේ භටපිරිස් විසින් මතුගම පිහිටි පිටිගල සහ පැලවත්ත ප්‍රදේශයන්හි වෙසෙන සිවිල් වැසියන් 50 ක් වෙනුවෙන් එකක් රුපියල් 5000/= ක පමණ වටිනාකමකින් යුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පාර්සල් පරිත්‍යාග කරනු ලැබීය. 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ උපදෙස් හා 612 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ අධීක්ෂණය මත 12 වන ක්ෂේත්‍ර ඉංජිනේරු රෙජිමේන්තුවේ භටපිරිස් විසින් සිය බලප්‍රදේශයේ වෙසෙන අවශ්‍යතා සහිත සිවිල් වැසියන් වෙත මෙම වියළි සලාක පාර්සල් බෙදාදෙන ලදී.

# ඒකකයන්හි පරිපාලන කටයුතු පිළිබඳ සමාලෝචනයක්





ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) යටතේ ස්ථාපිත ඒකකයන්හි පරිපාලන කටයුතු පිළිබඳ සොයාබැලීමේ අරමුණින් ඉකුත් ජූලි මස 25 වන දින එම කාර්යාල පරිශ්‍රයේදී සාකච්ඡාවක් පැවැත්විණි. ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ආඥාපති බ්‍රිගේඩියර් ඒසීඒ ද සොයිසා යූඑස්පී එච්ඩීඑම්සී එල්එස්සී ගේ ආරාධනයකට අනුව මෙම අවස්ථාවට සහභාගී වූ යුද්ධ හමුදා භටකාර්ය සම්පාදන ආඥාපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ගේ ප්‍රධානත්වයෙන් මෙම සාකච්ඡාව පැවැත්විණි. එහිදී, කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය, හරිත කෘෂිකාර්මික සංකල්පයේ ප්‍රගතිය සහ ආයතනික වශයෙන් වැදගත්වන පරිපාලන කටයුතු පිළිබඳවද සාකච්ඡා කරන ලදී. තවද, මෙම අවස්ථාව සඳහා ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) යටතේ ස්ථාපිත ඒකකයන්හි අණදෙන නිලධාරීන් ද සහභාගී වූහ.

# පාඨමාලා ජය ලබමින්



2021 අගෝස්තු 08 වන දින සිට 2022 මැයි 26 වන දින දක්වා බංගලාදේශයේදී, තුළ පවත්වන ලද Drum Basic Course - 18 පාඨමාලාව සාර්ථකව හදාරා සමස්ත පාඨමාලාව තුළ දෙවන ස්ථානය 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා රයිෆල් බලකායේ සෙ/2ජේ00315 කෝප්‍රල් රාජපක්ෂ එල්ආර්ජීඑස්කේ යන කොනොනි විසින් හිමිකර ගන්නා ලදී. තත් කොනොනි එම ජයග්‍රහණ හරහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හා ස්වේච්ඡා බලසේනාවට මෙන්ම රයිෆල් බලකාය වෙත අත්කර දී ඇත්තේ ඉමහත් ගෞරවයකි. එම කොනොනිගේ යුද්ධ හමුදා දිවියට ඒකක අණදෙන නිලධාරී කර්නල් ආර්එම්එච් ජයතිස්ස විසින් ද ඒකකයේ නිලධාරීන් සහ සෙසුනිලයින් වෙනුවෙන් සුභාෂිංශන පිරිනමන ලදී.

# පරිත්‍යාගයක්



651 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්ඩබ්ලිව් බංඩාර ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ 17(සේවා) ශ්‍රී ලංකා පාබල හමුදාවේ හටපිරිස් විසින් උයිලන්කුලම් සහ තේරන්කණ්ඩාල් යන ග්‍රාමසේවා වසම්හි අඩු ආදායම්ලාභී පවුල් 34 ක් සඳහා වියළි සලාක මලු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 20 වන දින සිදුකරන ලදී. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 65 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඊජීඩීපී එදිරිසිංහ පීඑස්සී සහභාගී විය.

# බලසේනා මූලස්ථානයේ කාර්යභාරය පිළිබඳ සොයා බලමින්





21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එච්ඩීඩබ්ලිව්කේඑන් ඊරියගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉකුත් අගෝස්තු 09 වන දින 211 වන පාබල බලසේනාවේ සංචාරයක නිරත විය. එහිදී එම බලසේනාධිපති බ්‍රිගේඩියර් ඒඑම්සීපී විජයරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී විසින් සේනාංකාධිපති පිලිගැනුනු අතර, ඔහු වෙනුවෙන් කඳවුරු සම්මාන මුරයක්ද පිරිනමන ලදී. සිය සංචාරය අතරතුර සේනාංකාධිපති එහි හටපිරිස් අමතන්නටද අමතක නොකළේය. මෙම අවස්ථාව සඳහා, 21 වන පාබල සේනාංකයේ කර්නල් සම්බන්ධීකරණ කර්නල් ජේඒසී කරුණාතිලක ආර්ඩබ්ලිව්පී යූඑස්පී, 2 (සේවා) විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් පිරිසක් ද එක්වූහ.

# ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ස්මාරකයට උපහාර





අප මාතෘ භූමියේ ඒකීයභාවයත්, භෞමික අඛණ්ඩතාවයත් සුරක්ෂිත කරමින් නිදහස් හා නිවහල් රටක් නිර්මාණය කරන්නට තම ජීවිතය කැපකළ ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව සෙන්පති ඇතුළු යුද්ධ හමුදාවේ සහ නාවික හමුදාවේ රණවිරුවන් සිහිකිරීමේ 30 වන අනුස්මරණ දිනය ඉකුත් අගෝස්තු 08 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් යාපනය අරාලි තුඩුවේ පිහිටි රණවිරු ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ස්මාරකය අභියස 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේපීඑස්ඒ ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් අභිමානවත් උත්සවයක් පැවැත්විණ. මෙම අවස්ථාවට සේනාංකාධිපතිවරු, උතුරු නාවික විධානයේ ආඥාපති, බලසේනාධිපතිවරු ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ කොන්සල් ජෙනරාල් සංචාරයක



හම්බන්තොට පිහිටි ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ කොන්සල් ජෙනරාල් එම්ආර් ඩිපින් පීආර් (MR Dipin PR) ඇතුලු එම කාර්යාලයේ නියෝජිත පිරිසක් ඉකුත් 04 වන දින 12 වන පාබල සේනාංක මූලස්ථානයේ සංචාරයක නිරත වූහ. එහිදී, එම පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී විසින් ඔවුන්ව උණුසුම් අයුරින් පිළිගනු ලැබීය. එම හමුවේදී සේනාංකාධිපති විසින් නියෝජිත පිරිස අමතමින් යුද්ධ හමුදාව වර්තමානයේ ජනතාවගේ යහපැවැත්ම වෙනුවෙන් දක්වන කැපවීම, හරිත කෘෂිකාර්මික ව්‍යාපෘති, අත්‍යවශ්‍ය සේවාවන් සුමටව පවත්වාගෙන යාම වෙනුවෙන් දක්වන සහයෝගය ආදී කරුණු පිළිබඳ දැනුවත් කරන ලදී.

# නව සංඥා පද්ධතිය යාවත්කාලීන කරයි



සන්නද්ධ බුද්ධි බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ යාවත්කාලීන කරනු ලැබූ සංඥා මෙහෙයුම් පද්ධතිය විවෘත කිරීම ඉකුත් අගෝස්තු 22 වන දිනට යෙදුණු සුබ මොහොතින් එහි මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ටීටීපී සිරිවර්ධන ආර්එස්පී පීඑස්සී අයිඑස්සී ගේ ආරාධනයෙන් සංඥා බලසේනාධිපති බ්‍රිගේඩියර් බීඅයි අස්සලආරච්චි යූඑස්පී පීඑස්සී ගේ සුරතින් සිදුකෙරිණ. එම අවස්ථාවට 5 වන සංඥා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එස්ඒඑල්අයි ජයසේන පීඑස්සී සහ 10 වන සංඥා බලකායේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එච්එම්බීඑම්බී හේරත් යූඑස්පී ද සහභාගී වූහ.

# ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති ඒකකයන්හි සංචාරයක




ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් කේඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයූ ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) යටතේ ඇති හකාස ඒකකයන්හි පවතින තත්වයන් හා අවශ්‍යතා පිළිබඳ සොයා බැලීම සඳහා ඉකුත් අගෝස්තු 08 වන දින සිට 12 වන දින දක්වා සංචාරයක නිරත විය. මෙහිදී, හකාස ඒකකයන්හි දැනට පවතින ගැටළු පිළිබඳ සොයාබැලූ හෙතෙම ඒ සඳහා පවතින තත්වයන් යටතේ කඩිනමින් විසඳුම් ලබාදීමටද කටයුතු කරන ලදී.

# ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් සඳහා ජේ‍යාකොනොනි නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලාව - අංක 39



සටන් පුහුණු පාසල - අම්පාර වෙතින් පවත්වන ලද ජේ‍යාකොනොනි නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලාව - අංක 39 පාඨමාලාව ආරම්භ කර ඉකුත් ජූලි 5 වන දින සාර්ථකව අවසන් විය. යුද, නාවික සහ ගුවන් හමුදාවන්හි ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් වෙනුවෙන් පැවැත්වෙන මෙම පාඨමාලාව මගින් පුද්ගලික හා සාමූහික නායකත්ව දැනුම වර්ධනය කර යුද්ධ හමුදා අණපනත් හා නියෝග තුළින් ඔවුන්ගේ බුද්ධි මට්ටම ඉහළ නංවමින් තම යටත් පිරිස කාර්යක්ෂමව මෙහෙයවීම සඳහා අවශ්‍ය දැනුම වර්ධනය කිරීම මෙහි අරමුණ වේ.

එම පාඨමාලාව සඳහා යුද්ධ හමුදාවේ සියලුම රෙජිමේන්තු නිත්‍ය සහ ස්වේච්ඡා ඒකකයන් වෙතින් සහ යුද්ධ හමුදා පුහුණු පාසල් වෙතින් සිසු සිසුවියන් 79 දෙනකු සහභාගී වූහ. එහි අවසන් දේශනය එම පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ජේඑම්ආර්එන්කේ ජයමාන්න ආර්ඩබ්ලිව්පී විසින් සිදුකරන ලද අතර, එහිදී පාඨමාලාවේ විශිෂ්ට සාමාර්ථය 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ සෙ/703843 සැරයන් උදායි ඩබ්ලිව්පීවීඩීඅයි විසින් හිමිකරගන්නා ලදී.

# 4 වන කාන්තා බලකායෙන් මනුසත් මෙහෙවරක්




4 (සේවා) ශ්‍රී ලංකා යුධ හමුදා කාන්තා බලකා නිලධාරිණියන් සහ සෙබළියන්ගේ මානුෂීය අදහසක් ක්‍රියාවට නංවමින් ඔවුන්ගේ මූල්‍ය දායකත්වය ඇතිව කිළිනොච්චි මහ රෝහලෙහි නේවාසිකව සිටින හා ප්‍රතිකාර ලබාගැනීමට පැමිණෙන දමිළ ගර්භණී මාතාවන් වෙනුවෙන් පෝෂණදායී වියළි සලාක හා ළදරු අවශ්‍යතා පිරිනැමීමේ මානුෂීය සත්කාරයක් පසුගියදා සිදුකෙරිණ. ඒකක අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් එම ඒකක සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් පැවති එම අවස්ථාවට රෝහල් අධ්‍යක්ෂ ඇතුළු කාර්යය මණ්ඩලයද එක්වූහ.

# ඒකක සංවත්සරය සමරමින්





3 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුව ආරම්භකර වසර 32 ක් සම්පූර්ණ වීම නිමිතිකොට ගෙන ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එස්වයි ශ්‍රීමාල් ගේ ප්‍රධානත්වයෙන් ආගමික වතාවත්වලට හා යුද්ධ හමුදා සම්ප්‍රදායන්ට මුල්තැන දෙමින් ඒකක සංවත්සරය කාවන්තිස්සපුර හිදී ඉකුත් ජූලි 14 වන දින අභිමානවත් අයුරින් සමරන ලදී. ඊට සමගාමීව ඒකකයේ රාජකාරී කරමින් සිට රටදැය වෙනුවෙන් ජීවිත කැපකළ සහ රණඝෂිතයට පත් නිලධාරීන් සහ සෙසුනිලයින් සිහිපත් කරමින් කතරගම කිරිවෙහෙර චෛත්‍යය රාජයාණන් අභියස සහ කතරගම දේවාලයේදී ආගමික වතාවත් සිදුකරන ලදී. තවද, ඒකක සියලු නිලයින් සඳහා ඉදිකරන ලද ක්‍රීඩාගාරය ඒකක අණදෙන නිලධාරීගේ සුරතින් විවෘත කිරීමද මෙහිදී විශේෂ තැනක් ගන්නා ලදී.

# දිළිඳු පවුල් වෙත සහන

වත්මන් ආර්ථික තත්වය හමුවේ මාතර ප්‍රදේශයේ පීඩාවට පත් අඩු ආදායම්ලාභී පවුල් සඳහා "දයාවේ පදනම" යන තේමාව පෙරදැරි කරගෙන තලගල ශ්‍රී සිද්ධාර්ථ පදනමේ අනුග්‍රාහකත්වයෙන් සිංගප්පූරුවේ *Tan Ngak Buay and Kee Meng Lang Foundation Limited (Singapore)* යන පදනම මගින් රුපියල් 1500.00 ක වටිනාකමකින් යුත් වියළි සලාක මලු 1500 ක් බෙදාදීමේ වැඩසටහනක් පසුගියදා කඹුරුපිටිය, දික්වැල්ල, තලපේ, රඹුකන, කලුගල හේන, තැනිපිට, මොලොග්ගොඩ, බටඅඳුර සහ වැලිපිටිය යන ග්‍රාමයන් හිදී සිදුකරන ලදී. මෙම අවස්ථාවට 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ, 613 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් කේවීඅයිඑල් ජයවීර යූඑස්පී 3(සෙව්) ගැමුණු හේවා බළඇණියේ අණදෙන නිලධාරී මේජර් පීඒජීඒපී මඩිත්තපොල ඇතුලු පිරිසක් සහභාගී වූහ.




# සරුසාර වී අස්වැන්නක් නෙලා ගනිමින්



ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) යටතේ ස්ථාපිත 23 වන සේනාංකයේ භටපිරිස් විසින් පූනානි ප්‍රදේශයේ භාවිතයට නොගෙන තිබූ කුඹුරු අක්කර 17 ක භූමි ප්‍රමාණයක් මීට මාස කීපයකට පෙර අස්වද්දන ලද අතර, එම වී වගාවෙන් කිලෝ ග්‍රෑම් 1000 ක සරු වී අස්වැන්නක් සම්ප්‍රදායික චාරිත්‍රානුකූලව පැවති උත්සවයකදී ඉකුත් අගෝස්තු 21 වන දින නෙලා ගන්නා ලදී. සෞඛ්‍ය ආරක්ෂිත ආහාර වේලක් මෙරට ජනතාවට ලබාදීම සඳහා රජය විසින් ක්‍රියාවට නංවනු ලැබූ හරිත කෘෂිකාර්මික ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීමට යල කන්නය ඉලක්කකර ගනිමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් මෙම ව්‍යාපෘතිය මාස කිහිපයකට පෙර ආරම්භ කරන ලදී. මෙම අස්වැන්න නෙලීමේ උත්සව අවස්ථාව 23 වන සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එස්ජ් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී, එම සේනාංකයේ භටපිරිස් සහ ප්‍රදේශයේ ගොවි ජනතාවගේ සහභාගීත්වයෙන් පැවැත්වූහ.

# දකුණු නාවික විධානයේ ආඥාපති සහ සේනාංකාධිපති හමුවීම



රියර් අද්මිරාල් හරින්ද්‍ර ඒකනායක දකුණු නාවික විධානයේ නව ආඥාපති වශයෙන් වැඩ භාරගැනීමෙන් අනතුරුව පසුගිය ජූලි 28 වන දින 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ එම පාබල සේනාංක පරිශ්‍රයේදී මුණගැසිණි. මෙහිදී, මෙම අවස්ථාව සංකේතවත් කරමින් දෙදෙනා අතර සමරු තිලිණ හුවමාරුවක්ද සිදුවිය.

# ක්‍රීඩා දිවිය දිනුමට අත්වැලක්



කිලිනොච්චිය මධ්‍ය මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන ජෙගතේෂ්වරම් විජිතා ක්‍රීඩිකාව ඉන්දියාවේ පැවති කික්බොක්සින් තරඟාවලියෙන් රන් පදක්කමක් හිමිකර ගැනීමට සමත්වූවාය. ඒ නිමිත්තෙන් එම ක්‍රීඩිකාව ඇගයීම වස් සහ ඇයගේ ඉදිරි ක්‍රීඩා දිවියට අස්වැසිල්ලක් වශයෙන් ක්‍රීඩා උපකරණ ලබාදීමට ක්‍රියාකෙරිණ. 573 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අනුග්‍රාහක දායකත්වයෙන් ඉකුත් අගෝස්තු 10 වන දින පැවති එම වැඩසටහනට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී සහභාගි විය. මෙම අවස්ථාවට 571 සහ 573 වන පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු, කිලිනොච්චි සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, කිලිනොච්චි මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති, ගුරු මණ්ඩලය ඇතුලු සිසුන් පිරිසක් ද සහභාගී වූහ.

# අවැසි මොහොතේ උපකාරයක්






144 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ මගපෙන්වීමෙන් එම බලසේනා බලප්‍රදේශයට අයත් අඩු ආදායම්ලාභී පවුල් 42500 ක් සඳහා වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනෙහි තෙවන අධියර ඉකුත් ජූලි 22 දින පැගිරිවත්ත විවේකාරාම විහාරස්ථානයේදී පැවැත්විණි. එහිදී පවුල් 204 ක් සඳහා වියළි සලාක මළු බෙදාදීම සිදුකළ අතර, ඒ සඳහා මූල්‍ය දායකත්වය තලගල ශ්‍රී සිද්ධාර්ථ පදනම සහ සිංගප්පූරුවේ Tan Ngak Buay and Kee Meng Lang Foundation Limited (Singapore) සංවිධානය සපයා තිබිණි. මෙම අවස්ථාව සඳහා 144 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්වී කොඩිතුවක්කු, ස්වාමීන් වහන්සේලා රැසක්ද, 144 වන පාබල බලසේනාවේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලුතිනන් කර්නල් ඒඑල්ආර්පී අමරසිංහ, රාජ්‍ය නිලධාරීන් හා යුද්ධ හමුදා නිලධාරී රැසක් ද සහභාගි වූහ.





# ගාල්ල විරු කැකුළු පෙර පාසලෙහි සංචාරයක්

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඉකුත් අගෝස්තු 23 වන දින එම ඒකකය වෙතින් පාලනය වන ගාල්ලෙහි පිහිටි විරු කැකුළු පෙර පාසලේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූවාය. එම අවස්ථාවට 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ හා උදේනි ජයරත්න මහත්මියද එක්වූහ. එහිදී, පෙර පාසල භාර නිලධාරිනිය වෙත එහි ඉදිරි අභිවෘද්ධිය උදෙසා අවැසි උපදෙස් හා මගපෙන්වීම ලබාදුන් සභාපතිනිය කුඩා දරුවන් සමග සුහද පිළිසඳරකද නිරත වූවාය.

# පනාගොඩ විරු කැකුළු පෙර පාසලෙහි සංචාරයක්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ඉකුත් අගෝස්තු 29 වන දින එම ඒකකය වෙතින් පාලනය වන පනාගොඩ පිහිටි විරු කැකුළු පෙර පාසලේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූවාය. එම අවස්ථාවට ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී හා හිමාලි පුස්සැල්ල මහත්මියද එක්වූහ. එහිදී, දරුවන් සමග සුහද පිළිසඳරක නිරත වූ සභාපතිනිය එම ඒකකය යටතේ එහි පවත්වාගෙන යන රූපලාවණ්‍යාගාරයෙහි කටයුතුද නිරීක්ෂණ කළාය.

# කොණ්ඩා මෝස්තර හා රූපලාවන්‍ය පාඨමාලාව

රූපලාවණ්‍යාගාරයන්හි රාජකාරීන්හි නිරත සෙබළියන් හට වෘත්තීය දැනුම වර්ධනය කරගැනීම හා නව තාක්ෂණය ඔස්සේ රූපලාවණ්‍ය කටයුතුවල නිරතවීමට අවැසි දැනුම ලබාදීමේ අරමුණින් සංවිධානය කෙරුණු කොණ්ඩා මෝස්තර හා රූපලාවන්‍ය පාඨමාලාවක් ඉකුත් ජූලි 12 වන දින සිට දින 11 ක් පුරා පැවතිණි. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ පූර්ණ අධීක්ෂණය හා මඟපෙන්වීම යටතේ වෘත්තීය කේශලාවණ්‍ය ශිල්පිනි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නයනමාලි ජයතුංග මහත්මිය හා මනාලියන් හැඩගැන්වීමේ සහ කේෂාලංකාර ශිල්පී ආචාර්ය අසංක මෙන්ඩිස් මහතා විසින් එය මෙහෙයවනු ලැබහ.



මෙම පාඨමාලාවෙහි සාර්ථක නිමාවක් සනිටුහන් කරමින් එම රූපලාවණ්‍ය පාඨමාලාව හැදෑරූ ශිල්පිනියන්ගේ හැකියාව ඇගයීම සඳහා පසුගිය අගෝස්තු 12 වන දින මැනිංටවුන් විවාහක නිවාස සංකීර්ණයේ Seva Vanitha Budget Centre හි පිහිටි Mini Banquet Hall හිදී සහතික ප්‍රදානෝත්සවය පවත්වන ලදී.



# දූ දරුවන් වෙනුවෙන් පරිත්‍යාගයක්



ඉදිරියේදී පැවැත්වීමට නියමිත ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයන්හිදී රණවිරු දූවා දරුවන් වෙත ලබාදීම සඳහා පාසල් බෑග් 60 ක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය වෙත ලබාදීමට පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි එරංගා හේවාවසම් මහත්මිය ඉකුත් අගෝස්තු 24 වන දින කටයුතු කරනු ලැබුවාය. මෙම අවස්ථාවට පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් කිහිපදෙනකු ද සහභාගී වූහ.



# කඹුරුපිටිය අභිමංසල 2 සුවසහන නිකේතනයෙහි සංචාරයක

ශ්‍රී ලංකා මාතෘ භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් තම කාය දානය ලබාදුන් කඹුරුපිටිය "අභිමංසල 2" සුවසහන නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන විරෝදාර රණවිරුවන්ගේ සුවදුක් බැලීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය පසුගිය අගෝස්තු 09 වන දින සංචාරයක නිරත වූවාය.



එම අවස්ථාවට උපසභාපතිනි ශිරෝමාලා කොඩිතුවක්කු මහත්මිය, 61 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ, රාගම රණවිරු සෙවණෙහි සේනාවිධායක බ්‍රිගේඩියර් එම්ඒඩීජේඩී ගුණතිලක ආර්එස්පී යූඑස්පී, කඹුරුපිටිය අභිමංසල 2 සුවසහන නිකේතනයේ සේනාවිධායක කර්නල් ඩබ්ලිව්ජීඑස්ඩීඑස් රාජකරුණායක ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් පිරිසක්ද සහභාගී වූහ.

මෙම සංචාරයේදී ප්‍රතිකාර ලබන රණවිරුවන් සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් ත්‍යාග පාර්සල් සහ සුවසහන නිකේතනයේ පරිහරණය සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ පරිත්‍යාගයක්ද සභාපතිතුමියගේ සුරතින් සිදුකරනු ලැබුවාය.

# පාන්ගොල්ල අභිමංසල 3 සුවසහන නිකේතනයෙහි සංචාරයක





ශ්‍රී ලංකා මාතෘ භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් තම කායදානය ලබාදුන් පාන්ගොල්ල අභිමංසල 3 සුවසහන නිකේතනයෙහි නේවාසිකව ප්‍රතිකාර ගනු ලබන විරෝදාර රණවිරුවන්ගේ සුවදුක් බැලීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය පසුගිය අගෝස්තු 17 වන දින සහභාගී වූවාය. එහිදී, නේවාසිකව ප්‍රතිකාර ලබන සියලුම රණවිරුවන් සමග සුහද කතාබහක නිරත වෙමින් ඔවුන්ගේ අවශ්‍යතාවයන් හා එම පවුලේ සාමාජිකයින්ගේ ගැටළු පිළිබඳවද සභාපතිනිය සොයා බැලුවාය. තවද, ඔවුන්ගේ මානසික සුවතාවය වැඩිදියුණු කිරීම උදෙසා සංගීත ප්‍රසංගයක්ද පැවැත්වීමටද ඔවුනට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් ත්‍යාග පාර්සල් පිරිනැමීමටද එම නිකේතනයේ පරිහරණයට අත්‍යවශ්‍යව තිබූ වීදුරු භාණ්ඩ පරිත්‍යාග කිරීමටද කටයුතු කෙරිණ. මෙම අවස්ථාවට පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එස්සී ඒකනායක ආර්එස්පී, අභිමංසල 3 සුවසහන නිකේතනයේ (පාන්ගොල්ල) සේනාවිධායක කර්නල් ඒඑච් විජේගුණවර්ධන ආර්එස්පී ඇතුළු නිලධාරීන් පිරිසක් ද සහභාගී වූහ.

# සේවා වනිතා මාසික සභා රැස්වීම

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ මාසික සභා රැස්වීම ඉකුත් අගෝස්තු 18 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පවත්වන ලදී. එහි සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ එම අවස්ථාවට සියලුම රෙජිමේන්තු නියෝජනය කරමින් සේවා වනිතා ශාඛාවන්හි සභාපතිනියන් සහභාගී වූහ. එහිදී, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය විසින් එම ඒකකයේ ඉදිරි සැලසුම් සහ යෝජිත ව්‍යාපෘතීන් පිළිබඳව දැනුවත් කරනු ලැබුවාය. විශේෂයෙන්ම ඉදිරි වර්ෂය සඳහා සෙබළ සුබසාධනය හා ඔවුන්ගේ පවුල්වල අභිවෘද්ධිය උදෙසා එම ඒකකය වෙතින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.



# ගජබා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව





ගජබා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ 14 වන වාර්ෂික මහා සභා රැස්වීම එම සේවා වනිතා සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අගෝස්තු 01 වන දින ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරි නිවසන පරිශ්‍රයේදී පැවැත්විණ. එම සේවා වනිතා ශාඛාවේ නව නිලධාරි මණ්ඩලයක් පත්කර ගැනීමද නුදුරේදී පැවැත්වීමට නියමිත සුබසාධන කටයුතු පිළිබඳවද එහිදී සාකච්ඡා කෙරිණ.

# සංඥා බලකා සේවා වනිතා ශාඛාව



පසුගියදා පැවති යුධ හමුදා පැරා ක්‍රීඩා තරඟ සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා සංඥා බලකායට අයත් රණවිරුවන් 7 දෙනකුගේ ජයග්‍රහණ අගය කිරීමට සහ ඔවුන්ගේ පවුලේ අය සඳහා ත්‍යාග පිරිනැමීමේ වැඩසහනක් ඉකුත් අගෝස්තු 03 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශෂිකා හේරත් මහත්මිය ඇතුළු එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් කිහිපදෙනකු ද සහභාගී වූහ.

# කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාව



කාලතුවක්කු හමුදා රෙජිමේන්තුව යටතේ රාජකාරී නියුතු සිවිල් සේවක මහතුන් හට වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අගෝස්තු 01 වන දින එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි චාමා වනසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. තවද මෙම අවස්ථාවට එහි රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඒඑස්එස් වනසිංහ ආර්එස්පී පීඑස්පී එන්ඩීයූ ද එක්විය.

# ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාව



ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාව වෙතින් සිදුකරනු ලබන සුබසාධක වැඩසටහන් තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් යුතුව නවතමයෙන් ඉදිකරන ලද "ඇට්ලන්ටා ප්‍රොඩක්ට්ස්" ("ATLANTA PRODUCTS") කුළු බඩු ව්‍යාපාරයේ ආරම්භක උත්සවය පසුගිය ජූලි 30 වන දින ගැමුණු හේවා රෙජිමේන්තු "පැරඩයිස්" දේශණ ශාලාවේදී පැවැත්විණ. මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලයේ සභාපතිනි කුමුදුනී ගුණසේකර මහත්මිය, අධ්‍යක්ෂිකා ජානිකී රාජපක්ෂ මහත්මිය හා ප්‍රදේශයේ ව්‍යාපාරිකයින් රැසක් ද, ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි රුචිනි ළමාහේවා මහත්මිය ඇතුළු එම සාමාජිකාවන්ද සහභාගී වූහ.

# සේවා බලකා සේවා වනිතා ශාඛාව



සේවා බලකා සේවා වනිතා ශාඛාව විසින් ජාතික රුධිර පාරවිලයන සේවය සමග එක්ව ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් අගෝස්තු 12 වන දින 2(සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේදී පවත්වන ලදී. 2(සේවා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ අණදෙන නිලධාරී සහ සෙසුනිලයින් විසින් මෙම ලේ දන්දීමේ වැඩසටහන පැවැත්වූ අතර, ලේ දන්දීම සඳහා පරිත්‍යාගශීලීන් 80කට අධික පිරිසක් සහභාගී වූහ. තවද, මෙම වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා කරන ලද සේවය වෙනුවෙන් එම පරිත්‍යාගශීලීන් හට සංකේත පිරිනැමීමක්ද සිදුකෙරිණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තුෂාරි වනිගසේකර මහත්මිය සහභාගී වූවාය.

# බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ මහ සභා රැස්වීම





2022 වර්ෂය වෙනුවෙන් පැවැත්වූ සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ මහා සභා රැස්වීම පසුගිය අගෝස්තු 27 වන දින එම සේවා වනිතා සභාපතිනි මනෝරී සලේ මහත්මිය සහ උප සභාපතිනි රජිනා ජයසූරිය මහත්මිය ඇතුළු සේවා වනිතා සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් පවත්වනු ලැබූහ. එහිදී, නව නිලධාරී මණ්ඩලයක් පත්කර ගැනීමද සංගමයේ ඉදිරි ක්‍රියාකාරකම් පිළිබඳව ද සාකච්ඡා කෙරිණ.

# විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු සේවා වනිතාවන්ගෙන් යාපනයේ දරුවන්ට පාසල් උපකරණ




විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායට අයත් යාපනය අර්ධද්වීපය තුළ රාජකාරී නියුතු දමිළ සෙබළුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් 27 දෙනකු හට පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූලි 24 වන දින පැවැත්විණ. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ මගපෙන්වීම යටතේ ජාතීන් අතර සංහිඳියාව සහ සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් මෙම මානුෂීය සත්කාරය සිදුකෙරිණ.

මෙම අවස්ථාව විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත්වූහ.

# පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාව



පොදුසේවා බලකා සේවා වනිතා ශාඛා සභාපතිනියගේ අදහසකට අනුව එම මූලයට අයත් නිලධාරී/සෙසුනිලයින්ගේ ගර්භනී තත්වයේ පසුවන භාර්යාවන්, නිලධාරිණියන් හා කාන්තා සෙබළියන් සඳහා පෝෂණ මළු ලබාදීමේ වැඩසටහනක් සහ අක්ෂි ආබාධ සහිත ළගම ඥාතීන් වෙත ඇස් කණ්ණාඩි බෙදාදීමේ වැඩසටහනක් පසුගිය ජූලි 29 වන දින එම රෙජිමේන්තු කොනොනි භෝජනාගාරයේදී පැවැත්විණ. තවද, එම වැඩසටහනට සමගාමීව යුද්ධ හමුදා ජනපදය තුළ පිහිටි සියලු රෙජිමේන්තු සහ ඒකකවල සහභාගීත්වයෙන් යුතුව අපේක්ෂා රෝහල සමඟ සම්බන්ධතාවයෙන් ලේ දන්දීමේ වැඩසටහනක්ද පවත්වන ලදී.



## පුතුකුඩිඉරිප්පු ඉදිරි ආරක්ෂක වළල්ලට පණදුන්

# විරුවකුගේ වතගොත...



සෙ/198852 ලාන්ස් කෝප්‍රල් අබේරත්න බංඩා
ඒඑම්බීජී පිඩබ්ලිව්පි
ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

මැදඋම්බර මැතිවරණ කොට්ඨාසයේ 806 මාංගොඩ ග්‍රාම නිලධාරී වසමට අයත් අංක 160/05, මාංගොඩ, මැද මහනුවර ලිපිනයේ විසූ අබේකෝන් මුදියන්සේලා බීරාහේනේ ගෙදර උක්කුබංඩාටත් තට්ටු ගෙදර බිසෝ මැණිකාටත් දාව බිහිවූ දරුවෝ අට දෙනෙක් වූහ. මුතුමැණිකා, සෙනෙවිරත්න බංඩා, කුමාරිහාමි, චන්ද්‍රා කුමාරි, යසෝ මැණිකා නම් වූ සොයුරු සොයුරියන් හට බාල සහෝදරයකු ලෙස 1988 ජූනි මස 13 වන දින අබේරත්න බංඩා මෙලොව එළිය දුටුවේය. කාලයාගේ ඇවෑමෙන් අබේරත්න බංඩාට බාල සොහොයුරියක් හා සොහොයුරකු ලැබුණි. ඔවුහු බංඩාර මැණිකා සහ විජේරත්න බංඩා නම් වූහ.

රණකාමය වනාහි සහජයෙන් ජාන උරුමයෙන් ගෙන එන ලද්දක් විනා පසුකාලීනව බලෙන් ඇතුළු කළ හැක්කක් නොවේ. ගොංගාලේගොඩ බංඩා, වීර කැප්පෙටිපොල වැනි දේශමාමක වීරවරුන්ගේ ජාන උරුමයෙන් සෙංකඩගලින් බිහිවූ අබේරත්න බංඩාගේ රණකාමයට, හැදී වැඩුණු පරිසරයෙන් උරුම වූ දේශප්‍රේමය මුසුවීම නිසා විරුවන් උපදවන තිඹිරිගෙයක් මහනුවර පමණක් නොව වැදූ දෙමාපියන් ද අද ඔහු නිසා ප්‍රණාම ලබයි.

"දැනුම දිනමින් මැදඋම්බරින් පෙරට" යන ආදර්ශ පාඨය පෙරටු කරගත් තෙල්දෙණිය, රඹුක්පොත ප්‍රාථමික විද්‍යාලය ගමේ අනෙක් දරු දැරියන් සමඟ පියමනින අබේරත්න බංඩා කිසි දිනක අඩබ්බරයකු නොවන බව ගුරුවරුන් හඳුනා ගත්තේ හැදෙන ගහ දෙපෙත්තෙන් හඳුනාගන්නට ගුරුවරයකු හට එතරම් අසීරු නොවන නිසාය. 1994 වර්ෂයේ ජනවාරි මස 20 වන දින රඹුක්පොත ප්‍රාථමිකයට ඇතුළත් වී 5 ශ්‍රේණිය දක්වා එහි උගත් ඔහු ප්‍රාථමිකයට සමුදී වර්ෂ 2000 දී නමදගල උඩවෙල කනිෂ්ඨ විද්‍යාලයට ඇතුළත් විය.

ඉගෙනුමට පමණක් නොව විෂය පරිබාහිර කටයුතුවලදී සහ පාසල තුළ සිදුවන සෑම සංවිධානාත්මක කටයුත්තකදීම ඔහු අත්‍යවශ්‍යයෙන්ම සිටිය යුතු විසල් චරිතයක් වූ බව ගුරු භවතුන්

හා පාසල් වියේ සමකාලීනයෝ අදටත් ආවර්ජනය කරන්නේ සෙනෙහසිනි. දස දෙනකුගේ කුස් පුරවන්නට ගත සවි දියකරමින් සිටි පියාටත්, ඔහුගේ සෙවණැල්ල මෙන් ළග හිඳිමින් ගෙදරදොර වැඩකටයුතු කළ මවටත් අබේරත්න බංඩා සහාය වූයේ පාසල නිම වූ විගස පැමිණ ඔවුන්ගේ කුඩා ගොවිපළේ වැඩ කටයුතුවලට උදව් කරමිනි. සම වයසේ කොල්ලන් පාසල නිම වී වෙල් දෙනිවල ක්‍රිකට් ගසන්නට එක්රැස් වූ නමුත් ඔහු තම පවුල නඩත්තු කිරීමට අපිරිමිත වෙහෙසක් දරන දෙමාපියන් වෙනුවෙන් යමක් කිරීමට වෙහෙසුණේය.

තටු සවි වූ කුරුලු පැටවුන් කැදැල්ල හැර ඉගිල යන්නේ ඔවුන්ගේ ලෝකයේ කුඩු සදන්නටය. ඉක්මනින්ම ජේජ්ෂ්ඨ සොයුරු සොයුරියන් ක්‍රමයෙන් පවුල අතහැර නික්ම යන්නට පටන් ගත්තෙන් ඉබේම පවුලේ ජේජ්ෂ්ඨ සහෝදරයාගේ භූමිකාව රඟදැක්වීමට ඔහුට සිදුවිය. සිය නැගණිය හා මලණුවන්ගේ සෙනෙහස ඉදිරියේ සලිත වූ අබේරත්න බංඩා ඔවුන්ට ලෝකයක් තනන්නට වෙහෙස විය.



ඔහු සමග පවුලේ සෙසු සාමාජිකයින්

ඒ යුද ගිනිදැල් ලක්මව වෙළාගෙන තිබූ අවදියයි. දේශයට ආදරය කළ තරුණ පිරිස් බොහෝ සෙයින් ආරක්‍ෂක අංශවලට එක්වන්නට වූහ. සිය ජාන උරුමයෙන් ගත ඌවනා සෑම රුහිරු බිඳුවකම වීරත්වය රැඳුණු අබේරත්න බංඩා සිය අවස්ථාව උදාවන තෙක් නොඉවසිල්ලෙන් බලා සිටියේය. මම "ආමි එකට යනවා". "මං අස්වීම් සහතිකය ගන්න ආවේ" විදුහල්පති එච්එම් මහින්දපාල හේරත් බණ්ඩාර මහතා නිහඬව තම මේසය ඉදිරියෙන් සිටගෙන සිටි තරුණයාගේ මුහුණ දෙස බැලුවේය. ඒ දිදුලන ඇස්වල රැඳි උද්‍යෝගය තදින් පියවුණු මුව මඬලෙන් ප්‍රකාශිත අධිෂ්ඨානය කිසිවිටෙකත් කෙලෙසවත් පසුබැස්විය නොහැකි බැව් ඔහුගේ වියපත් දෙනෙතට පෙනුණි. එසේම නොවෙනස් බැල්මෙන් නොවෙනස් ඉරියව්වෙන් නිහඬවම තමාගේ අවශ්‍යතාව ඉදුවන තෙක් තමා දෙස බලාසිටින තරුණයාගේ සිත වෙනස් කරන්නට නොහැකි යැයි මුල් ගුරුතුමාට හැඟී ගොස් තිබිණි.

"ඉඳගන්න පුතා ඔයාට අස්වීම් සහතිකය ලැබෙයි" දවසේ මුල්වරට අබේරත්න බංඩාගේ මුහුණේ සිනහවක් මෝදුවිය. ඉක්මනින්ම අවශ්‍ය ලියකියවිලි සකස් කරගත් අබේරත්න බංඩා දෙගුරුන්ගේ ආශිර්වාදයත් සහෝදර සහෝදරියන්ගේ හා සමීපතමයන්ගේ ආශිර්වාදයත් තැවීම 2008 මැයි මස 17 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය සේවයට එක්විය. එසේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එක්වූ ආධුනික සෙබළ අබේරත්න බංඩා විසින් සිය මූලික පාඨමාලාව හදාරනු ලැබුවේ 4 වන සන්නාහ සන්නද්ධ බලකා මූලස්ථානය ක්ලැපන්බර්ග් හි ආධුනික පාඨමාලා අංක 10 යටතේය.

සාර්ථකව පාඨමාලාව හදාරා නිමකළ සෙබළ අබේරත්න බංඩා ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට සම්බන්ධ වන්නේ 2008 සැප්තැම්බර් මස 12 දිනය. එතැන් සිට ඔහු ගිනි අවියට සේම කොළ සිරස්කයටත්, කාලවර්ණ හමුදා ලාංඡනවලටත් පෙම්බඳින්නට පටන් ගත්තේය. 2008 සැප්තැම්බර් මස 12 දින අඹේපුස්ස සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයට පය තැබූ අබේරත්න බංඩා ඇතුළු සෙබළ පිරිසට රෙජිමේන්තු මධ්‍යස්ථානයෙන් දින 07 ක නිවාඩුවක් ලබාදෙන්නේ ආධුනික සෙබළුන් අමන්දානන්දයට පත්කරමිනි. ලද ඉසඹුවෙන් සිය නිවස බලා ඉගිල ගිය ඔහු තමාට හුරුපුරුදු මංමාවත් දිගේ පිය නැගුවේ අතීතාවර්ජනයක යෙදෙමින් ප්‍රහර්ෂයක් මුවේ රඳවාගෙනය. තමා සොල්දාදුවකු වීම පිළිබඳ ස්වයං අභිමානයක් ඒ ප්‍රහර්ෂය තුළ ගැබව තිබුණි.

නිවාඩුව අවසානයේ පෙරලා කඳවුර වෙත යෑමට සැරසුණු අබේරත්න බංඩා එක්වරක් මුදල් පසුම්බිය අමතක වී ආපසු ගේ තුළට පැමිණියේය. නැවතත් මිදුලට බැසි ඔහු දෙවන

**"කිසිවිටෙකත් සතුරාට යටත් වන්නට සූදානම් නොවූ අබේරත්න බංඩා තුවාල ලබා වැටී සිටි සගයන් දෙස බලා තනිවම කුමක් හෝ මිමිනුවේය. තුවාල ලත් මිතුරන් ත්‍රස්තයන් අතට පත්වීමට ඉඩ තැබීම කිසිවිටෙකත් ඔහුට කළ හැක්කක් නොවීය. වහා ක්‍රියාත්මක වී අත්බෝම්බයක් සුරතට ගෙන එහි ආරක්‍ෂක මුදුව ඉවත්කර හැඬලය තදින් අල්ලාගත් අබේරත්න බංඩා නියමිත වෙලාව එනතුරු එන තෙක් තත්පර කිහිපයක් කල් මැරුවේය. අනතුරුව ඔහු මිටින් හැඬලය මුදාහැරියේ තමා වටකොට සිටි ත්‍රස්තයන් ඉලක්කකොට ගෙනය. පිපිරුමත් සමඟ දෙරණ සිපගත් අබේරත්න බංඩාගේ නිසල දේහය අසල ත්‍රස්ත මළසිරුරු තුනක් විය"**

වරත් ආපසු ගෙට ඇතුළු වූයේ තවත් කුමක් හෝ අමතක වූ බැව් පවසමිනි. උළුවස්සට වාරුවී පුතු දෙස විමසිල්ලෙන් බලා සිටි බිසෝ මැණිකාගේ විඥානයට කුමක් හෝ බාධාවක් තම දරුවාට ඇති බැව් දැනුනි.

"පුතේ ටිකක් ඉඳල යන්න... ගමනට බාධා වුනා නේද?" මඳ සිනහවකින් ඇගේ සිත සැනසූ අබේරත්න බංඩා මිදුලට බැස දෙවරක්ම ආපසු හැරී නිවස දෙස බැලීය. මේ යොවුන් සෙබළා පළමුව අනුයුක්තව සිටි 14 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව එවකට සිංහ පවුලේ නවතම සාමාජිකයා වූ 21 වන බළඇණිය වෙත අනුයුක්ත කරන ලද්දේ එහි "සී" කණ්ඩායමේ සාමාජිකයකු කරමිනි. ඒ 2008 දෙසැම්බර් මස 13 වනදාය.

අබේරත්න බංඩා අනුයුක්තව සිටි බළඇණිය එවකට ස්ථානගතව සිටියේ පුදුකුඩිඉරිප්පු ඉදිරි ආරක්‍ෂක වළල්ලේය. මානුෂීය මෙහෙයුමේ අවසන් අදියරට ළංවී තිබුණු ඒ අවධියේ රැපුන් අබිමුව තෙදින් ඔදවැඩී සිටි යුද්ධ හමුදා සෙබළුන්ගේ උපක්‍රමශීලී ප්‍රහාර හමුවේ බොඳවෙමින් පවතින ඊලාම් සිහිනය තවදුරටත් යථාර්ථයක් නොවන බව ත්‍රස්තවාදීහු වටහාගෙන සිටියෝය. ළඟ එන පරාජයේ වේදනාව විඳ දරා ගත නුහුණු කොටි ත්‍රස්තවාදීහු වියරුවෙන් මෙන් බර අවි මෙන්ම සුළු අවි යොදාගෙන ආරක්‍ෂක හමුදාව වෙත නොනවත්වා ප්‍රහාර එල්ල කරන්නට විය. එම ප්‍රහාරයන් හමුවේ නොසැලුනු 21 වන

බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ඉහළ මූලස්ථානයන් වෙතින් ලැබෙන නියෝග අනුව උපක්‍රමිකව මෙහෙයුම් දියත් කරමින් අඟලෙන් අඟල අඩියෙන් අඩිය සිය මව්බිමේ උරුමය තහවුරු කරගනිමින් ඉදිරියට ඇදෙන්නට විය. එම ගමනේදී සතුරාට දැඩි ලෙස හානි පමුණුවන්නට ද ඔවුන් සමත්විය.

මේ අතර "සී" කණ්ඩායමේ වැඩබලන නිලධාරී අණදෙන ගේ ක්‍රියාන්විත සැලැස්මකට අනුව අබේරත්න බංඩා ඇතුළු අටදෙනකුගෙන් සමන්විත කණ්ඩායම පුදුකුඩිඉරිප්පු යුද්ධ හමුදා ඉදිරි ආරක්ෂක වළල්ලට ඔබ්බෙන් පිහිටි ත්‍රස්තවාදීන්ගේ බංකර් පෙළක් අත්පත් කරගැනීමේ අභිප්‍රායෙන් ඉදිරි ආරක්ෂක වළල්ල තරණය කළේය. ඔවුන්ගේ කුඩා කණ්ඩායම පුද්ගල නාශක බෝම්බ සහ මර උගුල් සූක්ෂමව ඉවත් කරමින් බංකර් පෙළ වෙත නිහඬවම ඇදෙන්නට වූයේ සතුරා නොසිතූ මොහොතක ක්ෂණිකව විස්මිත ප්‍රහාරයක් එල්ලකර එම බංකර් පෙළ අත්පත් කරගැනීමේ අටියෙන් වුවත්, එය සිතූ තරම් ලෙහෙසි නොවන බව වටහාගත් ත්‍රස්තවාදීන් තම පිරිස් බලය තව තවත් එම බංකර් පෙළ වෙත යොමුකර උපක්‍රමිකව වටකරමින් ශක්තිමත් ප්‍රබල ප්‍රහාරයක් අබේරත්න බංඩාගේ කණ්ඩායම වෙත එල්ල කළෝය.

ත්‍රස්ත වෙඩි උණ්ඩයෙන් තුවාල ලැබූ සගයන් එකා දෙන්නා බිම ඇදවැටෙද්දී සිය අත රැඳි ගිනි අවියෙන් නොනවත්වා ප්‍රහාර එල්ල කරමින් සිය සගයන් ආරක්ෂා කරගැනීමට වෙහෙස වූ අබේරත්න බංඩා තමා සන්තකව තිබූ අවසන් පතරොම ද සතුරා වෙත මුදාහැර බිම දිගේ බඩගාමින් තුවාල ලත් සගයන්ගේ පතොරම් ද සොයන්නට විය. ඒ සටනක් නොදී මියයන්නට ඔහු තුළ තිබූ අකමැත්ත නිසාය. ක්‍රම ක්‍රමයෙන් වැඩිවන ත්‍රස්ත ප්‍රහාරය ඉදිරියේ තම කුඩා කණ්ඩායම දුර්වල වන බව දුටු අබේරත්න බංඩා අවසානයේ තම සහෘදයන් හා ලක්මව වෙනුවෙන් දැඩි තීරණයක් ගත්තේය. කිසිවිටෙකත් සතුරාට යටත් වන්නට සූදානම් නොවූ අබේරත්න බංඩා තුවාල ලබා වැටී සිටි සගයන් දෙස බලා තනිවම තුමක් හෝ මිමිනුවේය. තුවාල ලත් මිතුරන් ත්‍රස්තයන් අතට පත්වීමට ඉඩ තැබීම කිසිවිටෙකත් ඔහුට කළ හැක්කක් නොවීය. වහා ක්‍රියාත්මක වී අත්බෝම්බයක් සුරතට ගෙන එහි ආරක්ෂක මුදුව ඉවත්කර හැඬලය තදින් අල්ලාගත් අබේරත්න බංඩා නියමිත වෙලාව එනතුරු තත්පර කිහිපයක් කල් මැරුවේය. අනතුරුව ඔහු මිටින් හැඬලය මුදාහැරියේ තමා වටකොට සිටි ත්‍රස්තයන් ඉලක්කකොට ගෙනය. පිපිරුමත් සමඟ දෙරණ සිපගත් අබේරත්න බංඩාගේ නිසල දේහය අසල ත්‍රස්ත මළසිරුරු තුනක් විය.

ඒ අවසරයෙන් අනෙකුත් සාමාජිකයින් බංකරය සියතට ගත්තෝය. උපන් දේශය වෙනුවෙන් සිය දිවිකුසුම පූජාකළ නවත් අභීත රණවිරුවකු ලෙසින් ලාන්ස් කෝප්‍රල් අබේරත්න බංඩාගේ දේහය 2009 පෙබරවාරි මස 02 වන දින මාංගොඩ පොදු සුසාන භූමියේ දී පූර්ණ යුද්ධ හමුදා ගෞරවාචාර මධ්‍යයේ භූමදානය කළේ දේහයට ආචාර දක්වනු පිණිස පැමිණ සිටි සමීපතමයන් හා ඥාතීන්ගේ සිත්සතන් තුළ සැබෑ මිනිසකුගේ සැබෑ සොල්දාදුවකුගේ නික්මයාම ගැන කිසිදා නොමැකෙන ආත්මීය සටහනක් තබමිනි.

ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ 21 වන බළඇණිය සිය අභීත පුතුයාට පෙරලා ගෞරව දැක්වූයේ ඔහුගේ නිලය ලාන්ස් කෝප්‍රල් දක්වා උසස් කරමින් හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා සෙබළකු ලෙස සොල්දාදුවකුට ලැබිය හැකි උතුම්ම සම්මානය වන පරම "වීර විභූෂණය" ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති සහ සන්නද්ධ සේවාවන්හි සේනාධිනායක අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් හිමිගන්වන ලදී. එදා අබේරත්න බංඩා එකී සම්මානයෙන් පිදුම් ලැබුවේ වර්තමානයේ ජීවත්වන්නන්ගේ හදවත් තුළ සදාතනිකව ජීවත් වෙමිනි.


වර්ෂ 2009 ක් වූ පෙබරවාරි 02 වන දින මාංගොඩ පොදු සුසාන භූමියේදී මෙම වීර සෙබළාගේ දේහය පූර්ණ යුද්ධ හමුදා ගෞරව සහිතව මිහිදන් කරන ලද අතර, මව පියා ඇතුළු ඥාතීන් විසින් රට ජාතිය ආගම වෙනුවෙන් සතුරා ඉදිරියේ නොබියව සටන් කළ තම වීරෝධාර පුතණුවන්ගේ දේහය මිහිදන් කළ ස්ථානයේ ඔහු සිහිවීම පිණිස කුඩා ස්මාරකයක් ඉදිකරන ලදී.

*යුද්ධ හමුදා මූලස්ථානය මගින් ප්‍රකාශිත "උත්තමාචාරය" ග්‍රන්ථයෙන් උපුටා ගැනීමකි.*

# නිසට සෙවනක්



මැදවච්චිය කුඩාවැව ප්‍රදේශයේ පදිංචි අසරණ දෙදරු මවක් වන එච්ජ් ඉන්ද්‍රානි සෝමලතා මහත්මිය සහ පවුලේ අයවලුන් වෙනුවෙන් නවතමයෙන් ඉදිකරන ලද නිවස භාරදීම පසුගිය ජූලි මස 27 වන දින 211 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් එච්එම්සීපී විජයරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. මේ සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය විශේෂඥ වෛද්‍ය රංජිනී සෙනවිරත්න මහත්මිය සහ ඉංජිනේරු හා ව්‍යාපාරික තිලක් අලහකෝන් මහත්මා විසින් ලබාදෙන ලදී. මෙම නිවස ඉදිකිරීම සඳහා 211 වන පාබල බලසේනාව සහ 2(සේව) විජයබාහු පාබල රෙජිමේන්තු භටපිරිස් විසින් ශ්‍රමදායකත්වය ලබාදෙනු ලැබූහ.



# තෘප්තිමත් පවුල් ජීවිතයක් සඳහා
# මනෝවිද්‍යාත්මක අත්වැලක්



සටහන :-
ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක ගේ,
(මනෝවිද්‍යා උපදේශක)

පවුල යනු මව පියා ද දරුවන් යන කුටුම්බයේ එකතුවයි. එහිදී, එකිනෙකා විසින් ඔවුන්ගේ සිතුම් පැතුම් හා ආකල්ප ගැන මනා අවබෝධයක් පවුල තුළ තිබිය යුතුයි. එසේ නොවුනොත් "සතුට" යන්න හුදෙක් වචනයක් බවටම පත්වනු ඇත. මෙම සතුට තම පවුල තුළ නිර්මාණය කිරීම සඳහා පවුලේ සාමාජිකයින් සියලුදෙනාටම පැවරුණු වගකීමක් ඇත.

මව පියාගේ එකතුවෙන් නිවස තුළ යම් ආචාර ධර්ම පද්ධතියක් ගොඩ නැගිය යුතුයි. එය පිළිපැදීම ඔවුන් දෙපළ මෙන්ම දරුවන්ගේද වගකීම වනු ඇත.

උදාහරණයක් ලෙස ගතහොත් තමන්ගේ වැඩකටයුතු කරගත හැකි වයසේ දරුවන් සිටින පවුලක නම් තම තමන්ගේ වැඩ කටයුතු තමා විසින් කරගැනීම. ඒ තුළින් නිවසේ සියලුම වැඩ මව විසින් කිරීම නිසා මව ආතති තත්ත්වයකට පත්වීම මගහරවා ගත හැක.

තවද, පවුල තුළ එකිනෙකාගේ කාර්යභාරය පවුල් සාමාජිකයන් සියලුදෙනාම හඳුනාගෙන කටයුතු කළ යුතුය. එම කාර්යභාරය උදාහරණයක් ලෙස මෙසේ දැක්විය හැක. පවුලක දරුවන්ගේ කාර්යභාරය කවරේද? ළමා කාලයේ දරුවන්ගේ කාර්යභාරය වන්නේ තම ඉගනීමේ කටයුතු නිසියාකාරව කිරීමයි. ඒ තුළින් මවගේ පියාගේ මානසික සහනය මෙන්ම පවුල තුළ සතුට ඇති කිරීමට එය ඉවහල් වන බව නොඅනුමානය.

පවුලක පියාගේ කාර්යභාරයේ පවුලේ අයවලුන් සියලු දෙනාගේම ආරක්‍ෂාව, රැකවරණය ඔහු තුළින් බලාපොරොත්තු වන බව අවබෝධ කරගත යුතුය. මවගේ කාර්යභාරයේදී පවුල තුළ බැඳීම් ගොඩනැගීම සඳහා ඇයගෙන් ඉටුවිය යුතු ප්‍රධානතම කාර්යභාරය ලෙස දැක්විය හැක.

පවුලක එක් එක් පුද්ගලයන් සඳහා වෙන් වෙන් වශයෙන් කාර්යභාරයන් ඇති බව මෙසේ දැක්විය හැක. එමෙන්ම පවුලක් තුළ සාමාජිකයින්ගේ කුසලතා අඩු වැඩි වශයෙන් පැවතීම තෘප්තිමත් පවුල් ජීවිතයක් සඳහා බලපානු ඇත.

උදාහරණයක් ලෙස ප්‍රශ්ණ විසඳීමේ කුසලතාවය, තීරණ ගැනීමේ කුසලතාවය, දරාගැනීමේ කුසලතාවය, ආදරය කිරීමේ කුසලතාවය හා අරපිමැස්මෙන් ක්‍රියා කිරීමේ කුසලතාවය උඩයි. මෙම කරුණුවලට අමතරව මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය, අනියම් සබඳතා, නැන්දම්මා ලේලි ගැටුම් හා දෙමාපියන්ට පවුල තුළ නිසි තැන නොදීම යන කරුණුත්

පවුල් ජීවිතයේ සතුටට බලපානු ලබයි.

එමෙන්ම දීර්ඝකාලීන නොයෙකුත් රෝගී තත්ත්වයන්ගෙන් පෙළීම නිසා මානසික රෝග ඇතිවීම නිසාද පවුල තුළ සතුට අහිමි විය හැක. ආර්ථික අපහසුතා හේතුවෙන් පවුල තුළ සමගිය දෙදරා යාම සුලභව දක්නට ලැබෙන කරුණක් බව අප සියලුදෙනාට දක්නට ලැබෙන කරුණකි. එමෙන්ම මේ හේතුවෙන් සමාජය තුළ කොන්වීම හේතුවෙන් පවුල තුළ ගැටලු මතුවීම දැක්විය හැකි තවත් එක් ලක්ෂණයකි.

අප දීර්ග වශයෙන් පවුල යනු කුමක්ද ? එහි එකිනෙකාගේ වගකීම් කවරේද ? එම වගකීම තුළින් පවුලේ සතුට රඳාපවතින්නේ කෙසේද ? යන්න එමෙන්ම, පවුලක සතුට රඳාපැවතීම සඳහා බලපානු ලබන මනෝවිද්‍යාත්මක හේතුන් කුමක්ද ? අවබෝධ කරගන්නා ලදී.

එබැවින් ඉහත සඳහන් කරන ලද කරුණුවලින් පවුල් ජීවිතය රැකගැනීම සඳහා කැපවීම සහ වැඩකිරීම ඔබ සතු වගකීමක්. වගකීම පමණක් නොව වගවීමද ඔබගේ පවුල වෙනුවෙන් ඉටුකරන්න.

මෙම සියලුම කාරණා අතරතුර ඔබට හැඟියන්නේ නම් පවුලේ යම් සාමාජිකයකු මානසික අසහනයක් හෝ යම්කිසි මානසික රෝගයක් වැනි දෙයකින් පෙළෙන බව, කඩිනමින් මනෝවිද්‍යා උපදේශකයකු හමුවී අවශ්‍ය උපදේශනය සඳහා යොමුවන්න. නිරෝගීමත් පවුල් ජීවිතයක් සඳහා ඔබගේ වගකීම අවබෝධ කරගන්න.

පවුල් උපදේශනය පිළිබඳව සටහනක් තබන්නේ නම් පවුල තුළ පැන නගින විසඳාගත නොහැකි කුමන හෝ ගැටලුවක් සඳහා උපදේශනයක් ලබාගැනීම පවුල් උපදේශනය ලෙස හැඳින්විය හැක. එහිදී, දීර්ගකාලීන ගැටලුවලට විසඳුම් සෙවීමෙන් තොරව සිටීම නිසා පවුල් ජීවිත දෙදෙරා යාම දක්වා ගැටලුව වර්ධනය විය හැක. එබැවින් ඒ සඳහා නිසි පුහුණුව ලත් පවුල් උපදේශකවරයකු හමුවීම කළ යුතු නිවැරදි කාර්යය වේ. එමෙන්ම එහිදී ඔහු සමග විවෘතව කතා කිරීම සහ ඔහු විසින් ලබාදෙනු ලබන මගපෙන්වීම්වලට අනුව ක්‍රියා කිරීමද අත්‍යවශ්‍ය කරුණකි.

එසේ උපදේශන සේවාව ආරම්භවීමෙන් අනතුරුව උපදේශකවරයාට හැඟී යන්නේනම් උපදේශනය පමණක් ප්‍රමාණවත් නොවන බව, එවිට එම පවුලේ සාමාජිකයින් මනෝ වෛද්‍යවරයකු හමුවට පමුණුවාලීමද කරනු ලබයි. මානසික රෝග සඳහා ඖෂධීය ප්‍රතිකාර මෙන්ම මනෝ උපදේශනයක් යන කරුණු දෙකම එක හා සමානව ලැබිය යුතු යන්න මාගේ අදහසයි. එබැවින් තෘප්තිමත් පවුල් ජීවිතයක් සඳහා ඔබගේ වගකීම සහ වගවීම නොපමාව ඉටුකරන්න.



# ප්‍රේමය...

සදෙව් ලොව කැලඹිලා සොයනවා හැම තැනම
සක්දෙවිඳු කෝපයෙන් බලනවා තුන්ලොවම
දූතයන් යවනවලු තුන්ලොවම පීරන්න
දූ කුමරි නැතුව ඔහු හඬනවලු ශෝකයෙන්....

මට හිතැති දෙව් කෙනෙක් පැවසුවා විගසින්ම
සඟවන්න සඟවන්න ඔබේ කුමරි කඩිනමින්
දෙව් ලොවම කැලඹිලා නුඹේ පෙම නිසාවෙන්
සක්දෙවිඳු සොයනවලු ඔබ වියරුවී කෝපයෙන්...

දෙව්විමන හැර දමා මෙමා වෙත වඩින්නට
ඇය නමින් මනුලොවේ උමතු පෙම්බරා මමයි
අනේ සක්දෙවිඳුනේ කරුනු මැන මට කමා
සංසාර පුරුද්දට ඇයයි මගෙ මුළු ලොවම...

දෙව්ලොවත් මනුලොවත් ළඟා ලද ආත්මීය පෙම්වතුන් දෙදෙනකු පිළිබඳව මා තුළ හටගත් මනෝරාජික අදහසකි. අව්‍යාජ ප්‍රේමය පිළිබඳ මෙය කදිම නිදසුනකි.

- ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක



# සෙල්ලවසියා...



සටහන
ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ

1990 දශකය මුල් භාගය මඩකලපු දිස්ත්‍රික්කය තුළ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් බහුලව පැවති සමයකි. එනිසාම උදාවූ සෑම දිනක්ම එම ප්‍රදේශයන්හි කාලය ගෙවීයන්නට වූයේ අවිනිශ්චිත බව රජයමිනි. පාරිසරික දුෂ්කරතාවයද දරිද්‍රතාවයද පිරි එහි වැසියන්ගෙන් නිරතුරු දක්නට ලැබුනේ දවන හැඟීම් පිරි මුහුණුය. එම කාලවකවානුව වනවිට මා රාජකාරි කරන ලද්දේ මඩකලපුව "පන්කුනාවේලි" කඳවුරේය. 4 ගජබා රෙජිමේන්තුවට අයත්ව තිබූ එහි කඳවුරු භාර නිලධාරී වූයේ කපිතාන් ජයන්ත සුරවීර ය. මා හැරුණුවිට 2/ලුතිනන් විජේසිරිවර්ධන නම් තවත් නිලධාරියකුද එහි සිටියේය.

චෙංකලඩි නගරයේ සිට මහඔය බදුලු පාරේ (A-5) ඉලුප්පඩිච්චේන හන්දියෙන් දකුණට හැරී කිලෝමීටර් 07 ක් පමණ ගිය තැන පන්කුනාවේලි කඳවුර පිහිටා තිබුණි. කැළෑවෙන් වැසීගිය තරමක් උස් භූමියක වූ එම කඳවුර පිටතින් බලන කිසිවකුට හඳුනාගත නොහැකි ලෙස ඉදිකොට තිබීම විශේෂත්වයකි. කඳවුර වටා ඇති බංකර්, එහි අභ්‍යන්තර මාර්ග, සෙබළුන්ගේ වාසස්ථාන ඇතුළු සෙසු සියලු ඉදිකිරීම් නිමවා තිබුනේ එහි තිබූ අවට පරිසරයේ එකදු ලොකු කුඩා ගසකට හානි නොවන ලෙසය. සෞන්දර්යය හා සුන්දරත්වය අඩු නොවූවද මැරු වසංගතයද සර්පයින් ද පිරි එම කඳවුර ප්‍රදේශයේ පැවති අනෙකුත් හමුදා කඳවුරුවලට සාපේක්ෂව වඩාත් දුෂ්කර වූවකි.

තොප්පිගලට මායිම්ව පිහිටි එම කඳවුර අද්දරින් අතු ගංගාවක් ගලා ගිය අතර, ඒ හරහා බැඳි සොරොව්වක්ද ඊට සමාන්තරව ඉදිකළ ශක්තිමත් කොන්ක්‍රීට් පාලමක් ද තිබිණ. එහි තිබූ සොරොව්ව නිරතුරුව වසා තිබුණු අතර ගඟෙහි ජල මට්ටම ඉහළ නගිත්ම එය උතුරා යන්නට වනුයේ මනස්කාන්ත දසුන් මවමිනි. එවන් අවස්ථාවල කඳවුරේ ප්‍රයෝජනය සඳහා යහමින් මාළු අල්ලාගත හැකිවීම එහි සැමට විනෝදජනක විය. සොරොව්වේ ඉහළ කොටසේ සුලභව කිඹුලන් සිටි අතර, රාත්‍රී කාලයේ ටෝච් එළි දැල්වීමේදී කිඹුලන්ගේ රතු පැහැති ඇස් තැන තැන දිලිසෙන අයුරු දැකගත හැකිවිය. කඳවුරේ භටපිරිස් දියනෑම සඳහා සොරොව්වෙන් පහළ කොටස භාවිතා කළ අතර, එහි කිඹුලන් නොසිටියද දිය නෑමේදී අවි සහිත සෙබළු දෙදෙනක් ඒ අසල රැකවල්හි යෙදවීමටද කටයුතු කරන ලද්දේ වැඩි පරිස්සමටය. එවක මාහටද පිහිණීමට හැකියාවක් නොවූ බැවින් කඳවුර අද්දර එම අතු ගංගාව ඒ සඳහා තෝතැන්නක් විය. එවකට මාගේ සහයක ලෙස (Buddy) කටයුතු කරන ලද්දේ සුජිත් කරුණාරත්න නම් ආධුනික සෙබළෙකි. පොලොන්නරුව බැදිවැව ප්‍රදේශයේ පදිංචි අයකු වූ ඔහු මාගේ සෑම කටයුත්තකදී ලඟින් සිටි විශ්වාසවන්ත ක්‍රියාශීලී අයකි. ඉඩ ලද සෑම විටකදීම මා ඔහු සමග එහි පිහිණීමට මග පාදාගත් අතර පසුකාලීනව එම උත්සාහය මල්ඵල දැරිය.

පන්කුනාවේලි කඳවුරින් පිටත සියලු පාලන අවශ්‍යතා සිදුකෙරුණේ සතියකට වතාවකි. නිවාඩු හා අසනීප රපෝර්තු කරන සෙබළුන්ගේ යාමීම් කටයුතු ද ආහාර ද්‍රව්‍ය, බෙහෙත් ඇතුලු වෙනත් අවශ්‍යතා රැගෙන ඒමද සිදුකරන ලද්දේ එවැනි දිනවලදීය. නමුත් එකී සියලු කටයුතු ඉටුකිරීමට පෙර ප්‍රදේශයේ ආරක්ෂාව තහවුරු කිරීම අනිවාර්යය කරුණක් විය. විශේෂයෙන්ම මා සිටි කඳවුරේ සිට ඉලුප්පඩිච්චේන හන්දිය දක්වා වූ කිලෝමීටර් 7 කට ආසන්න දුර ප්‍රමාණය ලඳු කැළෑ, මඩ වගුරු, ඇළ පාරවල්, අතැරදැමූ ගඩොල් පෝරණු සේම සියගණන් කිරිගවයින් සිටි හරක් පට්ටිද සුලභ විය. ආවරණ සහිත එම භූමිය ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලට තෝතැන්නක් බැවින් කඳවුරෙන් පිටත අපගේ කටයුතුවලදී බෙහෙවින් ප්‍රවේශම් වීමට සිදුවිය. මද වැස්සකදී වුව ක්ෂණිකව යටවෙන එම ප්‍රදේශයේ



ක්‍රියාන්විත කටයුතුවල නියැලීම එවක අප මුහුණදුන් දුෂ්කරම අභියෝගය විය.

ඉලුප්පඩිච්චේන හන්දියේ සිට පන්කුනාවේලි දෙසට වූ අබලන් ගුරුපාරේ කිලෝමීටරයක් පමණ යන්ම පාර අද්දර වූ විශාල සියඹලා ගස් දෙකක් අසල කටුමැටි ගෑසූ කුඩා නිවසකි. කරත්ත රස්සාව සේම ගඩොල් පෝරණුවකද වැඩ කරමින් කිරි හරක් ගාලක්ද නඩත්තු කරමින් එහි තනිව දිවි ගෙවූ වයස අවුරුදු 60 කට ආසන්න අයකු වූ අතර හේ නමින් "සෙල්ලයියා" විය. එම පරිසරය තුළ සිංහල භාෂාව හැසිරවිය හැකි එකම පුද්ගලයා ඔහු පමණක් වූ බැවින් කඳවුරේ සැම අයකුම පාහේ ඔහු හා සබඳතා ගොඩනැගීමට ප්‍රියවූහ. නළල රැළිකොට දත් නොමැති මුවින් පාන ලෙන්ගතුකම් පිරි ඔහුගේ සිනහව කඳවුරේ සැම අයකුගේම සිත් ගත්තේය. සෙල්ලයියා කඳවුරේ කටයුතුවලට බොහෝ සෙයින් උපකාර කළ අතර ඔහුට ඊට නොදෙවෙනි ප්‍රතිලාභද පෙරලා කඳවුරෙන්ම ලැබිණ. විශේෂයෙන්ම "වෙංකලඩි" හි පිහිටි මූලස්ථාන කඳවුරේ සිට එළවළු, මස්, මාළු ආදිය යාබද ඉලුප්පඩිච්චේන කඳවුර තෙක් නිරතුරු ලැබුණද එතැන් සිට මා සිටි පන්කුනාවේලි කඳවුර දක්වා ඒවා රැගෙන ඒමේදී ප්‍රවාහන ගැටළු මතු වූ අවස්ථාවල සෙල්ලයියාගේ කරත්තය ඊට බොහෝ සෙයින් උපකාර විය.

එවක හමුදා සාමාජිකයන්ගේ මාසික වැටුප් අද මෙන් බැංකුගත නොවූ අතර, එය නෝට්ටු හා කාසි ලෙස අතටම හිමිවිය. ඒ සඳහා ඒකක වැටුප් භාර නිලධාරියකු හා කාර්ය මණ්ඩලයක් සිටි අතර ඔවුනගේ පූර්ණ වගකීම වූයේ ක්‍රියාන්විතයන්හි නිරත භටපිරිස් රැඳී සිටින ස්ථාන වෙතම ගොස් අදාල වැටුප් ගෙවීමයි. පන්කුනාවේලි කඳවුරෙහි මා සිටි කාලවකවානුවේ අපගේ වැටුප් ලැබුණේද ඒ අයුරෙනි. එවක මා අයත්ව සිටි ඒකක මූලස්ථානය මඩකලපුව "පූනානි" හි පිහිටා තිබූ අතර එහි වැටුප් භාර නිලධාරී වූයේ 2/ලුතිනන් සරත් ආරියරත්නයි. ඔහු එහි සිට මාසිකව මාගේ වැටුප් රැගෙන ඉලුප්පඩිච්චේන දක්වා පැමිණියද ඒ කිසි දිනක මා සිටි කඳවුරට පැමිණීමට අවස්ථාවක් නොලද්දේය. ඔහු එලෙස පැමිණෙන සැම විටකදීම පාහේ අප කඳවුරට ගමන් ගන්නා අතුරු මාර්ගය විවෘතව නොතිබූ අතර එහිදී, ඔහු මා හට අයත් වැටුප ඉලුප්පඩිච්චේන කඳවුර වෙත භාරදීමට කටයුතු කොට තිබිණ. පසුව මාර්ගය විවෘත කළ අවස්ථාවක පා ගමනින්ම එහි ගොස් මාගේ මාසික වැටුප ලබාගැනීමට මා විසින් ක්‍රියාකරන ලදී. එය බුලත්විටක් ආකාරයට වැටුප් පත්‍රිකාවෙන්ම ඔතා තිබූ අතර, නෝට්ටු කිහිපයක් අතරට එක්කළ මාරු කාසි කිහිපයක් ද එහි විය. මාගේ මතකයේ හැටියට එවක ලැබූ මාගේ මාසික වැටුප රු. 1200 ක් තරම් විය. එලෙස වැටුප් රැගෙන ඒමට ඉලුප්පඩිච්චේන කඳවුර වෙත ගිය සැම අවස්ථාවකදීම අතරමගදී සෙල්ලයියාවද මුණගැසී ඔහුගේ නිවස අද්දර වූ ආඩියා ළිඳෙන් වතුර උගුරක් බී යාමද එහි තිබූ සියඹලා ගසකින් කරලක් ඇහිඳගෙන යාමද මාගේ පුරුද්දකි. මේ සැම කටයුත්තකදීම අවියක්ද අතැතිව ආධුනික සෙබළ සුජිත් කරුණාරත්න නොවරදවාම මා සමීපයේ සිටියේය.

එක්තරා දිනෙක උදෑසන ඉලුප්පඩිච්චේන කඳවුර දක්වා වූ මාර්ගයේ ආරක්ෂාව තහවුරු කිරීමේ කටයුතුවල 2/ලුතිනන් විජේසිරිවර්ධන හා මා ඇතුළු භටපිරිසක් නිරතව සිටියහ. එහිදී සෙල්ලයියාගේ ගෙවල් සමීපයේ වූ වෙල් යායක් අද්දරදී අපහට මුහුණදීමට සිදුවූයේ නොසිතූ සිදුවීමකටය. එක්වරම යාබද ළඳු කැලෑවක සිටි දැවැන්ත වල් ඌරකු කලබල වී වෙල්යාය හරහා දිව එන්නට වීමය. ඉදිරියට නෙරා ආ ඇත් දළක් බඳු සුදු පැහැති විශාල දළක් ද සහිත එම ඌරා විශාල ප්‍රමාණයේ තද කලු පැහැයෙන් යුත් එකෙකි. ඌරා දිව ආ නියරෙහි පෙරමග වූයේ ලාන්ස් කෝප්‍රල් සිල්වා නමැති සෙබලකි. ඉමහත් සේ කලබලයට පත්ව සිටි එම සතා ඉදිරියට දිව එන අතරේ නියරේ සිටි ලාන්ස් කෝප්‍රල් සිල්වා බරපතල ලෙස ඇනුම් පහරකට ලක් කරන ලද්දේ ඔහුව වෙල මැදටම විසිකර හරිමිනි. එහිදී වහාම ක්‍රියාත්මක වූ සෙබලකු වල් ඌරාට වෙඩි තබන්නට වූ අතර එහිදී එම වෙඩි පහරවල් නොතකාම ඉදිරියට දිවගිය ඌ සෙල්ලයියාගේ නිවස අද්දර කැලෑ රොදක් තුළට වැදුනේය. අනතුරුව භටපිරිස් එකතුව එහි කළ සෝදිසියේදී වෙඩි වැදී මියගිය වල් ඌරාගේ සිරුර එහි වූ පඳුරක් තුළදී සොයා ගන්නා ලදී. අනතුරුව සෙල්ලයියාගේ කරත්තයට පැටවූ ඌරාගේ සිරුර සවස්වරුවේ කඳවුර කරා රැගෙනඒමේ වගකීමද ඔහුටම පැවරුවේය.

එදින සවස ඇඳිරි වැටෙන්නට ආසන්න වනතෙක්ම සෙල්ලයියා කඳවුරට නොපැමිණීම එහි භටපිරිස්වලට කුතුහලය දනවන්නක්

**එම පරිසරය තුළ සිංහල භාෂාව හැසිරවිය හැකි එකම පුද්ගලයා ඔහු පමණක් වූ බැවින් කඳවුරේ සැම අයකුම පාහේ ඔහු හා සබඳතා ගොඩනැගීමට ප්‍රියවූහ. නළල රැළිකොට දත් නොමැති මුවින් පාන ලෙන්ගතුකම් පිරි ඔහුගේ සිනහව කඳවුරේ සැම අයකුගේම සිත් ගත්තේය. සෙල්ලයියා කඳවුරේ කටයුතුවලට බොහෝ සෙයින් උපකාර කළ අතර ඔහුට ඊට නොදෙවෙනි ප්‍රතිලාභද පෙරලා කඳවුරෙන්ම ලැබිණ.**

විය. කඳවුර තුළ සිටි සැම අයකුම වල් ඌරා රැගෙන එන තෙක් පසුවූයේ නොඉවසිලිමත්වය. මේ අතර එහි සිටි සෙබළකු කඳවුරු ගේට්ටුව අසල වූ අට්ටාලයට නැග ඈත මාර්ගය දෙස බලා මහත් වූ උද්‍යෝගයෙන් කෑගසන්නට විය. "හරි හරි වැඩේ හරි ඈතින් හෙඩ්ලයිට් එකක් නම් වදිනව පේනව. ෂුවර් එකටම සෙල්ලයියා" හෙතෙම සිනහමුසුව කෑගැසුවේය. ඔහුගේ දැනුම්දීමත් සමගම එහි රැස්ව සිටි සැවොම පෙරමග බලාසිටිද්දී අඩ අඳුරේම කරත්තයද දක්කාගෙන කඳවුර දෙසට එන සෙල්ලයියා දැනගත හැකිවිය. එහිදී, වල් ඌරාගේ සිරුර කරත්තයෙන් බිමට බෑමට සෙබළුන් හතර පස් දෙනකුම අවශ්‍ය විය. ඌ එතරම්ම විශාල සතකු වූ අතර එවැනි ඌරකු එහි සිටි කිසිවකුත් ඊට පෙර දැක තිබුණේද නැත. කෙසේ හෝ අවසානයේ සෙල්ලයියා කඳවුරෙන් පිටත්වූයේ ඔහු වෙත ලද තුටු පඬුරු පාර්සලයක්ද සමගිනි.

සෙල්ලයියා පිළිබඳ වූ මතක සටහන් හැරුණුවිට පන්කුණාවේලි කඳවුර හා බැඳුණු තවත් සිද්ධි සමුදායක්ද පවතී. ඒවාද අතිශය දුලභ සේම රසවත්ය. ඒකක සංවත්සරයක් නිමිත්තෙන් සංවිධානය කෙරුණු විවිධ ප්‍රසංගයක් සඳහා මා සිටි කඳවුරේ භටපිරිස් වෙත වේදිකා නාට්‍යයක් ඉදිරිපත් කිරීමට උපදෙස් ලැබී තිබුණේද එම කාල වකවානුවේදීය. ඒ අනුව නාට්‍ය සඳහා

 අගෝස්තු 2022

පිරිසක් තෝරා ගැනුණු අතර, මා ද ඊට එක්විය. අපගේ නාට්‍ය පුහුණුකරු වූයේ 4 වන ගජබා රෙජිමේන්තුවේ සැරයන් ඒබට් ඉඩම්තොටය. ඔහු ඒ පිළිබඳ බොහෝ හැකියාවන් සහිත අයකි. හොඳින් හඳ පායා තිබූ රාත්‍රියක කඳවුර තුළ වූ එළිමහන් පෙදෙසක මා ඇතුලු තවත් සෙබළ පිරිසක් ඊට සහභාගී වූහ.

රාත්‍රී කාලයේ කඳවුර තුළ නාට්‍ය පුහුණුවීම් කටයුතු සිදුකිරීම එහි සිටි කාහටත් නැවුම් අත්දැකීමක් ගෙනදුන්නේය. ත්‍රස්තවාදී තර්ජන බහුලව පැවති වටපිටාවක විදුලිබල පහසුකම්ද නොමැතිව ලඳු කැළෑවක් අස්සේ හඳ එළියෙන් නාට්‍ය පුහුණුවීම ආශ්වාදජනක වූවකි. කෙසේ වුවද එම අතිශය සුන්දර අත්දැකීම ක්‍රියාන්විතයන්හි නියැලී අන් කිසිවකු ලැබුවාදැයි නොදනී. පුහුණුවීම් අතරතුර නාට්‍යයට ඇතුළත් සෑම චරිතයක්ම රඟපා පෙන්වමින් සැරයන්වරයා වෘත්තිය නාට්‍යකරුවකු පරිද්දෙන් සෙස්සන්ට ගුරුහුරුකම් ලබාදුන් අයුරු අදද මා මතකයට නැගෙයි. උඩුරැවුලක් සහිත සිහින් සිරුරකින් හෙබි සැරයන් ඒබට් බොහෝ ප්‍රියමනාප ගති ඇති සුන්දර චරිතයකි. කවි, ගීත, නාට්‍ය වැනි සාහිත්‍ය ඇසුරේම ගෙවූ ඔහු වැන්නකු ක්‍රියාන්විත බිමකදී සොයාගැනීම උගහටය. එම විෂය පිළිබඳ මුලසිටම උනන්දුවක් දැක්වූ අයකු නිසාදෝ කඳවුර තුළ ඔහු හා මා අතර ගොඩනැගී තිබුණේ සමීප සබඳතාවයකි.

ලුතිනන් මඩපාත එවක 4 වන ගජබා රෙජිමේන්තුවට අයත් යාබද කඳවුරක සිටි බණ්ඩාගාර නිලධාරියෙකි. එක්තරා දිනක එම නිලධාරීද ක්‍රියාන්විත අවශ්‍යතාවයක් මත තවත් කිහිපදෙනකු සමග අප කඳවුරට පැමිණියහ. නිරතුරු සිනහමුසුව සිටි ඉතා ලෙන්ගතු අයකු වූ ඔහු වැන්නකු එම කාන්තාර හුදෙකලා පරිසරයේදී මුනගැසීමම මහට ආශ්වාදයකි. එහි ගතකළ කාලසීමාවේදී සෑම දිනකම පාහේ සවස ඔහු අප සමග ක්‍රීඩා කරන්නටද එකතු විය. මේ අතර ව්‍යායාම කටයුතු කිරීම සඳහා යොදාගන්නා සිමෙන්තියෙන් හැදූ කායවර්ධන උපකරණ කට්ටලයක්ද එවක මා සතුව තිබිණ. සෑම දිනකම සවස නිලධාරී නිවස්නයේ පසෙක ඉන් ව්‍යායාම කිරීමේදී ලුතිනන් මඩපාතද මා සමග එක්විය. එසේම ගඟේ පිහිණීමටද මාළු ඇල්ලීමේ කටයුතු සඳහාද ඔහු එහි ගතකළ කෙටි කාලය තුළ සහභාගී වූයේය.

කඳවුර තුළ මාගේ නිවහන වූයේ පතරොන් තහඩු තුනහතරකින් වටකළ මඩුවකි. යකඩ ඇඳක් ලී පෙට්ටියක් හැරුණුවිට අන් යමක් එහි නොවීය. 2/ලුතිනන් විජේසිරිවර්ධනගේ කුටිය පිහිටියේද ඊට යාබදවය. ඔහු සතුව කුඩා කැසට් රෙකෝඩරයක් තිබූ අතර එහි නිතරම "නාමල් උඩුගම" ගේ දෙවන කැසට්පටයේ ගීත වාදනය වූවා මතකය. එසේම "සිරස" ගුවන්විදුලි නාලිකාව ආරම්භ කිරීමේ පර්යේෂණ විකාශය ඇරඹියේද එම කාලවකවානුවේදීමය. විවේක සැමවෙලාවකදීම ඇඳට වී එම ගුවන්විදුලියට කන්දෙදී ආධුනික සෙබළ සුජිත් කරුණාරත්නද ඒ අසල වාඩිවී සිටීම පුරුද්දකි.

මෙසේ දින සති ගෙවී ගියේය. මේ කාලවකවානුව තුළ උතුරේද සටන් ඇවිළී යන්නට විය. එහිදී, හදිසි ක්‍රියාන්විත අවශ්‍යතාවක් මත මා සමග සිටි 4 වන ගජබා රෙජිමේන්තු භටපිරිස්වලට උතුර බලා යාමට සිදුවූහ. ඒ අනුව එසේ ඔවුන් උතුර බලා යද්දී ඒ අඩුව පිරවීමට වෙනත් ඒකක වෙතින් භටපිරිස් එහි පැමිණි අතර, මා හටද මඩකලපු දිස්ත්‍රික්කයේම වෙනත් ප්‍රදේශයකට මාරුවීමට සිදුවිය.

එලෙස හුරුපුරුදු පන්කුනාවේලි පරිසරයෙන් මිදී පැමිණෙන අවසන් දිනයේ මා හට එම ප්‍රදේශයේ වූ බොහෝ හුරුපුරුදු මතක මගදමා එන්නට සිදුවිය. විශේෂයෙන්ම එහිදී සෙල්ලයියා සමග වූ සැමරුම් අත්හල නොහැකි තරමට හිතෙහි තැන්පත්ව තිබුණි. අවසන් දිනයේ පන්කුනාවේලි ප්‍රදේශයෙන් මා පිටත්ව එද්දී සෙල්ලයියා ගේ නිවස අද්දර වූ සියඹලා ගසෙන් අමු සියඹලා කරලක්ද කඩාගත් මා ඔහු සමග මොහොතක් කතා බහ කරන්නටද අමතක නොකළේය. බොහෝ කලක් කඳවුරේ යාවජීව සාමාජිකයකු පරිද්දෙන් සිටි සෙල්ලයියාට අපගේ නික්මයාම තදින් දැනෙන්නට විය. ප්‍රියයන්ගේ වෙන්වීමේ වේදනාව ජාතිභේද නොතකා සෙල්ලයියාගේ හදවතටද තෙත ප්‍රේරණයකොට තිබූ අයුරු එහිදී මම දුටුවෙමි. කරත්තයට බරවූ ඔහු අවසාන වතාවටද මා දෙස බලාසිටින්නට වූයේ ගිනිගත් යුදබිමෙහි මනුස්සකම් පිරි හදවත්වල නිගය කියාපාමිණි. අත මිටමොලවා ගත් අමු සියඹලා කරලද සමග අවසන් වතාවටද මම සෙල්ලයියා දෙස බැලීමි. අමු සියඹලා තරමටම ඔහුගේ මුහුණද ඇඹුල් වී තිබිණ.

ඉහත සිදුවීම්වලට මේ වනවිට වසර 29 ක් පමණ ගතවී ඇත. මෙම කතාවේ සඳහන් බහුතරයක් අද වනවිට ජීවතුන් අතර නොමැත. ලුතිනන් මඩපාත තොප්පිගල කාරවිකුලම් කඳවුරට එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයට සම්බන්ධ සිදුවීමේදී මිය ගියේය. එසේම පන්කුනාවේලි කඳවුරේ කඳවුරු භාර නිලධාරීව සිටි කපිතාන් ජයන්ත සුරවීරද පසුකාලයක කර්නල් වරයකුව සිටියදී විල්පත්තුව ප්‍රදේශයේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත්විය. එසේම සැරයන් ඒබට් ඉඩම්තොටද උතුරේ ක්‍රියාන්විතයකදී මියගිය බව පසුකාලයකදී මා හට අහම්බෙන් දැනගන්නට ලැබිණ. මාගේ සහයක ලෙස කටයුතු කළ ආධුනික සෙබළ සුජිත් කරුණාරත්නද මඩකලපුව පුනානි ප්‍රදේශයේදී මාර්ග සෝදිසි කිරීමේ ක්‍රියාන්විතයකදී එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයකින් මිය ගියේය. වල් ඌරාගේ ප්‍රහාරයට ලක්වූ ලාන්ස් කෝප්‍රල් සිල්වා පිළිබඳ නිශ්චිත තොරතුරක් නොදනී. ජීවතුන් අතර සිටිනම් ඔහු විශ්‍රාම ගොස් බොහෝ කල්ය. වැටුප් භාර නිලධාරී වූ 2/ලුතිනන් සරත් ආරියරත්න පසුකාලීනව කර්නල්වරයකු ලෙස යුද හමුදා රෝහලේ නිවාරණ වෛද්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කොට විශ්‍රාම ලැබිය. හික්කඩුවෙ පදිංචි අයෙකු වූ 2/ලුතිනන් විජේසිරිවර්ධන එම වකවානුවේම හමුදාවෙන් ඉවත්ව ඇති අතර වසර 29 තිස්සේ මෙතෙක් ඔහු කොහේ සිටීදැයි මා නොදනී.

යුදබිමේ ඉතිරි සොඳුරු මතක මැද වුවද හද දවාලන සුසුම් පිටවනුයේ ඉහත ලබැඳි සගයන් පිළිබඳ මෙනෙහිවීමෙනි. යුද්ධයේ අභාග්‍ය සම්පන්න ඉරණමට ගොදුරු නොවන්නට ඔවුනගේ තුරුණු දිවි තවමත් අප අතර රැඳෙනු නොඅනුමානය. වෙංකල්අඩි බදුලු මාර්ගය (A-5) අද වන විට පුළුල්කොට කාපට් අතුරා මනරම්ව දිස්වේ. මා සිටි පන්කුනාවේලි කඳවුර දෙසට තිබූ අතුරු මාර්ගයද නවීකරණය කොට ඇති අතර දෙපස භෞතික පරිසරයද සම්පූර්ණයෙන්ම වෙනස්ය. ටික කලකට ඉහතදී එහි ගිය මා හට එම පරිසරය දැකීමෙන් ඇතිවූයේ පුදුමයකි. කෙසේ හෝ මංසලකුණු නොමැති වුවද සෙල්ලයියාගේ නිවස පිහිටා තිබූ තැන සොයාගැනීමට හැකි වූයේ පෙරදා ඔහුගේ නිවස අද්දර වූ දැවැන්ත සියඹලා ගස් දෙක අදටද එහි දක්නට තිබීමෙනි. අද සෙල්ලයියා සේම ඔහුගේ නිවස තිබූ තැනක්ද එහි නැත. සෙල්ලයියා සිය කරත්තය ගැටගසා තිබූ සියඹලා ගසක් අදද ඉහළට එසවී ඇත්තේ බොහෝ විඩාබර බවකිනි. ගතවූ දශක තුනකට ආසන්න කාලය තුළ සිදුවූ කියාගත නොහැකි අපමණ කතාන්දර එහි ඇති සෑම කොළයක් ගානේම ලියවී තිබිණ.







# ආපදාවලට එරෙහි යුද්ධ හමුදා මෙහෙයුම්

පසුගිය දිනවල ඇදහැලුනු අධික වර්ෂාවත් සමග නල්ලතන්නිය - මස්කෙළිය ප්‍රධාන මාර්ගයේ ගමනාගමනයට බාධා එල්ලකරමින් කඩා වැටී තිබුණු පස් කන්දක් ඉවත්කිරීමට 11 වන සේනාංකයට අයත් 112 වන බලසේනාවේ භටපිරිස් සිය දායකත්වය ලබාදුන්හ. නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ සහයෝගය මත 112 වන බලසේනාව යටතේ ස්ථාපිත 19 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ භටපිරිස් විසින් පැය කිහිපයක් තුළ එම ව්‍යාපෘතිය නිම කරමින් මාර්ගය යථා තත්ත්වයට පත් කරනු ලැබූහ.

අයහපත් කාලගුණික තත්ත්වය මත ගිණිගත්හේන මහනුවර ප්‍රධාන මාර්ගය බගතුලුව ප්‍රදේශය නායයෑම් හේතුවෙන් ගමනාගමන කටයුතු සම්පූර්ණයෙන්ම අඩාල වූ අවස්ථාවේ මාර්ගයේ පස් ඉවත් කිරීම සිදුකරන ලදී. 112 වන පාබල බලසේනාවට අයත් 19 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව යුහුසුලුව කටයුතු කළහ.

අධික වර්ෂාපතනය හේතුවෙන් 61 වන පාබල බලසේනාවේ කඹුරුපිටිය මුලටියන මාර්ගයෙහි යම් යම් ස්ථාන ජලයෙන් යටවී තිබූ බැවින් කඹුරුපිටිය අදාපාන රෝහල වෙත පැමිණීමට සිටි රෝහල් කාර්ය මණ්ඩලය සහ රෝගීන් හට එහි පැමිණීමට නොහැකි විය. එම රෝහලේ අධ්‍යක්ෂකගේ ඉල්ලීමකට අනුව 613 වන පාබල බලසේනාධිපති ගේ මැදිහත්වීමෙන් භටපිරිස් විසින් එම සියලුදෙනාම රෝහලට හා නගරය වෙත ගමන් කිරීමට ප්‍රවාහන පහසුකම් ලබාදීමට කටයුතු කළහ.

අයහපත් කාලගුණික තත්ත්වය මත නුවරඑළිය හැටන් ප්‍රධාන මාර්ගය බ්ලැක්පූල් ප්‍රදේශයේ මාර්ගයට පස් කන්දක් කඩාවැටීම හේතුවෙන් ගමනාගමන කටයුතු සම්පූර්ණයෙන්ම අඩාල වූ මොහොතේ 112 වන බලසේනාවට අයත් 3(සේවා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් එම මාර්ගය නැවත යථාතත්වයට පත්කිරීමට එක්වූහ.



# කපිතාන් ඩෝසන් ඉංජිනේරුවා සහ ඩෝසන් කුළුණ



සටහන -:
මේජර් එම් පී සාලින්ද පීඑස්සී ශ්‍රීලකාහ
මාති 2 (මූලය කලමනාකරණ හා ප්‍රසම්පාදන)
ගවේෂණ විශ්ලේෂණ යෝජනා හා සංවර්ධන අංශය
ගවේෂණ සංකල්ප හා මූලධර්ම අධ්‍යක්ෂ මණ්ඩලය



කොළොම් පුරයෙන් මහනුවරට පිවිසෙන මාර්ගයේ 62 කි.මී කණුව අසල පිහිටා ඇති කඩුගන්නාවේ ඩෝසන් කුළුණ ඔබ නිතර දැක ඇති බවට සැක නැත. කොළඹ සිට මහනුවරට විහිදෙන මෙම මාර්ගයේ කඩුගන්නාවේ ගල විදපු තැනට නුදුරුව මෙම කුළුණ පිහිටා තිබේ. මධ්‍යම හා සබරගමු පළාත් දෙක වෙන්වන සීමාව ද මෙයයි. බ්‍රිතාන්‍යයන් විසින් මෙරට මාර්ග සංවර්ධන ක්‍රියාවලියට මුල්ම අඩිතාලම දැමුවේ ය. ඒ, 1818 උඩරට කැරැල්ල ඇති වූ පසු එවැනි කැරැල්ලක් යළි ඇතිවීම වැළැක්වීම සඳහා මෙන්ම කැරලි මර්ධන කටයුතු වලදී කොළඹ සිට හමුදා බලඇණි නුවර දෙසට ඉතා ඉක්මනින් යැවීම සඳහා මාර්ග ඉදිකිරීමේ අවශ්‍යතාවය ඉංග්‍රීසීන්ට තදින්ම දැනුනු නිසාවෙනි. බ්‍රිතාන්‍ය පාලකයින් විසින් මෙරට මාර්ග සංවර්ධන ක්‍රියාවලිය ආරම්භ කරන ලද්දේ මුහුදු බඩ ප්‍රදේශවල පමණක් මාර්ග පද්ධතියක් තිබූ යුගයක දී ය. ඒවා ද ඉතා අබලන් තත්වයේ වූ අතර එම මාර්ගවල නිතර ගමන් කළේ බඩු මළු ඔසවා ගෙන කුලී කරුවන් පිරිවරාගත් පල්ලැක්කි මත නැගී ගමන්කළ සංචාරකයන්ය.

"ලංකාවට පළමුවෙනුත්, දෙවෙනුවෙනුත්, තුන්වෙනුවෙනුත් අවශ්‍ය වන්නේ මං මාවත් ය" ඒ මෙරට 5 වන බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වූ ලුතිනන් ජෙනරාල් එඩ්වර්ඩ් බාන්ස් දැරූ මතය යි. 1820 දී ඔහු යුද බල කොටුවල සියලු ආදායම්, පාරවල් තැනීමට යෙදෙව්වේය. බාන්ස් ආණ්ඩුකාරවරයා "බලකොටුවලට වඩා ආරක්ෂාවටත්, වෙළඳාමටත්, පාරවල් ප්‍රයෝජනවත් වේය" යන අදහස පෙරදැරිව, මහා භාණ්ඩාගාරයෙන් මුදල් නොගෙනම කොළඹ සෑම නගරයක් හා සම්බන්ධ මාර්ග තැනූ බව සෝමදාස අබේවික්‍රම විසින් රචිත "ලක්දිව පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආණ්ඩුකාරවරු" යන ග්‍රන්ථයෙහි සඳහන්කර තිබේ. බාන්ස් ආණ්ඩුකාරවරයා විසින් මෙම මාර්ග තැනීමට හා පාලම් තැනීමට ඉංජිනේරුවරු මෙන්ම ලස්කිරිඤ්ඤ හමුදා භටයෝ ද යොදා ගන්නා ලදි. එසේම, පෑලියගොඩ සිට මහනුවර දක්වා මහාමාර්ගයක අවශ්‍යතාවය දැනුනු ආණ්ඩුකාර එඩ්වඩ් බාන්ස් විසින් බ්‍රිතාන්‍ය රාජකීය ඉංජිනේරු රෙජිමේන්තුවේ කපිතාන් ඩෝසන්ට එම කටයුත්ත වෙත කඩිනමින් අවධානය යොමුකරන ලෙස නියෝගයක් නිකුත්කරනු ලබන්නේ මේ අතරතුරයි. බ්‍රිතාන්‍යයන් විසින් මෙරට මාර්ග සංවර්ධන කටයුතු සඳහා දකුණු ඉන්දියාවෙන් ගෙන්වන ලද කුලී කම්කරුවන්ගේ ද සහාය නොඅඩුව ලබාගත් මෙම අවධිය ඉතාමත් කාර්යබහුල යුගයක් විය.

1819 දී බ්‍රිතාන්‍ය රාජකීය ඉංජිනේරු බලකායේ තම සේවය ආරම්භ කළ, කැප්ටන් විලියම්ස් ෆ්‍රැන්සිස් ඩෝසන් දක්ෂ යුද ඉංජිනේරුවෙකු විය. ඔහුගේ විස්මිත දැනුම යොදාගෙන කඩුගන්නාව ගල් පොත්ත විදිමින් සිංහලයන්

පුහුණුව පත්කරවී ය. විටෙක ඔහුගේ ඉංජිනේරු සැලසුම් වෙනත් ඉංජිනේරුවන් පවා පුහුණුවට පත් කරවන ලදී. කොළඹ නුවර මාර්ගය ඉදිකිරීමේ කටයුතු ආරම්භ වන්නේ ද ඩෝසන් ඉංජිනේරුවරයාගේ පූර්ණ අධීක්ෂණය යටතේ ය.

මහනුවර ප්‍රදේශය ඉතා ශීත දේශගුණික ප්‍රදේශයක් වන අතර, නිතර වාර්ෂාව පැවතීම මෙම මාර්ග ඉදිකිරීමට මහත් බාධාවක් වී තිබේ. එකල බොහෝ නිලධාරීන් මෙන්ම සේවකයන් ද මැලේරියා හා පාචනය ආදී රෝග වලින් පීඩිත විය. මේ අතර, කැප්ටන් ඩෝසන් ද වරක් රෝගාතුර වී එංගලන්තයට ගොස් ප්‍රතිකාර ලබාගෙන සුවය ලැබීමෙන් පසු නැවත ලංකාවට පැමිණ සුපුරුදු ලෙස තම රාජකාරි අරඹන ලදී. මෙම ඉංජිනේරුවරයා ඉතා සූක්ෂ්ම ලෙස ගල් පර්වත, කඳුහෙල්, දිය දහරා මැදින් මාර්ග ඉදිකිරීම් එවක ආණ්ඩුකාරවරයාගේ පැසසුමට පවා ලක්වූවා සේම, එවක ආණ්ඩුකාරවරයාගේ පෞද්ගලික ලේකම් ලෙස ද කලක් කටයුතු කළේය.

පසු කලෙක මැලේරියා රෝගයෙන් දුර්වල වී සිටි ඩෝසන් ඉංජිනේරුවරයාට පාචනය රෝගයත් වැලදී මහත් සේ දුර්වල විය. කොළඹ නුවර මාර්ගයේ වැඩ කටයුතු අවසන් වීමටත් පෙරම කැප්ටන් ඩෝසන් මිය ගියේ ය. මෙරට මහා මාර්ග ඉදිකිරීමේ දී බ්‍රිතාන්‍යයන් මුහුණ දුන් උවදුරු පිළිබඳ බ්‍රිතාන්‍ය ජාතික මේජර් ස්කිනර් විසින් රචිත "ලංකාවේ පනස් වසක්" නම් ග්‍රන්ථයේ විස්තර කෙරේ. ඩෝසන්ගේ මරණයෙන් පසු කොළඹ නුවර මාර්ගය ගල් දමා තලා බොරළු අතුරා වැඩ නිම කළේ ය.



කපිතාන් ඩෝසන්

1832 පෙබරවාරි 01 දා ආසියාවේ පළමු තැපැල් රථය කොළඹ සිට මහනුවර දක්වා ගමන් ඇරඹීම ඉතිහාස ගතවන දිනයක් විය. මෙම මාර්ගය ඉදිකිරීමට කැප්ටන් ඩෝසන් ඉංජිනේරුවරයාගේ මෙහෙවර වඩාත් ඉවහල් විය. ඩෝසන් මිය ගිය පසු ඔහුගේ සේවය ඇගයීම වස් ඔහුගේ හිතවතුන් හා මිතුරන් පවුම් 343 ක් එකතුකර කොළඹ - නුවර මාර්ගයේ අසීරුතම දුර්ගය වූ කඩුගන්නාව කඳු මුදුනේ ඩෝසන් කුළුණ බැඳූහ. එය මුහුදු මට්ටමේ සිට අඩි 1730 උසින් ඉදිකර ඇති අතර, එම කුළුණේ උස අඩි 125 කි.

මෙම කුළුණ ඉදි කිරීම සඳහා උස් වූ භූමියක් තෝරාගෙන ඇති අතර, මෙලෙස ඉදිකල කුළුණ පාමුල සිට ඉහලට විහිදෙන කැරකෙන ලෝහ තරප්පු පෙළ ඔස්සේ එහි මුදුනට නැගිය හැක. කුළුණ මුදුනේ තිබූ රසදිය සහිත විදුලි බුබුලක්, පසු කලෙක අලුත්වැඩියා කටයුත්තකදී ගලවා ඉවත් කර ඇත. කුළුණ පාමුල ශක්තිමත් පාදමක් සහිතව ඉදිකර ඇත. මෙම කුළුණ පාමුල නිර්මාණය කර ඇති සිහිවටන පුවරුවේ ඩෝසන් පිළිබඳ විස්තර හා ඔහු මිය ගිය දින වකවානුව ද සඳහන් වෙයි.

කැප්ටන් ඩෝසන් සිහිවීමට ඩෝසන් කුළුණ හැර තවත් එක් සිහිවටනයක් තිබේ. ඒ අඹේපුස්ස ඩෝසන් බංගලාව හෙවත් ඩෝසන් වාසයකල නිල නිවසයි. මාර්ග ඉදිකිරීමේ කටයුතු අවසන් වීමෙන් පසු සංචාරක බංගලාවක් ලෙස පැවති ඕලන්ද ගෘහ නිර්මාණ ශිල්පය අනුව ඉදිකර ඇති මෙම නිල නිවස අදවන විට අඹේපුස්ස තානායම ලෙස ප්‍රසිද්ධ වී ඇත.

# අණදෙන නිලධාරීන්ගේ සම්මන්ත්‍රණයක්





ශ්‍රී ලංකා යුද හමුදාවේ කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය රට තුළ පවතින ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා විසඳුම් සෙවීමට විශාල දායකත්වයක් ලබා දෙයි. එවන් පසුබිමක, දිවයින පුරා විසිරී ඇති කෘෂිකර්ම බළඇණිවල එම ගොවිපළවල පරිපාලන කටයුතු විසඳීමේ අරමුණින් අණදෙන නිලධාරීන්ගේ සම්මන්ත්‍රණයක් පසුගිය අගෝස්තු 12 වන දින කිලිනොච්චිය, අක්කරායන්කුලම්හි පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම බලකායේ 6 වන බළඇණියේ දී පැවැත්විණි. යුද්ධ හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ (DGFM) සහ රෙජිමේන්තුවේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති එම හමුවට අධ්‍යක්ෂ කෘෂිකර්ම හා පශු සම්පත් බ්‍රිගේඩියර් ඒකේ රාජපක්ෂ ආර්එස්පී ඇතුළු රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මාණ්ඩලික නිලධාරීන් රැසක්ද සහභාගී වූහ.



# ළමා ලෝකය සුන්දරයි

## (දරුවකුගේ මනෝසමාජීය වර්ධනය)



කර්නල් එම්පීපී පෙරේරා
(විශ්‍රාමික)

**ලෝකය සුන්දර තැනක් වන්නේ ළමයින් නිසාය...... වැඩිහිටියන් වන අප සැමටද සුන්දර ළමා කාලයක් පැවතුනි. සමාජයේ පවතින දුගී දුප්පත්කම් හෝ වත්පොහොසත්කම් වැනි වෙනස්කම් සුන්දර ළමා කාලයට අදාළ නැත. වැඩිහිටියන්ගේ අනාගත වස්තුව වන්නේ තම දරුවන්ය. දෙමාපියන් දරුවන් වෙනුවෙන් අනේක කැප කිරීම් කරති. ඔවුන් දරුවන්ගේ සැප සම්පත උදෙසා සියලු මිල මුදල් වැය කරති. තම දරුවන්ට හැකි උපරිම සැප සම්පත් ලබාදීම දෙමාපියන්ගේ ඒකායන අරමුණයි. ඔවුන් නිරෝගි දරුවන් ලෙස රැකබලා ගැනීමට දෙමාපියන් අපමණ වෙහෙසෙති. දරුවන් නිරෝගී විය යුතුයි. එය ශාරීරික වශයෙන් පමණක් නොවේ. දරුවන්ගේ මානසික සෞඛ්‍ය රැකගැනීමද ඒ හා සමානවම වැදගත් වේ. එබැවින් ළමා මානසික සෞඛ්‍ය පිළිබඳව අවබෝධයක් ලබාගැනීම සෑම වැඩිහිටියකුටම එකසේ ප්‍රයෝජනවත් වේ.**

ළමයින් අනාගතයේ වැඩිහිටියන්ය. ඔවුන් ප්‍රීතිමත් රටට දැයට ප්‍රයෝජනවත් අනාගත පුරවැසියන් වීමට නම් ඔවුන් සෞඛ්‍ය සම්පන්න හා සතුටින් සිටින අයවලුන් විය යුතුයි. ප්‍රීතිමත් ළමාවියක් ඔවුන්ට උදාකළ යුතුයි. දරුවන්ට ප්‍රීතිමත් ළමාවියක් උරුමකර දීමට නම් විවිධ වයස් මට්ටම්වලදී ළමයින්ගේ සිතුම් පැතුම් හා ක්‍රියාකාරකම් මොනවාදැයි වැඩිහිටියන් දැනසිටීම ඉතා වැදගත් වන්නේය.

දරුවකු උපතේ සිට වැඩිහිටිවිය දක්වා විවිධ වයස් කාණ්ඩ පසු කරයි. මෙම විවිධ අවස්ථාවලදී ඔවුන් බොහෝ වෙනස්කම් වලට භාජනය වීමටද ඒ හා සමානව සිදුවන්නකි. මෙසේ දරුවන් වෙනස් වන්නේ ඔවුන්ගේ ශාරීරික ප්‍රමාණයෙන් පමණක් නොවේ. එම වෙනස්කම් සිදුවන්නේ ඔවුන්ගේ ශරීර ප්‍රමාණයෙන් මෙන්ම ඔවුන් සිතන පතන හා ඉගෙන ගන්නා ආකාරවලින්ද බව බොහෝ විට වැඩිහිටියන්ට අමතක වන කරුණකි. ජීවිතයේ විවිධ වයස් මට්ටම්වලදී ළමයින් සිතන්නේ ඉගෙන ගන්නේ හා හැගීම් ඇතිකර ගන්නේ වෙනස් අන්දමටය. මේ පිළිබඳව අවබෝධයක් ලබා තිබීම වැඩිහිටියන්ට ඉතා වැඩදායකයි. ළමා මනස සෞඛ්‍යමත් යහපත් ආකාරයෙන් ගොඩනැගීම අත්‍යවශ්‍ය කරුණකි. ඊනැම දරුවකුගේ මානසික හා සමාජීය වර්ධනය ඔහුගේ ජීවිතයේ ඉතා වැදගත් කරුණකි. දරුවාගේ මෙම මනෝ සමාජය වර්ධනය උදෙසා උපකාරී වන ප්‍රධාන අවශ්‍යතා රැසකි.

01. රැකවරණය ලබාදෙන වැඩිහිටියන්ගේ ආදරයේ සුරක්ෂිත බව හා සැලකිල්ල. (love, security) responsive relationship

දරුවකුට වැඩිහිටියන්ගේ ආදරය නිතැතින්ම ලැබිය යුතුයි. දරුවන් වෙනුවෙන් ලබාදෙන ආදරය ඔහුගේ අහිමි කිරීම් වැඩිහිටියන් විසින් නොකළ යුතුයි. එය දරුවාගේ මානසික සෞඛ්‍යතාවයට තදබල ලෙස බලපාන කරුණකි. මෙහිදී දරුවාට හුදෙක් ආදරය කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. දරුවකුට ලබාදිය යුත්තේ ඔහු බලාපොරොත්තු වන ඔහුට

අවශ්‍ය විදියේ ආදරයකි.

02. යහපත් සෞඛ්‍ය තත්වය රැකගැනීම. (Primary Health Care)

කුඩාකල සිටම යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම දරුවාගේ කායික සෞඛ්‍ය මෙන්ම මානසික සෞඛ්‍යයටද ඉතා වැදගත් වේ. කුඩාකල සිටම සනීපාරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වීමද ප්‍රාථමික සෞඛ්‍ය පරීක්ෂණ සිදුකිරීමද යහපත් සෞඛ්‍ය පුරුදු හුරු කිරීම කළ යුතු වන්නේය.

03. ජීවිතයේ ලබන විවිධ අත්දැකීම් හා අත්විඳීම් තුළින් ඉගෙන ගැනීමට අවස්ථාව ලබාදීම. (Learning from life experience)

ළමයා ඉගෙන ගත යුත්තේ ජීවිතයේ විවිධ වයස් මට්ටම්වලදී ඔවුන් ලබන අත්දැකීම් හා අත්විඳීම් තුළිනි. එය මනා වැඩිහිටියකු නිර්මාණය කිරීමට බෙහෙවින් බලපාන කරුණකි. දරුවා කුඩා කල ලබන අත්දැකීම් වැඩිහිටියකු වශයෙන් ඔහුගේ පෞරුෂයට බලපාන බව ප්‍රකට මනෝවිද්‍යාඥ සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් තරයේ ඉදිරිපත් කළ මතයකි. දරුවන්ට ජීවිතයේ විවිධ අත්දැකීම් හා අත්විඳීම් ලැබීමට අවශ්‍ය කාලය හා අවකාශය ලබාදීම වැඩිහිටියන්ගේ යුතුකමකි. හුදෙක් අධ්‍යාපනය උදෙසාම වෙහෙසෙන කොටු වූ ජීවිත ගතකරන ළමයින්ට මෙම අත්දැකීම් ලැබෙන්නේ ඉතා අඩුවෙනි. එමෙන්ම සහයෝගය හා සහජීවනය එකිනෙකාට උදව් කිරීම වෙහෙස මහන්සි වීම අතින් වැඩ කිරීම දෙමාපියන්ගේ අගහිගකම් අමාරුකම් පිළිබඳ අවබෝධයක් ලබා තිබීම ආදී කරුණු ළමයින් අවබෝධ කරගන්නේ ඔහුගේ අත්දැකීම් හා අත්විඳීම් තුළිනි. ළමා මානසික සංවර්ධනය උදෙසා ඒවා බෙහෙවින් වැඩදායක වන්නේය.

04. ආත්මශක්තිය ආත්මවිශ්වාසය හා ආත්මාභිමානය ගොඩනගා ගැනීමට අවස්ථාව ලබාදීම. (Enhancing selfesteem)

ළමයකුගේ ආත්මශක්තිය ආත්මවිශ්වාසය හා ආත්මාභිමානය ගොඩනගා ගැනීමට අවස්ථාව හා නිදහස ලබාදීම ඉතා වැදගත් කරුණකි. පරිපූර්ණ වැඩිහිටියකු අපේක්ෂා කළ හැක්කේ එවිටය. දරුවා කුඩාකල සිටම තම අත්දැකීම් තුළින් ඉගෙන ගනී. ඒ සඳහා අවකාශ සැලසිය යුතුයි. දරුවාගේ ආත්මශක්තිය ආත්ම විශ්වාසය මෙන්ම ආත්මභිමානය වර්ධනය කිරීම උදෙසා දරුවාගේ ක්‍රියාවන් අගය කිරීම ප්‍රතිපලදායකය. මෙහිදී දරුවකු තනිව අගය කිරීමට වඩා අන්අය සමඟ ප්‍රසිද්ධියේ අගය කිරීම වඩාත් ප්‍රතිපලදායකය.

උදා :- තම නැසියන් ඉදිරිපිට පන්ති කාමරය තුළ ගුරුතුමිය/ගුරුතුමා විසින් පාසලේ උදෑසන රැස්වීමේදී විදුහල්පතිතුමා විසින් ගමේ පන්සලේ හාමුදුරුවන් විසින් ආදී වශයෙනි. එදිනෙදා ජීවිතයේදී දරුවන්ගේ ජයග්‍රහණ අත්විඳින විට ඒවා අන්අය ඉදිරියේ වටිනා වැදගත් අයවලුන් ලවා අගයකරවීම ඔවුන්ගේ මානසික සංවර්ධනයට බෙහෙවින් බලපාන කරුණකි. එසේම දරුවාගේ අගය කළ යුත්තේ ඔහු ජයග්‍රහණයෙන් ලද ප්‍රතිපලය නොවේ. එනම් අගය කළ යුත්තේ ජයග්‍රහණය උදෙසා ඔහු දරන ලද ඔහුගේ උත්සහයයි. ජයග්‍රහණයේදී මෙන්ම පරාජයේදීද දරුවා දිරිමත් කිරීම ඒ හා සමාන වැදගත් කරුණකි. පරාජය හෝ පසුබෑම නැවත ඉගෙනීමට ලැබූ ස්වර්ණමය අවස්ථාවක් බව දරුවාට ඒත්තු ගැන්වීමට ක්‍රියාකළ යුතුයි. පරාජය සෑම අවස්ථාවක්ම නැවත තවදුරටත් ඉගෙනීමට ලැබුණු අවස්ථාවකි.

ළමයින්ගේ මනෝ සමාජීය වර්ධනයට අයහපත් ආකාරයෙන් බලපාන සාධක

ළමයින්ගේ මනෝසමාජය වර්ධනයට අයහපත් ලෙස බලපාන කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමේදී ඒ සඳහා විශේෂයෙන් දරුවන් අතර, වයස් පරතරය බලපාන කරුණකි. වසර 03 ක් වැනි කෙටි කාලයක් තුළදී දරුවන් දෙදෙනකු බිහිකරන මවකට මෙවැනි තත්ත්වයකට බෙහෙවින් මුහුණදීමට සිදුවිය හැක. අලුතින් උපන් කුඩා දරුවා කෙරෙහි මවගේ වැඩි සැලකිල්ල යොමුවීම එවැනිම කුඩා වයසක පසුවන අනෙක් දරුවාට අයහපත් මානසික තත්වයක් ඇති කිරීමට හේතුවනු ඇත.

එසේම ඕනෑම පවුලක් තුළ පැවතිය හැකි දෙමාපිය අඩදබර, දෙමාපියන් විදේශගත වීම, දෙමාපියන් දික්කසාද වීම, දෙමාපියන් වෙන්ව සිටීම, දරුවා කෙරෙහි සැලකිල්ලක් නොදැක්වීම, අඩුවෙන් සොයා බැලීම පියා හෝ මව මද්‍යසාර හෝ මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවීම අසහනකාරී අසංවිධාන පවුල් පසුබිම මෙන්ම ගර්භණී කාලයේ අවට පරිසරය තුළ පවතින නොසන්සුන්කම, අඩදබර ආදිය ළමයකුගේ මනෝසමාජය සංවර්ධනය උදෙසා අහිතකර ලෙස බලපාන බව සොයාගෙන ඇත.

වැඩිහිටියකු යනු නියමිත වයස් ප්‍රමාණය සම්පූර්ණ කළ ජීවිතයේ ස්වාධීනව කටයුතු කළ හැකි පුද්ගලයෙකි. එවැනි ස්වාධීනව කටයුතු කළ හැකි පරිපූර්න වැඩිහිටියන් බිහිකිරීම උදෙසා නියමිත වයස් කාණ්ඩවලදී ළමයින්ගේ මනෝ සමාජයීය වර්ධනය බෙහෙවින් උපකාරී වේ.



## හිසට සෙවණක්

14 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු බලප්‍රදේශයේ පිහිටා ඇති මණ්නකන්ඩාල් ග්‍රාමසේවා වසමට අයත් වසන්තිපුරම් ග්‍රාමසේවා වසමේ ජීවත්වන දිළිඳු පවුලක් සඳහා නව නිවසක් සාදා ඉකුත් අගෝස්තු 10 වන දින භාරදෙන ලදී. 641 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩීපීජේසී ජයවර්ධන යූඑස්පී ගේ මගපෙන්වීම යටතේ 14 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ භටපිරිස් ඊට ශ්‍රම දායකත්වය දැක්වූහ.



# ක්‍රීඩා විත්ති



## කවපෙත්ත විසිකිරීමේ ඉසව්වෙන් මව්බිමට රිදී පදක්කමක්

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ පැරා මළල ක්‍රීඩක කෝප්‍රල් පාලිත බණ්ඩාර එංගලන්තයේ බර්මින්හැම්හිදී පැවැති පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල - 2022 හි කවපෙත්ත විසිකිරීම F42-44/61-64 ඉසව්වේ මීටර් 44.20 ක දුරක් වාර්තා කරමින් එහි රිදී පදක්කම දිනාගනු ලැබීය.

## හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් රිදී පදක්කමක්




ඉකුත් ජූනි 09 වන දින පැවති ජාතික කණිෂ්ඨ මළල ක්‍රීඩා උළෙලෙහි පැවති වයස අවුරුදු 23 න් පහළ හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් දෙවන ස්ථානය හිමිකරගනිමින් රිදී පදක්කම දිනාගැනීමට 2(සේවා) ගජබා රෙජිමේන්තුවේ සෙ/ජී102696 පාසෙ ඇන්තනී කේම්ප් සමත්විය.

## කොරියානු තානාපති ටයිකොන්ඩෝ ශූරතාවලිය

දිවයිනේ ප්‍රමුඛ පෙළේ ක්‍රීඩා සමාජවල සහභාගීත්වයෙන් අගෝස්තු මස 2 වන දින සිට 4 වන දින දක්වා මහරගම ජාතික තරුණ සේවා සහා ගෘහස්ත ක්‍රීඩාංගණ පරිශ්‍රයේදී "කොරියානු තානාපති ටයිකොන්ඩෝ ශූරතාවලිය" ආරම්භ කෙරිණි. මෙම තරගාවලියේදී යුද්ධ හමුදා ටයිකොන්ඩෝ ක්‍රීඩකයින් "Sprain iy Aerobic" ඉසව් යටතේ තරග වැදී පිරිමි සහ කාන්තා කාණ්ඩවල රන් පදක්කම් 03 ක්, රිදී පදක්කම් 08 ක් සහ ලෝකඩ පදක්කම් 06 ක් දිනා ගැනීමට සමත්වූහ.



# පළමු පෙළ එක්දින සීමිත පන්දුවාර ක්‍රිකට් ශූරතාවලිය - 2022

ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය විසින් සංවිධානය කරන ලද පළමු පෙළ එක්දින සීමිත පන්දුවාර ක්‍රිකට් ශූරතාවලිය - 2022 අවසන් මහා තරගය ඉකුත් අගෝස්තු 02 වන දින SCC ක්‍රීඩා පිටියේදී පැවැත්විණ. මෙම තරගාවලිය "ඒ" සහ "බී" වශයෙන් දීප ව්‍යාප්ත කාණ්ඩ දෙකක් යටතේ පැවති අතර, යුද්ධ හමුදා ක්‍රීඩකයෝ එහි "බී" කාණ්ඩය යටතේ තරග වැදුනහ. එහිදී, 'Tamil Union CC' කණ්ඩායම සමඟ පැවති අවසන් මහා තරගයේ අනුශූරතාවය දිනාගැනීමට යුද්ධ හමුදා ක්‍රීඩා කණ්ඩායම සමත් විය.



# අන්තර් රෙජිමේන්තු පැරා වෙරළ වොලිබෝල් තරගාවලිය



ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් පවත්වනු ලැබූ යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු පැරා වෙරළ වොලිබෝල් තරගාවලියේ ශූරතාවය ශ්‍රී ලංකා පාබල හමුදාවේ ක්‍රීඩකයින් විසින් දිනාගනු ලැබූහ. තරගාවලියේ අනුශූරතාවය යුද්ධ හමුදා විශේෂ බලකායේ ක්‍රීඩකයින් සහ දෙවන අනුශූරතාවය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ ක්‍රීඩකයින් විසින් දිනාගනු ලැබූහ. ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය වෙතින් සංවිධානය කරනු ලැබූ යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු පැරා වෙරළ වොලිබෝල් තරගාවලිය ඉකුත් ජූලි මස 23 සහ 24 දෙදින තුළ පනාගොඩ 1 වන ක්ෂේත්‍ර ඉංජිනේරු බලකා පරිශ්‍රයේ කෘත්‍රිමව සකස් කරන ලද වෙරළ වොලිබෝල් පිටියේදී පවත්වන ලදී. මෙම වෙරළ වොලිබෝල් තරගාවලිය යුද්ධ හමුදාවේ 23 අන්තර් රෙජිමේන්තු පැරා තරගය 2022 සමගාමීව පවත්වන ලදී.

# 35 වැනි ලෝක Sepak Takraw ශූරතාවලියේදී යුද්ධ හමුදා පා පන්දු ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජය





"35th World Sepak Takraw Championship ශූරතාවලිය" ඉකුත් ජූලි මස 24 දින සිට අගෝස්තු මස 01 දින දක්වා තායිලන්තයේදී පැවති අතර එම ශූරතාවලිය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූ යුද්ධ හමුදා පාපන්දු ක්‍රීඩක ක්‍රීඩිකාවන් ස්විට්සර්ලන්තය, බ්‍රසීලය, පාකිස්තානය සහ ඉරාකයේ පාපන්දු කණ්ඩායම් පරාජය කරමින් සිය ජයග්‍රහණය තහවුරු කරගනු ලැබූහ. මෙම තරගාවලිය සඳහා පාපන්දු ක්‍රීඩකයින් 04 දෙනෙක්, ක්‍රීඩිකාවන් 05 දෙනෙක්, කණ්ඩායම් කළමනාකරු සහ පුහුණුකරු සහභාගී වූහ. යුද්ධ හමුදා පාපන්දු කමිටුවේ සභාපති වශයෙන් පිරිස් පාලන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේවීයූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී කටයුතු කරන ලදී.

# බර ඉසිලීමේ තරඟාවලියෙන් ලෝකඩ පදක්කමක්







එක්සත් රාජධානියේ බර්මින්හැම් ප්‍රදේශයේ පැවැත්වුණු "පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල - 2022" හි බර ඉසිලීමේ තරඟාවලියේ කිලෝග්‍රෑම් 55 බර පන්තිය නියෝජනය කරමින් සහභාගී වූ 2 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ කෝප්‍රල් වයිඩීඅයි කුමාර ඉකුත් ජුලි 30 වන දින එම ඉසව්වේ ලෝකඩ පදක්කම දිනාගැනීමට සමත්විය.

# යුද්ධ හමුදා පැරා ගෘහස්ථ ඔරු පැදීමේ ශූරතාව ශ්‍රී ලංකා පාබල හමුදාවට




යුද්ධ හමුදා පැරා ක්‍රීඩා උළෙලට සමගාමීව පැවති අන්තර් රෙජිමේන්තු පැරා ගෘහස්ත ඔරු පැදීමේ තරඟාවලියේදී ශ්‍රී ලංකා පාබල හමුදා මූලස්ථාන බළඇණියේ ඔරු පැදීමේ කණ්ඩායම විසින් එම තරඟාවලියෙන් ප්‍රථම ස්ථානය දිනාගන්නා ලදී. විජයබාහු පාබල රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ සහ විශේෂ බලකා මූලස්ථාන බළඇණියේ ඔරු පැදීමේ කණ්ඩායම් එහි අනුශූරයන් බවට පත් වූහ. පනාගොඩ යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසලේදී පසුගිය 19 වන සහ 20 වන දිනවලදී පවත්වන ලද මෙම තරඟාවලිය සඳහා රෙජිමේන්තු මූලස්ථාන බළඇණි 7ක් නියෝජනය කරමින් කණ්ඩායම් හා යුගල වශයෙන් මානුෂීය මෙහෙයුමේදී විවිධ ආබාධිත තත්ත්වයන්ට පත් වූ රණවිරුවෝ 29 දෙනකු තරඟ කළහ.

# පැරා බැඩ්මින්ටන් තරඟාවලියේ ශූරතාවය ගජබා රෙජිමේන්තුවට






යුද්ධ හමුදාවේ "23 වන අන්තර් රෙජිමේන්තු පැරා ක්‍රීඩා තරඟාවලිය - 2022" ට සමගාමීව ගැමුණු හේවා බලකා රෙජිමේන්තු මූලස්ථාන බලඇණිය විසින් සංවිධානය කරන ලද අන්තර් රෙජිමේන්තු පැරා බැඩ්මින්ටන් තරඟාවලිය ඉකුත් ජුලි මස 14 සහ 15 යන දිනයන්හිදී පනාගොඩ ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පවත්වනු ලැබීය. එහිදී, තරඟාවලියේ ශූරතාවය, රන් පදක්කම් 03ක්, රිදී පදක්කමක් සහ ලෝකඩ පදක්කම් 03ක් හිමිකර ගනිමින් ගජබා රෙජිමේන්තු කණ්ඩායමේ ක්‍රීඩකයින් විසින් හිමිකරගනු ලැබූ අතර, එහි අනුශූරතාවය විජයබාහු පාබල රෙජිමේන්තුවේ ක්‍රීඩකයින් විසින් දිනාගනු ලැබූහ.




## ආදරේ ඔබයි මට...

ගතේ වෙහෙසට මලක් පස්සට
ඉන්නැයි කියා ඔබ තවමත් වැඩ හරියට
කරන වඩා තොග මහ පර්වත ගානට
කරන්නේ දවසට කාසි නැතුව

ගතේ වෙහෙසට රිදුම් දෙන කොට
කඳුලු හංගා සිනාසෙන විට
ඔය තරමට හිතේ හයිය ආවේ කොහොමද ඔබට
වෙහෙස නැතිදෝ මේ ගෙවුණ කාලෙට

මා ඉහළට ජීවිතේ පඩි නගින කොට
ලෝකයම අත්පොළසන් ගසුවට එලක් නැත මට
මා පඩියක් නැගගානම් අද ඒ ඔබ දුන් හුස්මට
කවුරු නැතත් ඔබේ අත්පොළසන් ඇති මට

රිසිසේ අහසේ සරන්නට තටු දුන්නට
තවමත් හයිය ඔබයි අත්තටු දෙකට
කැමති ඔබ ජීවිතෙම රැඳෙනවට
අකුරු අනක බැඳි ආදරේ ඔබයි මට

ඉසුරි ඉඳුවරී කුමාරි
හෝමාගම

## නුඹේ මතකය...

ලය මඬල පසාරු කරගෙන
රිදුම් දෙවී නුඹේ මතකයන්
මැරී මැරී ජීවත් වෙමි
නුඹ නමින් සදාකාලිකව

සෙ/2එල්00815
කෝප්‍රල් චතුර කුමාර පීජීඑන්
2(සේවා) ශ්‍රීලංරෙජි

## ගුරුවරයා...

ගුරුවරු දෙවිවරු වගේ
තමයි මටං
හැබැයි ඒ දෙවිවරු අතරේ
තමන්ගේ වියුණෙන් එකට
එන්නේ නෑ කියලා
ඉස්කෝලෙදී ළමයි කොන් කරන
පන්ති ගුරුවරුත් නැතුවාම නොවෙයි

සෙ/164737
තුසෂ පුෂ්ප කුමාර එආර්කේ
4 රෙජි ශ්‍රීලංකාහ

## වෙස් මාරුව...

ලෝකය බිහිවූ දා පටන්
මිනිසුන් සිටියා බොහොම තරම්
ලෝකය හමුවේ පෙන්වන සුදුරුව
කලු බව දැනුණේ කල්පයකින් පසු

ඇත්ත ඇත්ත ලෙස නොදකින මිනිසුන්
ඇත්ත බොරුව කරලා පෙන්වයි
බොරුව ඇත්ත කරලා පෙන්වයි

මේ වගේ මිනිසුන් නැත කෙදිනකවත්
දිව්‍ය විමන්වල වසන්නේ
ඔවුනට යන්නට අපාය නිරයත්
තවත් හැදෙයි මේ ලෝක තලේ

සෙ/6ආර්00478
කෝප්‍රල් ජයසේන ආර්ඩබ්ලිව්
රෙම ශ්‍රීලංකාව

## සංකල්පනා...

කාලයේ වැලි තලාවෙන්
දිනෙන් දින වියැකී යන මුත්
දණින් වැටුණු ජාතිය
වෛර දුරා ගොඩ කරනු මිස අදිටන්
පාගා මිරිකා දමයි නම් එම ජාතියම
වියැකී යයි ලොවින් සදහට
මතුයම් දිනක නොමිනිසුන් එක්ව
සියතින් ගෙල වැල දමා මියැදුනා යැයි
පෙරලමින් අලුත් පිටුවක්
සිවි හෙළේ වංශ කතාවක

සෙ/ජී100971
ලා/කෝ කුලරත්න එස්ඩබ්ලිව්එම්ඩබ්ලිව්
17(සේවා) ගැමුණු රෙජිමේන්තුව

## ජීවිතයට යමක්...

කථා කරන්න කලින් ඇහුම්කන් දෙන්න
ඉතිරි කරන්න කලින් හම්බ කරන්න
විශ්වාස කරන්න කලින් හිතන්න
නවතින්න කලින් උත්සහ කරන්න
ආදාර් කරන්න කරන්න කලින් අවංක වෙන්න
මැරෙන්න කලින් ජීවිතය විඳින්න
හැලෙද්දී ඔප වෙන්න
බිඳෙද්දී ශක්තිමත් වෙන්න
රිදෙද්දී උගුලන්න

සෙ/18ඩී00716
කෝප්‍රල් සම්පත් එම්ඩබ්ලිව්
14(සේවා) ශ්‍රීලපාහ

## පියාණෙනි...

මා පුංචි කල සුරතල් බැලූ ඔබ
සුළඟිල්ල අල්ලන් ඇවිද යන්න
දැන් මම ලොකුයි
ඔබ මගේ ලෝකයෙන් සමු අරන්
ගිය දිනේ පටන්
ලෝකයේ පියවරු දකින විට
හැගෙයි ඔබ මගේ
හද මඩලට මගේ හද ගැඹුරේ
නොනිවී දැල්වෙන පහන ඔබයි
පියාණනේ

සෙ/284532
කෝප්‍රල් ආරියරත්න එස්එන්ටීපීඑස්
6 ශ්‍රීලංසිංබ

## සිතුවිලි මනසා...

හිම්දිරි උදාසන
ගිනි දහවල අවසන් වූ
සවස් ඇඳිරි වැටී හෝරාවේ
මා හද හා
පොර බදනා හැඩුම් සිතුවිලි
නෙක නෙක වර්ණ රටා දමා
ගොතන්නට නිර්මාණ නිමැවුම්
නොමැත කාලය පෙරදින මෙන්
අවිවේකී ජීවන ගමනේ

සිතුවිලි හා පොර බදානම් පරාජිතව
සිතුවිලි බලවත්ව මා මනසට වඩා
සිතුවිලි සිතුවිල්ලක් වී
මා හද දවයි
ගිනි දහවල සේ

නි/70207
ලුතිනන් (උපා) ඩීපීඑස් චන්ද්‍රසිරි
6 ගරෙ

## විරං ජයතු...

ගුරු මව්නි පා වදිම් ඔබගේ
බැතියෙන් සිරස නමා
හද විල සුපිපෙන මල් දෝතට ගෙන
පලඳමි ගෙල අවිනා

ආදර ගුරු මව්නි
නිදුකින් ඉනු මැනවී
හෙට ලොව නගනට
අත හිත දෙන ඔබ
නිදුකින් ඉනු මැනවී

සිප් කිරි පොවලා ඇති දැඩි කෙරුවේ
ගුණ නැණ අපෙ වඩවා
නෑ කිසි වෙනසක් ඔබ ළඟ දැනුනේ
අම්මා වගෙයි සදා

විරං ජයතු වේවා
දිගු කල් වැජඹේවා
හෙට ලොව නගනට අත හිත දෙන ඔබ
දිගුකල් වැජඹේවා

සෙ/ඕ100628
සාසෙ කාරියවසම් එආර්
2 ශ්‍රීලංකාපාබුසේව

## අහිමි පිය සෙනෙහස...

මිය නොයන්නම්
ජීවිතය තව දුර නිසා
සතුට නොසොයන්නම්
එය මට නහනම් නිසා
නොහඬන්නම්_
හඬන්නට කඳුලල් නැති නිසා
විඳවන්නම්
විඳින්නට කිසිවක් නැති නිසා
අඳුරට පෙම් බඳින්නම්
අලෝකය යළි නොඑන නිසා
හිත හදාගන්නම් ඔබත් අහිමි නිසා
යළි ආදරය නොසොයන්නම්
කිසිවකු මට ආදරය නොකළ නිසා

සෙ/479181
සැරයන් නිශාන්ත පීආර්
16 ගරෙ (අභිමංසල 3)

## වෘත්තීය දිවියේ නේකවිධ කඩඉම් පසුකොට සුබ මොහොතින් නව තනතුරු ලැබූ ඔබ සියලු දෙනාට දිරිය, විරිය,රැකවරණය ලැබේවායි "රණවිරුවා" ද මෙසේ සුබ පැතුම් එක්කරයි.



අධ්‍යක්ෂ ජෙනරාල් පාබල හමුදා ශාඛාවේ අධ්‍යක්ෂ ජෙනරාල් පාබල හමුදා ලෙස

**මේජර් ජෙනරාල් ඒයි ළමාහේවා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

**2022 අගෝස්තු මස 04 වන දින සිට**



ඉදිරි නඩත්තු පෙදෙස (මධ්‍යම) ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩියු**

**2022 අගෝස්තු මස 23 වන දින සිට**



56 වන සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල් එච්පීපීඑම් කාරියවසම් ආර්එස්පී එන්ඩීසී පීඑස්සී අයිජී**

**2022 අගෝස්තු මස 30 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) බ්‍රිගේඩියර් ප්‍රමානි ලෙස

**බ්‍රිගේඩියර් කේඑන්ඩී කරුණාපාල ආර්එස්පී**

**2022 අගෝස්තු මස 18 වන දින සිට**



සටන් පුහුණු පාසලේ සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර් ආර්පී මුණිපුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

**2022 අගෝස්තු මස 22 වන දින සිට**



මාණ්ඩලික රාජකාරී අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර් පීආර් පතිරවිතාන පීඑස්සී**

**2022 අගෝස්තු මස 26 වන දින සිට**



වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර් ඒඑම්යේපීපීඑස්යේ අබේසිංහ**

**2022 අගෝස්තු මස 26 වන දින සිට**



1 වන බලකායේ බ්‍රිගේඩියර් (පාලන/ගතාස) ලෙස

**බ්‍රිගේඩියර් එස්එන් කිතුල්ගොඩ යුඑස්පී**

**2022 අගෝස්තු මස 03 වන දින සිට**



අභිමංසල I සුවසහන නිකේතනයේ සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර් ඩීඑම්යේ චක්‍රවර්තී ආර්එස්පී**

**2022 අගෝස්තු මස 03 වන දින සිට**



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක ලෙස

**බ්‍රිගේඩියර් ටීඑන් මෙන්ඩි ආර්එස්පී යුඑස්පී අයිඑස්සී**

**2022 අගෝස්තු මස 10 වන දින සිට**



582 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර් පීපීපී කුලතිලක**

**2022 අගෝස්තු මස 10 වන දින සිට**



කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලේ අධ්‍යක්ෂ පරිපාලන ලෙස

**බ්‍රිගේඩියර් එල්ඩබ්ලිව්එස්ආර් වෙත්තසිංහ**

**2022 අගෝස්තු මස 04 වන දින සිට**



සන්නද්ධ බුද්ධි බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස

**කර්නල්**

**ටීටීපී සිරවර්ධන ආර්එස්පී පීඑස්සී අයිඑස්සී**

**2022 අගෝස්තු මස 18 වන දින සිට**



561 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල්**

**ඩීඑස් ජයවර්ධන ආර්එස්පී**

**2022 අගෝස්තු මස 15 වන දින සිට**



57 වන පාබල සේනාංකයේ කර්නල් ප්‍රමාණි ලෙස

**කර්නල්**

**යූආර්ඒබී රණතුංග ආර්එස්පී යූඑස්පී**

**2022 ජූලි මස 28 වන දින සිට**



57 වන පාබල සේනාංකයේ කර්නල් (පාලන/හකාස) ලෙස

**කර්නල්**

**විජේඑම් ද සිල්වා ආර්එස්පී යූඑස්සී**

**2022 අගෝස්තු මස 09 වන දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) කර්නල් (පාලන/හකාස) ලෙස

**කර්නල්**

**එච්පීඑන් පරාක්‍රමවංශ ආර්එස්පී යූඑස්පී**

**2022 අගෝස්තු මස 06 වන දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) කර්නල් (පාලන/හකාස) ලෙස

**කර්නල්**

**පීටීසී මදුරාවල යූඑස්පී**

**2022 අගෝස්තු මස 08 වන දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) කර්නල් (සම්බන්ධීකරණ) ලෙස

**කර්නල්**

**එම්කේඑච්ඩී චන්ද්‍රමාල්**

**2022 අගෝස්තු මස 08 වන දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ප්‍රමාණි I ලෙස

**ලුතිනන් කර්නල්**

**ඒඒටී සෝමරත්න යූඑස්පී**

**2022 අගෝස්තු මස 08 වන දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) ප්‍රමාණි I (සම්) ලෙස

**ලුතිනන් කර්නල්**

**කේඒඑස්ඒකේ කුලසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එල්එල්එම්සී**

**2022 අගෝස්තු මස 08 වන දින සිට**



යුද්ධ හමුදා ආධුනික පුහුණු මධ්‍යස්ථානය - මේනානිගල සේනාවිධායක ලෙස

**ලුතිනන් කර්නල්**

**ඩබ්ලිව්එම්ඩීඑච්ආර්යේ වැලිකන්න ආර්ඩබ්ලිව්පී**

**2022 ජූනි මස 18 වන දින සිට**



10 (සේවා) ගැමුණු සේවා බළඇණියේ අණදෙන නිලධාරී ලෙස

**මේජර්**

**ඩබ්ලිව්පීජීඑස් බංඩාර**

**2022 ජූලි මස 22 වන දින සිට**



9 (සේවා) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස

**මේජර්**

**ජේකේඑම්ආර්යේ රණසිංහ**

**2022 අගෝස්තු මස 24 වන දින සිට**

අගෝස්තු 2022

# හිතන්න වෙනවනෙ...

අළුත් විදුලි උපකරණයක් නිවසට රැගෙන ආ මහාචාර්යවරයා විස්තර පත්‍රිකාව කියවමින් එය සවි කිරීමට උත්සාහ කළ මුත් නිසි පරිදි සවි කිරීමට සමත් වූයේ නැත. එහෙත් නිමේෂයක් ඇතුළත එය සවි කොට දැමීමට ඔහුගේ මෙහෙකරුවා සමත්විය.

"ඈ සිරිපාල... තමුසෙ කොහොමද මේ හපන්කම කළේ..." යි මහාචාර්යවරයා ඔහුගෙන් ප්‍රශ්න කළේය.

"ඇයි සර් මට කියන්න කරන්න බෑනෙ... ඉතින් කියන්න බැරි වුණාම හිතන්න වෙනවනෙ"



# අළුත් ගෙදර...

ගැබිණි මව, පියා සහ තම එකම පුතු සමග කතා කරමින් සිටියේ පවුලට අළුතින් එකතු වීමට යන සාමාජිකයා ගැනය. "මම හිතන්නෙ අපි මීට වඩා ලොකු වෙන ගේකට ගියොත් හොඳයි කියල" යි මව යෝජනා කළාය.

ඊට පිළිතුරු දුන්නේ මඳ වේලාවක් කල්පනාවේ නිමග්නව සිටි කුඩා පුතුය. "ඒක හරියන්නෙ නෑ. එයා අපේ පස්සෙන් ඒවි"





# විවාහ සංවත්සරය...

සිය 10 වන විවාහ සංවත්සරයේදී එක් සැමියෙක් තම බිරිඳට මෙසේ කීවේය.

"ඔයා වඩාත්ම කැමති මින්ස් කබායක් ගන්නද එහෙම නැත්නම් විනෝද සවාරියකට ස්වීඩනයට යන්නද?"

"අපි යමු ස්වීඩනයට. ස්වීඩනයෙ මින්ක් කබා බොහොම ලාබලු" යැයි බිරිඳ පිළිතුරු දුන්නාය.



# ගැලවීම...

**සුසන්ත** - මොකද බං උඹ ඔය ඇඹරි ඇඹරි ඉන්නෙ? මොකක්හරි ප්‍රශ්ණයක්ද?

**කමල්** - නෑ බං... මං අද උදේ ඔෆිස් එන්ඩ ෂර්ට් එකේ බොත්තං දානකොට එක බොත්තමක් කැඩුණ, බෑග් එක අතට ගන්නකොට බෑග් එකේ පටියක් කැඩුණා, දොර අරින්ඩ හදනකොට දොරේ ලොක් එක කැඩුණා, කාර් එකේ දොර අරිනකොට හැඩල් එක ගැලවිලා අතට ආව බං.

**සුසන්ත** - ඉතිං...

**කමල්** - ඉතිං බං... මං මේ මුත්‍රා කරන්ඩ බයේ ඉන්නේ.



# මරණය...

මධ්‍යසාර කම්හලේ සේවකයා විශාල බීර බැරලයකට වැටී ගිලී මියගියෙන් ඒ බව ඔහුගේ බිරිඳට දැන්වීම සඳහා එහි කළමණාකරුවා පිටත්විය. එම ශෝකී පුවත කන වැකීමත් සමග සේවකයාගේ බිරිඳ ඉකි ගසමින් හඬන්නට වූවාය.

"එයා ගොඩක් දුක් විඳලද මැරුණේ?" යැයි ඇය කළමණාකරුවාගෙන් අසා සිටියාය.

"එහෙමත් කියන්න බෑ... මොකද වැසිකිලි යන්න ඕන කමට එයා දෙපාරක්ම බැරල් එකෙන් එළියට ආව."

# ENGLISH VISION

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන නවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රචාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Badly needed

යම්කිසි කාර්යයක් කිරීමේදී **"එම කාර්ය කිරීමට දැඩි අවශ්‍යතාවයක් තිබුනායැයි"** යන අර්ථය හගවමින් යම් ක්‍රියාවක් කිරීමට තිබූ දැඩි වුවමනාව හෝ අපේක්ෂාව පිළිබඳව ප්‍රකාශයක් කිරීම සඳහා මෙම වාක්‍යය රචාව භාවිතා වේ.

***Fomular*** :- සූත්‍රය

**Subect + badly needed to+ Verb (Infinitive) + Object + Rest.**
සබ්ජෙක්ට්+බැඩ්ලි නීඩඩ් ටු+වර්බ්+ඔබ්ජෙක්ට්+රෙස්ට්
කතෘ+ දැඩි අවශ්‍යතාවයක් තිබුනා + ක්‍රියාව + කර්මය + ඉතිරිය

***Ex*** / උදා :-

1. I badly needed to learn English.
   අයි බැඩ්ලි නීඩඩ් ටු ලර්න් ඉන්ග්ලිෂ්.
   මට හොඳටම අවශ්‍ය වුනා ඉංග්‍රීසි ඉගෙන ගන්න.

2. He badly needed to speak with him.
   හි බැඩ්ලි නීඩඩ් ටු ස්පීක් විත් හිම්.
   ඔහුට හොඳටම අවශ්‍ය වුනා මාත් සමඟ කතා කරන්න.

3. We badly needed to follow a computer course.
   වී බැඩ්ලි නීඩඩ් ටු ෆලෝ අ  කම්පියුටර් කෝස්.
   අපට හොඳටම අවශ්‍ය වුනා පරිගනක පාඨමාලාවක් හදාරන්න.

4. She badly needed to protect her affair with her boyfriend.
   ෂී බැඩ්ලි නීඩඩ් ටු ප්‍රොටෙක්ට් හර් අෆෙයාර් විත් හර් බෝයි ෆෙරන්ඩ්.
   ඇයට හොඳටම අවශ්‍ය කළා ඇයගේ පෙම්වතා සමඟ සබන්ධතාවය ආරක්ෂා කරගන්න.

***Nota Bene*** / සැ.යු :-

ඉහත වාක්‍යයන්හි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැලකීමේදී,


- **Subject :-** කර්තෘ පදය මෙහිදී සම්බන්ධ කරයි.
- **Badly needed:- "එම කාර්ය කිරීමට දැඩි අවශ්‍යතාවයක් තිබුනායැයි"** ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම කණ්ඩය කිසිඳු වෙනසකින් තොරව වාක්‍යයේ භාවිතා වේ.
- **Verb :-** ක්‍රියා පදය වාක්‍යයේ භාවිතා කිරීමේදී (infinitive) ක්‍රියා මූල පදයක් ලෙස භාවිතා කළ යුතුයි.
- **Object :-** කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයකු හෝ පදයක් වේ නම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන බේදයකින් තොරව භාවිතා වේ.
- **Rest :-** ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හගවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

**Analysis of the sentence formation** - වාක්‍යය රචාවෙහි සැකැස්ම විශ්ලේශණය.

**Subect + badly needed to + Verb (Infinitive) + Object + Rest.**
සබ්ජෙක්ට්+ බැඩ්ලි නීඩඩ් ටු+වර්බ්+ඔබ්ජෙක්ට්+රෙස්ට්.
කතෘ +දැඩි අවශ්‍යතාවයක් තිබුනා+ ක්‍රියාව + කර්මය + ඉතිරිය.

**He badly needed to have a punishment.**
හී බැඩ්ලි නීඩ්ලි ටු හැව් අ පනිස්මන්ට්.
ඔහුට හොඳටම අවශ්‍ය කරනවා දඬුවමක් ලැබීමට.

***"English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමග එක්වන්න. තවද, ඔබට මගහැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



**මේජර් චමින්ද ලියනගේ**
**ශ්‍රීලංකාපොදුසේබ**
**ජනමාධ්‍ය අධි - ලුකමු**
*www.englishvision.lk*

# විඩාබර මුහුණුවල සිනාපිරි සැහැල්ලුව...

ක්‍රියාන්විතයක ඇරඹුම දුෂ්කරයි. අනපේක්ෂිත තත්වයන් පිළිබඳ වන දෙගිඩියාව, අවධානම මෙහෙයුමක් පුරාවට තියෙනවා.
ඒත් අවසානයේ ඒ සියලු දුෂ්කරතා, අභියෝග අතික්‍රමණය කර ඉලක්ක ජය අරන් ආපහු එනකොට දැනෙන සතුට විස්තර කරන්න බැරි තරම්. ඒ සැහැල්ලුව අත්වින්දෙ රණබිමේ පය ගහපු අය විතරමයි.






# රණවිරුවා






**අධ්‍යක්ෂණය**

බ්‍රිගේඩියර්
ඩබ්ලිව් එම්එම් ආර්එස්පී අබේවික්‍රම



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ආර්එම්එච්එම්පීකේ රත්නායක



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද වික්‍රමසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්ඩබ්ලිව් ලක්මිකා

**පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බඹ II සේනාරත්න ජීසී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජ්ජ්එම් 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්පිලිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුධ දිගුව**

51445/51446

"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය

# රණවිරුවන් වෙනුවෙන් නව නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය අඛණ්ඩව ඉදිරියට




යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් පරිදි ජීව දානය හා කාය දානය ලබාදුන් රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින්, සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් සහ සිවිල් වැසියන්ගේ පවුල් සඳහා නව නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතීන් යුද්ධ හමුදාව විසින් අඛණ්ඩව සිදුකරනු ලබයි.

එලෙස ක්‍රියාත්මක නිවාස ව්‍යාපෘතිය තවදුරටත් පුළුල් කරමින් උතුරුමැද පළාතේ ඉදිකළ නව නිවාස දෙකක් පසුගිය අගෝස්තු 20 වන දින එම නිවැසියන් වෙත භාරදෙන ලදී. ඒ අනුව එහි එක් නිවසක් කැබිතිගොල්ලෑව, කණුගහවැව ප්‍රදේශයේ ඉදිකෙරුණු අතර, එය මියගිය සාමාන්‍ය සෙබළ ශාන්ත ඩීඑස් රණවිරුවාගේ පවුලේ සාමාජිකයන් වෙනුවෙන් පිරිනමන ලදී.



යුද්ධ හමුදා හටපිරිස්වල ඉංජිනේරු, තාක්‍ෂණික සහ ශ්‍රමදායකත්ව ඇතිව ඉදිකළ මෙම නව නිවස සඳහා සපුගස්කන්ද ආරක්‍ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ නියෝජ්‍ය සේනාවිධායකගේ සම්බන්ධීකරණයෙන් නුගේගොඩ ප්‍රදේශයේ පරිත්‍යාගශීලියකු වන අජන්ත වාස් ගුණසේකර මහතා විසින් රුපියල් මිලියන 1.1 ක මූල්‍ය අනුග්‍රහයක් ලබාදෙන ලදී.



එම නව නිවස විවෘත කිරීමේ උත්සවය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සමගින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූහ. තවද, ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ සපුගස්කන්ද ආරක්‍ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් පීඑම් පීරිස් ආර්එස්පී යූඑස්පී පීඑස්සී ද එම අවස්ථාවට සහභාගී වූහ.

එසේම, තන්තිරිමලේ දෙමටමල්ගම ප්‍රදේශයේ පදිංචි විවිධ දුෂ්කරතා මධ්‍යයේ දිවිගෙවන පවුලක් සඳහා පිරිනැමුනු නිවස විවෘත කිරීමේ අවස්ථාවට ද ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති සහභාගී විය. මෙම නිවසේ ඉදිකිරීම් කටයුතු සඳහා 5 ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවේ අණදෙන නිලධාරී ගේ අධීක්‍ෂණය යටතේ එම ඒකකයේ හටපිරිස් දායක වූහ. සපුගස්කන්ද ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ නියෝජ්‍ය සේනාවිධායක ගේ සම්බන්ධීකරණයෙන් මෙම නිවස සඳහාද පරිත්‍යාගශීලී අජන්ත වාස් ගුණසේකර මහතා රුපියල් මිලියන 1.1 ක මූල්‍ය පරිත්‍යාගයක් සිදුකිරීම විශේෂත්වයකි. එහිදී, සේවා වනිතා ඒකකයේ සභාපතිනිය විසින් ඉහත නිවාස හිමිවූ ප්‍රතිලාභී පවුල් සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පිරිනැමීමටද කටයුතු කළාය.

# මේ ගුරු පාරේ...



රණබිමේ මතක

යුද්දෙ කාලෙ මේ ගුරු පාරවල් අද්දර මොනතරම් දෙවල් සැඟවිලා තිබුණද. ඒවා දන්නෙ රණවිරුවෝ විතරමයි. ඔවුන්ගෙ පයට නොපෑගුණු එක වැලිකැටයක්වත් ඒ පාරවල්වල තිබුණෙ නැහැ. ඒ තරමටම කකුල් ගෙවෙනකල් ඔවුන් ඒවායෙ ඇවිද්දා. ඒ වෙන දේකට නෙවෙයි, මේ රට නිදහස් කරගන්නමයි. ඔවුන් තබපු හැම පියවරකම තිබුණෙ අසීමිත වටිනාකමක්.

යුද භූමියෙ එදා තිබුණු සමහර පාරවල් අද නැහැ. තවත් ඒවා අළුත්වෙලා, වෙනස්වෙලා. ඒ හින්දම රණවිරුවන් ඒවායෙ තියපු පියවර මැකිල ගිහින්. ඒ වුනත් අමතක කරන්න එපා. ඔවුන් මේ රටේ සාමය අගයපු මිනිසුන්ගෙ හදවත්වල තිබ්බ සළකුණු කවදාවත් මැකෙන්නෙ නැහැ. මකන්නත් බැහැ.



